වාර්ෂික වාර්තාව

2020



ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

අන්තර්ගතය

01 අප ගැන
දැක්ම
මෙහෙවර
ප්‍රතිපත්ති අධ්‍යයන
ආයතනයේ පාලක
මණ්ඩලය 2020

02 විශේෂ අවස්ථා
2020

04 සභාපතිතුමාගේ
පණිවුඩය

05 විධායක
අධ්‍යක්ෂතුමියගේ
වාර්තාව

08 පර්යේෂණ

09 සාර්ව ආර්ථිකය,
වෙළඳාම සහ
තරගකාරීත්වය

16 ශ්‍රමය,
අධ්‍යාපනය සහ
සෞඛ්‍යය

22 සංක්‍රමණය සහ
නාගරීකරණය

26 දරිද්‍රතාවය සහ සමාජ
සුභසාධනය

28 කෘෂිකර්මාන්තය
සහ කෘෂිව්‍යාපාර
සංවර්ධනය

30 පරිසරය,
ස්වාභාවික සම්පත්
සහ දේශගුණික
විපර්යාස

32 පර්යේෂණ
කණ්ඩායම්
නායකයින්

33 පර්යේෂණ
කාර්ය මණ්ඩලය

34 සහාය කාර්ය
මණ්ඩලය

35 මූල්‍ය හා
පරිපාලනය

35 සංනිවේදන සහ
ප්‍රචාරණය

36 පුස්තකාලය

36 තොරතුරු
පද්ධති

37 ප්‍රකාශන - 2020

38 අභ්‍යන්තර
සම්මන්ත්‍රණ

35 ප්‍රතිපත්ති අධ්‍යයන
ආයතනයේ
සීමාවාසික පුහුණු
වැඩසටහන 2020

36 මූල්‍ය ප්‍රකාශන

අප ගැන

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය යනු පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපනය කර ඇති, ශ්‍රී ලංකාවේ තිබෙන ඉහළම ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය වේ. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහ සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රබල සාක්ෂි සපයා දීම පිණිස ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු, ස්වාධීන, ප්‍රතිපත්ති සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම අපගේ මෙහෙවර වේ.

වසර විසි පහකට (25) අධික කාලයක් පුරා ස්වකීය ආයතනය විසින් සිදු කරන ලද විශිෂ්ඨ, ස්වාධීන පර්යේෂණ රාශිය නිසා ප්‍රතිපත්ති අධ්‍යයන අයතනය ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ ක්ෂේත්‍රයෙහි විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් ලෙස පිළිගැණීමට ලක්වී තිබේ. මෙම ආයතනයෙහි පර්යේෂණ වැඩසටහන මගින් ශ්‍රී ලංකාවේ සහ ආසියානු කලාපයේ වර්තමාන සමාජ-ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ ඉතා වැදගත් ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කෙරෙයි. වාර්තා, පර්යේෂණ පත්‍රිකා, සඟරා ලිපි සහ ප්‍රසිද්ධ ඉදිරිපත් කිරීම් හරහා පුළුල්ව ප්‍රචාරණය කරනු ලබන ආනුභවික-පාදක පර්යේෂණ මගින් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයට සහාය දීමේ ස්වකීය ජයග්‍රාහී වාර්තාව බිහි කිරීමට මූලික වූයේ මෙම ආයතනයේ ප්‍රබල අභ්‍යන්තර පර්යේෂණ කණ්ඩායමෙහි පරිපූර්ණ නිපුණත්වය යි.

දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික පරිණාමය සඳහා උත්ප්‍රේරකයක් වන, ගෝලීය වශයෙන් පිළිගත් පර්යේෂණ ආයතනයක් බවට පත්වීම.

මෙහෙවර

සමාජ-ආර්ථික ගැටළු පිළිබඳ විශ්වාසනීය, තියුණු දැක්මක් සපයා දෙන, ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු, ස්වාධීන, ප්‍රතිපත්ති සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම මගින් අපගේ පාර්ශවකරුවන්ව දැනුවත් කිරීම සහ ප්‍රතිපත්ති න්‍යාය පත්‍ර හැඩගැස්වීම සහ එමගින් සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කිරීම.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලය 2020

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න - (සභාපති)

දේශමාන්‍ය මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් - (නිල බලයෙන්)

ආචාර්ය එම්.කේ.සී. සේනානායක - (නිල බලයෙන්)

ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි මහතා - (නිල බලයෙන්)

මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද - (පත් කළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

මහාචාර්ය පී.එම්.සී. තිලකරත්න - (පත් කළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

ආචාර්ය කෙනත් ද සිල්වා - (පත් කළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

දුෂ්නි වීරකෝන්
විධායක අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

විශේෂ අවස්ථා 2020

ජනවාරි



විධායක අධ්‍යක්ෂ දුෂ්නි වීරකෝන් මහත්මිය ජනවාරි 30 වැනි දින **"ණය සහ වර්ධනය පිළිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති උභතෝකෝටිකය: ඉහළ මැදි ආදායම් ආර්ථිකයකට ඇති අභියෝග"** යන මාතෘකාව යටතේ පස්වැනි ගාමිණී කොරෙයා අනුස්මරණ දේශනය පැවැත්වූවාය.

පෙබරවාරි



පෙබරවාරි 22 වැනි දින ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ විෂයාන්තර පර්යේෂණ සඳහා වන ලන්ඩන් මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද 'සංක්‍රමණික ලෝකය: සංක්‍රමණය හා සංකලනය සඳහා විෂයාන්තර ප්‍රවේශයන්' යන තේමාව යටතේ පැවති සම්මන්ත්‍රණයකදී පර්යේෂණ සාමාජික බිලේෂා වීරරත්න මහත්මිය **"සංචලනයට ඇති අයිතිය: සංක්‍රමණිකයන්ට බඳවා ගැනීමේ අතරමැදියන්ගේ බලයට යටත්වීමට සිදුවී තිබේද?"** යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළාය.

මාර්තු



මාර්තු මස 3 වැනි දින අධ්‍යාපන ප්‍රතිපත්ති සංසදය විසින් සංවිධානය කරනු ලැබ, පර්යේෂණ ආර්ථික විද්‍යාඥ අශානි අබයසේකර මහත්මිය **"ශ්‍රී ලංකාවේ පස්වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය: එය කෙතරම් ඵලදායීද හා අදාළ වන්නේද?"** යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළාය.

අප්‍රේල්



පර්යේෂණ අධ්‍යක්ෂ නිශා අරුණාතිලක මහත්මිය අප්‍රේල් 23 වැනි දින එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සංවිධානය කරන ලද **"COVID-19 වසංගතයෙහි සමාජ-ආර්ථික බලපෑම් සහ එයට දක්වන ප්‍රතිචාර: තිරසාර සමාජ-ආර්ථික ප්‍රතිසාධනයක් සඳහා 'නව සාමාන්‍ය' ජීවන ක්‍රමය හසුරවා ගැනීම"** පිළිබඳ අතථ්‍ය වටමේස සාකච්ඡා මණ්ඩලයක සාමාජිකාවක ලෙස කටයුතු කළාය.

මැයි



පර්යේෂණ ආර්ථික විද්‍යාඥ කිත්මිණි හේවගේ මහතා මැයි මස 7 වැනි දින එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ දකුණු-දකුණු සහයෝගිතාවය සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය විසින් සංවිධානය කරන ලදී සංවර්ධනය වෙමින් පවතින රටවල් කෙරෙහි කඩඇෂෘ-19 වසංගතයෙහි ඇති සමාජ-ආර්ථික ගම්‍යමානයන් යන මාතෘකාව යටතේ පැවති වෙබ් සම්මන්ත්‍රණයෙහි සාකච්ඡා මණ්ඩල සාමාජිකයෙක් ලෙස කටයුතු කළේය.

ජූනි



පසුගිය දශකය තුළ ළමා මන්දපෝෂණය එතරම් වැඩි දියුණු නොවීමට හේතු සහ ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණය අවම කිරීම සඳහා ආමන්ත්‍රණය කළ යුතු ප්‍රතිපත්ති අඩුපාඩු පිළිබඳව විමසා බැලෙන, **"ශ්‍රී ලංකාවේ මන්දපෝෂණය තුරන් කිරීම සඳහා ප්‍රගාමී මාවතක්"** යන මාතෘකාව යටතේ පර්යේෂණ ආර්ථික විද්‍යාඥ ප්‍රියංකා ජයවර්ධන මහත්මිය විසින් රචිත පර්යේෂණ ප්‍රකාශනයක් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් එළිදැක්වූයේය.

ජූලි



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 'සමන් කැලේගම අනුස්මරණ පර්යේෂණ ප්‍රදානය - 2020' සඳහා අපේක්ෂකයින් තිදෙනෙකු කෙටි ලැයිස්තුගත කළේය. සමාජ-ආර්ථික ගැටළු පිළිබඳ ආචාර්ය කැලේගම මහතා දායාද කර ඇති ස්වාධීන පර්යේෂණ උරුමයට ගරු කිරීම 2018 වර්ෂයේදී ස්ථාපනය කරන ලද මෙම ප්‍රදානයෙහි අරමුණ වේ.

අගෝස්තු



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රැකියා සහ රාත්‍රී සේවා මුර පිළිබඳ ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අත්දැකීම් විමසා බලමින් නිශා අරුණාතිලක, අශානි අබයසේකර, චතුර්ගා කරුණානායක සහ දුලිනි ප්‍රනාන්දු විසින් සිදු කරන ලද අධ්‍යයනය සම්පූර්ණ කර රචනා කරන ලද **"හෙද නිවාසවල සහ සුපිරි වෙළඳසැල්වල කාන්තාවන්, රැකියා සහ රාත්‍රී සේවා මුර"** නැමති ප්‍රකාශනය නිකුත් කළේය.

සැප්තැම්බර්



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ පරිසර අමාත්‍යාංශය එක්ව සැප්තැම්බර් 24 වැනි දින කොළඹ දී සංවිධානය කරන ලද **"ශ්‍රී ලංකා කාබන් රෙජිස්ට්‍රි** (SLCR) **සහ ශ්‍රී ලංකා කාබන් සම්මාන වැඩසටහන** (SLCCS), **මැනීම, වාර්තා කිරීම සහ සත්‍යාපනය සඳහා වන ප්‍රශස්ත ප්‍රතිපත්ති පැකේජයක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන සමස්ත ප්‍රතිපත්ති ගැළපීම සහ නිර්දේශ ඇගයීම"** පිළිබඳ ප්‍රතිපත්ති ඇගයීමේ වැඩමුළුවක් සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සත්කාරකත්වය සපයන ලදී.

ඔක්තෝබර්



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ඔක්තෝම්බර් මස 15 වැනි දින **"ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020: වසංගතය හා අවහිර** - COVID-19 **සහ ඉන් ඔබ්බට ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුනර්ජීවනය"** යන මාතෘකාව යටතේ වෙබ් සම්මන්ත්‍රණ සාකච්ඡාවක් පැවැත්වූයේය.

නොවැම්බර්



නොවැම්බර් 18 වැනි දින යුනිසෙෆ් සංවිධානය විසින් සංවිධානය කරන ලද 'ශ්‍රී ලංකාවේ අන්තර්කණාය වූ සමාජ ආරක්ෂණය පිළිබඳ ඉහළ මට්ටමේ සම්මන්ත්‍රණ මාලාව: සුසමාදර්ශය වෙනස් කිරීම' නැමති වැඩසටහනෙහිදී පර්යේෂණ සාමාජික ගංගා තිලකරත්න මහත්මිය "COVID-19 **සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිචාරය"** යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළාය.

දෙසැම්බර්



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය දෙසැම්බර් 3 වැනි දින ශ්‍රී ලංකා රජය වෙනුවෙන් 'වසංගත සමයෙහි දී ඔරොත්තු දෙන සහ තිරසාර ආහාර පද්ධති ගොඩනැගීම' යන මාතෘකාව යටතේ අතථ්‍ය සංවාදයක් සංවිධානය කළේය. මෙම සංවාදයට කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD)" එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සහ එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන (WFP) විසින් සහයෝගය ලබා දෙන ලදී.

සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS) දකුණු ආසියාවේ ඇති ස්වාධීන, උසස් තත්ත්වයේ ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයක් ලෙස පුළුල් ලෙස පිළිගැණීමට ලක්වී ඇති ආයතනයකි. නූතන සමාජවල සමාජ-ආර්ථික පරිවර්තනය සාක්ෂාත් කර ගැනීම සඳහා පර්යේෂණ මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය, විශ්ලේෂණය, තක්සේරු කිරීම සහ ඇගයීම මෙන්ම ප්‍රතිපත්ති ප්‍රතිසම්පාදනය කිරීම ද අත්‍යාවශ්‍ය වන බැවින්, මෙම කාලපරිච්ඡේදය පුරාම ස්වකීය අපේක්ෂිත කෙටිකාලීන හා දිගු කාලීන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය කැපවී සිටියේය.



එච්. ඩී. කරුණාරත්න
සභාපති

COVID-19 වසංගතය හේතුවෙන් පෙර නොවූ විරූ ලෙස ඇතිවූ ගෝලීය සෞඛ්‍ය අර්බුදය හමුවේ පවා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2020 වර්ෂය මුළුල්ලෙහි ම ශ්‍රී ලංකාවේ වගකිවයුතු, ස්වාධීන හා ප්‍රමුඛතම ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයක් ලෙස අඛණ්ඩව කටයුතු කළේය. ධාරිතා උපයෝජනය කිරීම, තාක්ෂණයට අනුවර්තනයවීම, නව්‍යකරණය සහ ස්වකීය මානව ප්‍රාග්ධනය සතු විවිධ කුසලතා ප්‍රයෝජනයට ගැනීම තුළින් එවැනි අර්බුදයකට මුහුණ දීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සතුව ඇති හැකියාව ආයතනය විසින් සනාථ කර තිබේ. වසංගත තත්වය හේතුවෙන් මුළු මහත් ලෝකය පුරා ම අථත්‍ය ප්‍රාග්ධනය සහ සමාජ මාධ්‍ය හරහා සන්නිවේදනය විශාල වශයෙන් ඉහළ ගොස් තිබේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ද මෙම සංසිද්ධියට ව්‍යාතිරේකයක් නොවීය. ප්‍රදේශ අගුලු දැමීම්, සමාජ දුරස්ථභාවය අනිවාර්ය කිරීම සහ වසංගතය ව්‍යාප්ත වීම වැනි තත්වයන් යටතේ වුවද ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය කාර්යක්ෂම ලෙස තම සමාජ මාධ්‍ය පවත්වා ගෙන ගියේය. අපේක්ෂිත ප්‍රතිඵල අත් කර ගැනීම පිණිස අතථ්‍ය සම්පත් සහ සමාජ මාධ්‍ය යොදා ගැනීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ක්‍රියාශීලී හා කැපවූ කාර්ය මණ්ඩලය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළහ. 2020 වර්ෂයේ දී ආයතනයේ සභාපතිවරයා ලෙස කටයුතු කරමින් මෙම ජයග්‍රහණය දැක ගැනීමට ලැබීම මා හට ඉමහත් සතුටක් ගෙන දෙන අතර ඔවුන්ට සහයෝගය ලබා දීමට හැකි වීම මා ලද භාග්‍යයක් විය.

ප්‍රතිපත්ති පර්යේෂණවල අකාලික බව සනාථ කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය "වසංගතය හා අවහිර - COVID-19 සහ ඉන් ඔබ්බට ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුනර්ජීවනය" යන කාලීන තේමාව යටතේ 29 වැනි වරටත් ස්වකීය ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020" ඔක්තෝම්බර් මාසයේ දී එළිදැක්වීමට සමත් විය. මෙම වාර්තාව තුළින් පිළිබිඹු වන විශ්ලේෂණයෙහි අදාළත්වය, උප තේමාවන්හි පුළුල් පරාසය, ශාස්ත්‍රීය අන්තර්ගතයෙහි දැඩිභාවය සහ ඉදිරිපත් කිරීමෙහි ඇති වෘත්තීයමයභාවය යන කරුණු ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පරිවර්තනය සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි දායකත්වය අතිශය වැදගත් වන්නේ කෙසේද යන්න පෙන්නුම් කරයි.

මෙවැනි ගෝලීය අර්බුදයක් මධ්‍යයෙහි ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය විසින් සපයා දෙන ලද විශිෂ්ඨ නායකත්වය ආයතනයෙහි පාර්ශ්වකරුවන් විසින් ඇගයීමට ලක් කළ යුතු වේ. 2020 වර්ෂය තවත් සාර්ථක වර්ෂයක් ලෙස සම්පූර්ණ කිරීම පිළිබඳව මම වීරකෝන් මහත්මියට සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි කැපවූ කාර්ය මණ්ඩලයට සුබ පතමි. මෙම ගෝලීය සෞඛ්‍ය අර්බුදයට මුහුණ දීම මගින් සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම මගින් එයට හැඩගැසීමෙන් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාවට සහ ලෝකයට සේවය සපයන විශිෂ්ට ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයක් බවට පත්වීමේ ස්වකීය ඉලක්කය සපුරා ඇති බව මට ඒත්තු ගැන්වී තිබේ.

විධායක අධ්‍යක්ෂක තුමියගේ වාර්තාව



දුෂ්නි වීරකෝන්
විධායක අධ්‍යක්ෂක

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ සංවිධානය ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි කීර්තිනාමය ගොඩනැගී ඇත්තේ අපගේ කාලෝචිත සාක්ෂි පදනම් කරගත් පර්යේෂණ නිමැවුම් වල සම්පූර්ණත්වය මත ය. පෙර නොවූ විරූ ලෙස කොරෝනා වයිරස් (COVID-19) සෞඛ්‍ය වසංගතය ලොව පුරා පැතිර තිබූ තත්වය නිසා ජාතික ප්‍රමුඛතාවයෙහි තීරණාත්මක ප්‍රතිපත්ති වර්ධනයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා ආයතනය සතු හැකියාව 2020 වර්ෂයේ දී පරීක්ෂාවට ලක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි සැලසුම් කර තිබූ පර්යේෂණ කටයුතු ද සැලකිය යුතු වෙනස්කම් වලට භාජනය වූ නමුත් ක්‍රියාත්මක කරමින් පැවති කාර්යයන් අවම බාධාවකින් යුතුව අඛණ්ඩව සිදු කරන බවට ආයතනය විසින් සහතික කරන ලද අතර, ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික වාතාවරණය කෙරෙහි COVID-19 වසංගතය හේතුවෙන් ඇති වී තිබෙන බලපෑම් පිළිබඳව ද නව පර්යේෂණ ආරම්භ කරන ලදී.

2020 අප්‍රේල් මාසයේ දී, ශ්‍රී ලංකාවේ විදේශීය සංක්‍රමණික සේවක ප්‍රජාවට ඇතිවී තිබෙන බලපෑම ඇගයීම සඳහා පවත්වන ලද කඩිනම් මාර්ගගත සමීක්ෂණයකින් ආරම්භ කර, අනෙකුත් කරුණු අතර සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ආදායම් හා ජීවනෝපායන් කෙරෙහි මෙම සෞඛ්‍ය වසංගතය මගින් ඇති කර තිබෙන බාධාකාරී බලපෑම් සහ ආහාර අනාරක්ෂිතභාවය හා ප්‍රමාණවත් නොවූ සමාජ ආරක්ෂණය මගින් ඇති කර තිබෙන සමාජ-ආර්ථික පීඩාකාරී තත්වය පොදු අවකාශයෙහි තැබීම ආරම්භ කළේය. පර්යේෂණ මගින් සොයා ගත් කරුණු උපයෝගී කර ගනිමින්, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි සංනිවේදන ක්‍රියාකාරකම්වල අත්‍යාවශ්‍ය අංගයක් ලෙස අපගේ පර්යේෂණ කණ්ඩායම COVID-19 වසංගතයෙහි බලපෑම් පිළිබඳ බ්ලොග් ලිපි මාලාවක් සම්පාදනය කිරීම, ජාතික හා අන්තර්ජාතික සාකච්ඡා මණ්ඩලවල නියැලීම් මෙන්ම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය සමග සක්‍රීය ලෙස නියැළීම් කාර්යක්ෂම ලෙස සිදු කරන ලදී. විවිධ අධ්‍යයන හා සම්බන්ධ සොයා ගැනීම් සහ ප්‍රතිපත්ති නිර්දේශ "වසංගතය හා අවහිර - COVID-19 සහ ඉන් ඔබ්බට ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුනර්ජීවනය" යන තේමාව යටතේ ආයතනයෙහි ප්‍රමුඛතම වාර්තාව වන "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020" නැමති වාර්තාව මගින් ඉදිරිපත් කරන ලදී.

(i) සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරගකාරීත්වය; (ii) ශ්‍රමය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය; (iii) සංක්‍රමණය සහ නාගරීකරණය; (iv) දරිද්‍රතාවය සහ සමාජ සුභසාධනය; (v) කෘෂි කර්මාන්තය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය; සහ (6) පරිසරය, ස්වාභාවික සම්පත් සහ දේශගුණික විපර්යාස යන තේමාත්මක ක්ෂේත්‍ර හය ඔස්සේ සැලසුම් කර ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ක්‍රියාත්මක කරමින් පැවති හරවත් පර්යේෂණ සමූහය අවම බාධාවන් සහිතව අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරගකාරීත්වය යන ක්ෂේත්‍රය සැලකූ විට, ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ක්‍රියාකාරීත්වය සහ දෘක්ම, ඉදිකිරීම් හා 'නිර්මාණාත්මක කර්මාන්ත' වැනි නැගී එන අංශවලට අදාළ නියාමන ගැටලු සහ ප්‍රමාණවත් බුද්ධිමය දේපළ අයිතිවාසිකම්වල අවශ්‍යතාවය ආදිය පිළිබඳ පර්යේෂණ 2020 වර්ෂයේ න්‍යාය පත්‍රයෙහි ප්‍රමුඛත්වය ගත්තේය. රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය සමග ද නියැළීම මගින් අපගේ පර්යේෂකයින් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට වැදගත් යෙදවුම් සපයා දුන්හ. විශේෂයෙන් ම, ප්‍රතිපත්ති

අධ්‍යයන ආයතනය 2021 අයවැය යෝජනාවලට පාදක වූ උපකල්පන ඇගයීමට සහ එහි ප්‍රතිපාදන 'සෞභාග්‍යයේ දැක්ම' ජාතික ප්‍රතිපත්ති රාමුව සමග පුළුල් ලෙස අනුකූල වී ඇත්දැයි විශ්ලේෂණය කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට සහාය විය.

සංක්‍රමණ සහ නාගරීකරණය යන තේමාව යටතේ, ප්‍රේෂණ රටා සහ ශ්‍රී ලංකාවේ දී දැරීමට සිදු වන පිරිවැය පිළිබඳව මෙන් ම බඳවා ගැනීමේ නියෝජිතයින් විසින් දරනු ලබන බඳවා ගැනීම් හා එයට අදාළ මෙහෙයුම් පිරිවැය පිළිබඳව ද විමර්ශනය කෙරෙන පර්යේෂණ සැලකිය යුතු සංඛ්‍යාවක් සිදු කරන ලදී. රටෙහි සමස්ත සමාජ-ආර්ථික ප්‍රතිඵල වැඩිදියුණු කිරීමේ ප්‍රධාන ක්‍රමයක් ලෙස අන්තර්ජාතිකව සංචරණය වීමට උපකාර කිරීම පිණිස සංක්‍රමණික සේවිකාවන් මුහුණ දෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ බාධක හා එයට අදාළ ප්‍රතිපත්ති නිර්දේශ පිළිබඳව මෙම විශ්ලේෂණය මගින් විශේෂ අවධානයක් යොමු කරන ලදී. මෙම කාර්යයෙහි විශාල කොටසක් COVID-19 වසංගතයෙන් ඉනික්බිතිව ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට සහ විශේෂයෙන් ම සංක්‍රමණික සේවකයින් සඳහා සමාජ ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට උපකාරී වීම පිණිස යොදවන ලදී.

ශ්‍රමය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය ප්‍රතිපත්ති පර්යේෂණ ක්ෂේත්‍රය සැලකීමේදී, රට තුළ දුම්කොළ ආශ්‍රිතව සිදු වන හානිය අවම කිරීම සඳහා වන ප්‍රතිපත්තිවලට සහාය දැක්වීම පිණිස ආනුභවික සාක්ෂි සැපයීම අරමුණු කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය එහි දුම්කොළ භාවිතය පාලනය කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් ජාත්‍යන්තර සහයෝගිතා හවුල්කරුවන් සමග අඛණ්ඩව කටයුතු කළේය. ශ්‍රී ලංකාව බෝනොවන රෝග පැතිරීම සීඝ්‍රයෙන් ඉහළ යාමේ ගැටළුවට මුහුණ දෙමින් සිටින නිසා සෞඛ්‍යයට අහිතකර ආහාර පුරුදු අවම කිරීම සඳහා මෑතකදී හඳුන්වා දෙන ලද මූල්‍ය හා නියාමන මැදිහත්වීම් තුනක ඵලදායීතාවය පරීක්ෂා කිරීම සඳහා තවත් අධ්‍යයන මාලාවක් සිදු කරන ලද අතර. මේ සමග ම, අපගේ පර්යේෂකයින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම සඳහා යෙදවුම් ද ඇතුළුව විවිධ ප්‍රතිපත්ති කමිටුවල ක්‍රියාකාරීව නියැළීම තුළින් කුසලතා සහ අධ්‍යාපනය ක්ෂේත්‍රයේ සෘජු ප්‍රතිපත්ති යෙදවුම් ලබා දීමට අඛණ්ඩව කටයුතු කර ඇත.

දරිද්‍රතාවය සහ අවදානම්සහගත භාවය යන ආයතනයේ තේමාත්මක ක්ෂේත්‍රය යටතේ, ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා උපකාරී වීම පිණිස චීනයේ එක් තීරයක් එක් මාවතක් වැඩසටහන් ව්‍යාපෘති සැලසුම් කිරීම පිණිස ජාතික ප්‍රතිපත්ති ධාරිතාවය ශක්තිමත් කිරීමේ ක්‍රම හඳුනා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුව සමග ඇති හවුල්කාරිත්වයක් දීර්ඝ කර ගන්නා ලදී. අනෙකුත් ක්ෂේත්‍ර සලකා බැලීමේදී, COVID-19 වසංගතය වැනි කම්පනය ඇතිකරවන තත්වයන්ට ඔරොත්තු දිය හැකි සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග සහ පද්ධති හඳුනා ගැනීමේ හදිසි අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් COVID-19 වසංගතය හමුවේ ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීමේ පර්යේෂණ අධ්‍යයනයන් ප්‍රමුඛස්ථානය ගත්තේය.

කෘෂිකර්මාන්තය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය යන තේමාත්මක ක්ෂේත්‍රය යටතේ ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් වූ අදාළ පර්යේෂණ වලදී ඔරොත්තු දෙන ආහාර පද්ධති ගොඩනැගීමට උපකාරී වන පර්යේෂණ මගින් COVID-19 වසංගතය අතරතුරදී අනෙකුත් මධ්‍යම ආදායම් ලබන රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත හා ආහාර පද්ධතිය කොතරම් ප්‍රබලද යන්න පරීක්ෂා කිරීමට අපේක්ෂා කරන ලදී. එමෙන්ම, මෙම ප්‍රතිපත්ති නිර්දේශ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමග එක්ව සිදුකරනු ලබන, ශ්‍රී ලංකාවේ සමස්ත කෘෂිකාර්මික ප්‍රතිපත්ති සන්දර්භය විමර්ශනය කෙරෙන අධ්‍යයනයකට සපයා දීමට අපේක්ෂා කෙරේ.

පරිසරය, ස්වාභාවික සම්පත් සහ දේශගුණික විපර්යාස යන තේමාත්මක ක්ෂේත්‍රය තුළදී අපගේ පර්යේෂණ මගින් ඉතාමත් මෑතකදී අලුත් වූ ප්‍රතිපත්ති

අවධානයක් යොමු වූ ගැටළුවක් වන මෙරට අලි-මිනිස් ගැටුම සඳහා රක්ෂණය පදනම් කරගත් විකල්ප විසඳුම් සොයා බැලීම කෙරෙහි අපගේ පර්යේෂණවල අවධානය අඛණ්ඩව යොමු කරන ලදී. එයට ඌනපූරණය කරමින් පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය සමග එක්ව එක්ව සිදු කරනු ලබන දේශගුණික විපර්යාස අවම කිරීම පිළිබඳ අනෙකුත් පර්යේෂණ ක්‍රියාකාරකම් මගින් ශ්‍රී ලංකා කාබන් රෙජිස්ට්‍රි සහ ශ්‍රී ලංකා කාබන් සම්මාන වැඩසටහන මැනීම, වාර්තාකිරීම සහ සත්‍යාපනය කිරීම සඳහා ප්‍රශස්ත ප්‍රතිපත්ති පැකේජයක් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වන සමස්ත ප්‍රතිපත්ති ගැළපීම සහ නිර්දේශ ඇගයීමට අරමුණු කර ඇත.

සමානයින් විසින් සමාලෝචනය කරනු ලබන ජාතික හා අන්තර්ජාතික ප්‍රකාශන වැනි ශාස්ත්‍රීය වශයෙන් ස්ථාපිතවී ඇති සම්මතයන් හරහා අපගේ පර්යේෂණවල සම්පූර්ණ බව අඛණ්ඩව පරීක්ෂා කරනු ලැබේ. මෙම වාර්තාවේ ඉතිරි කොටස තුළින් සනාථ වන පරිදි, විවධ දේශීය හා අන්තර්ජාතික ප්‍රතිපත්ති සංසද ගණනාවක් සඳහා සම්පත් දායකයින් ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් සඳහා විශාල ඉල්ලුමක් පවතී. COVID-19 වසංගතයට කලාපීය ප්‍රතිචාර දැක්වීමේ ප්‍රයත්නයන්ට සහාය වශයෙන් ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි, විශේෂයෙන් ම පුළුල් දකුණු ආසියානු කලාපයෙහි හවුල්කරුවන් සමග අපගේ ඇති ඒකාබද්ධ නියැළීම් පුළුල් මට්ටමක ඇත. අපගේ පර්යේෂණ හරහා ජනනය කරනු ලබන දත්ත, සාක්ෂි සහ දැනුම වෙත වඩාත් පුළුල් ලෙස ප්‍රවේශ විය හැකි බව සහතික කිරීම උදෙසා අපගේ සන්නිවේදන සහ ප්‍රතිපත්ති නියැළීම් ප්‍රයත්නයන්හි සාර්ථකත්වයන් වර්ධනය වෙමින් පවතින බව එමගින් පෙන්නුම් කෙරෙයි. මෙම වාර්තාවෙහි ඉතිරි කොටස මගින් අපගේ පර්යේෂණ ක්‍රියාකාරකම් පෙන්නුම් කරන අතර 2020 වර්ෂයේදී අපි අත්කර ගත් ප්‍රධාන ප්‍රතිඵල සමහරක් අවධාරණය කරයි.

අපගේ කාර්ය මණ්ඩලයේ විශේෂඥභාවය හා පළපුරුද්ද නොතිබෙන්නට මෙම වර්ෂය පුරා අප අත්කර ගත් සාර්ථකත්වයන් සහ ජයග්‍රහණ ලබා ගන්නට අපට නොහැකි වන්නට තිබුණි. අප සඳහා අප විසින් ම පිහිටුවාගෙන ඇති දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ දක්ෂ අභ්‍යන්තර පර්යේෂණ කණ්ඩායම සහ සහායක කාර්ය මණ්ඩලය දක්වන කැපවීම පිළිබඳව ඔවුන්ට මාගේ ස්තුති පුද කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ප්‍රතිපත්ති කර්තව්‍යයන් සාක්ෂාත් කර ගැනීමට සහ සියලු ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිතවලට ධනාත්මක බලපෑමක් ඇති කිරීමේ මෙහෙවර ඉටු කිරීමට උපකාර කිරීම සඳහා 2020 වර්ෂයේ දී අලුතින් පත් කරන ලද පාලක මණ්ඩලය විසින් ලබා දෙන ලද සහයෝගය මා දැඩි ලෙස අගය කරමි.



දුෂ්නි වීරකෝන්
විධායක අධ්‍යක්ෂක

පර්යේෂණ



ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික ප්‍රතිපත්ති පසුබිම තුළ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි කාර්යභාරය වනුයේ ප්‍රතිපත්තිමය තීරණ සඳහා දැනුවත් වීම පිණිස සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට විවිධ ප්‍රතිපත්ති විකල්පවල ගම්‍යමානයන් අවබෝධ කර ගැනීමට උපකාර වීම පිණිස විශ්ලේෂණාත්මක සාක්ෂි සපයා දීම වේ. අනෙකුත් සෙසු කරුණු අතර, ප්‍රතිපත්ති නොගැළපීම්, යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, සෞඛ්‍ය හා අධ්‍යාපන අංශවල දුර්වල රාජ්‍ය සේවා සැපයුම, පුහුණුව හිඟවීම, බලශක්ති පිරිවැය ඉහළ යමින් පැවතීම සහ මූල්‍ය හා ඉඩම් සඳහා ප්‍රවේශ වීමට ඇති බාධාවන් වැනි වර්ධනය කෙරෙහි ඇති තීරණාත්මක අවහිරතා පිළිබඳ දැඩි විශ්ලේෂණයන් සිදු කිරීම අවශ්‍ය වේ. ආදායම සහ ධනය පිළිබඳව නිරන්තරව පවතින අසමානතාවයන්, පරිසර හානිය සහ ස්වාභාවික සම්පත් ක්ෂය වීම, වැඩිහිටියන්ගේ සහ අනෙකුත් අවදානම් සහගත ජනගහනයේ යහපැවැත්ම යනාදිය ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුණ ඇතිව ප්‍රධාන ආර්ථික සංකල්ප, ආකෘති සහ දර්ශක අඛණ්ඩව සමාලෝචනය කිරීම අවශ්‍ය වේ.

සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරගකාරීත්වය



ආයෝජකයින්ට හිතකර ප්‍රතිපත්ති වාතාවරණයක් පවත්වා ගනිමින් සහ දේශීය අගය එකතු කළ අපනයන වැඩි කරන සෘජු විදේශ ආයෝජන රටට ඇතුල්වීම සඳහා පවතින නියාමන අවහිරතා අවම කර ගන්නා අතර ම ශක්තිමත් සාර්ව ආර්ථික සම්බන්ධීකරණයක් ඇති කිරීම 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්තියෙහි දක්වා ඇති ප්‍රධානතම ප්‍රතිපත්ති මාර්ගය වේ. රාජ්‍ය අංශය විසින් භාවිතා කරනු ලබන සම්පත්වල (රාජ්‍ය ආයෝජන, රාජ්‍ය ව්‍යවසාය) කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම, ආර්ථික දිරිගැන්වීම් වැඩිදියුණු කිරීම (වෙළඳ ප්‍රතිසංස්කරණ, කෘෂිකර්මාන්තයේ මිල ක්‍රම, විදුලිය වැනි රාජ්‍ය උපයෝගිතා), සහ ආයතනික කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම (රේගු, බදු පරිපාලනය) අරමුණු කර ගත් ආර්ථික ප්‍රතිපත්ති තිරසාර වර්ධන ප්‍රයත්නය මෙහෙයවන ප්‍රධාන සාධක වේ. සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරගකාරීත්වය යන අංශයෙහි පර්යේෂණ අධ්‍යයන මගින් 2020 වර්ෂයේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී:

සාර්ව ආර්ථික ප්‍රතිපත්තිමය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020" වාර්තාව මගින් 'වසංගතය හා අවහිර - COVID-19 සහ ඉන් ඔබ්බට ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුනර්ජීවනය' නැමති තේමාව යටතේ COVID-19 වසංගතයෙන් පසුව වඩා හොඳින් නැවත ගොඩනැගීම සඳහා රටක ප්‍රතිපත්ති වෙනස් වන ආකාර පරීක්ෂා කර බලන ලදී. දුෂ්නි වීරකෝන් විසින් රචනා කරන ලද "COVID-19 වසංගතයට සහ ඉන් ඔබ්බට සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිචාර" සහ හරිනි වීරසේකර විසින් රචනා කරන ලද "COVID-19 සහ ගෝලීය ආර්ථික සංවර්ධනයන්" පිළිබඳව වූ ප්‍රධාන පරිච්ඡේද මගින් දේශීය හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති සන්දර්භයන් සහ ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග විශ්ලේෂණය කරන ලදී.

ඒ ආකාරයෙන් ම, COVID-19 වසංගතයෙහි අහිතකර පිරිවැයෙහි ප්‍රමාණය එවැනි ව්‍යසනයන් මෙහෙයවා ගැනීම සඳහා රටක ඇති සූදානම මත රඳා පවතියි. 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020' වාර්තාවෙහි වසංගත වලට ඔරොත්තු දීම සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති හැකියාව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය කරන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ පිළිබඳව විමසා බැලෙන, " COVID-19 සහ ඉන් ඔබ්බට: වසංගතයෙහි පිරිවැය අවම කිරීම" යන මාතෘකාව යටතේ නිශා අරුණතිලක විසින් රචනා කරන ලද පරිච්ඡේදයක් දායක කර ඇත. "වසංගතයෙන් නැගී සිටීම උදෙසා: COVID-19 වසංගතය සඳහා අර්බුදවලට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමෝපායයක්" යන මාතෘකාව යටතේ අතුල සේනාරත්න විසින් රචනා කරන ලද පරිච්ඡේදය මගින් වසංගතයට ප්‍රතිචාර දැක්වීමේදී මුහුණ දී ඇති වර්තමාන ප්‍රතිපත්ති සහ ආයතනික අභියෝග පිළිබඳව විමසා බලන ලදී. මෙම විශ්ලේෂණාත්මක පරිච්ඡේද දෙකෙහි ම ජාතික හා අන්තර්ජාතික සන්දර්භයන්හි අත්දැකීම් පදනම් කර ගනිමින් ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කරයි.

ලෝක ආර්ථික සංසදය (WEF) විසින් ප්‍රකාශයට පත් කරනු ලබන "ගෝලීය තරගකාරීත්ව වාර්තාව 2020" සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පෙර වර්ෂයේදී මෙන් ම දායකත්වය ලබා දුන්නේය. මෙම වාර්තාව මගින් ගෝලීය තරගකාරීත්ව දර්ශකයට අනුව රටවල් පෙළ ගස්වා ඇත. එම දත්ත මගින් ආර්ථිකයක තරගකාරීත්වය සහ ජාතික, කලාපීය සහ ගෝලීය මට්ටමින් ඇති වෙනස්කම් පෙන්නුම් කරයි. හවුල්කාර ආයතනයක් ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වෙනුවෙන් කිත්මිණ හේවගේ මෙම වාර්තාවට දායක විය.
නිශා අරුණතිලක, හරිනි වීරසේකර සහ චාමිනී තිලන්කා එක්සත් රාජධානියේ

9

'කැන්සර් රිසර්ච්' සංවිධානය සමග එක්ව "බදු ප්‍රත්‍යාස්ථතා ගණනය කිරීම සහ දුම්කොළ බදු වෙනස්වීම් බදු ආදායම කෙරෙහි ඇති කරන බලපෑම තක්සේරු කිරීම" පිළිබඳ අධ්‍යයනයක් සිදු කළහ. මෙම අධ්‍යයනය මගින් බදු වෙනස්වීම් වලින් රජයේ ආදායම කෙරෙහි ඇතිකරන බලපෑම තක්සේරු කිරීම පිණිස විවිධ දුම්කොළ නිෂ්පාදන සඳහා මිල නම්‍යතාවය සහ හරස් මිල නම්‍යතාවය තක්සේරු කරයි. ගණනය කරන ලද නම්‍යතාවයන් භාවිතා කරමින් මෙම අධ්‍යයනය මගින් දුම්කොළ ආදායම, ව්‍යාප්තිය සහ ඒ ආශ්‍රිත සෞඛ්‍ය ප්‍රතිඵලවල වෙනස්කම් ආදර්ශනය කරයි. විශේෂයෙන් ම, මෙම ගණනය කරන ලද නම්‍යතා ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ පාලනය පිළිබඳ කාර්යාමු සම්මුතියෙහි නිර්දේශයන්ට අනුව ශ්‍රී ලංකාවේ දුම්වැටි සඳහා ඒකාකාර බදු අනුපාතයක් කරා ගමන් කිරීමේ ප්‍රතිඵල පුරෝකථනය කිරීම පිණිස භාවිතා කරනු ලැබේ. සමානයින්ගේ සමාලෝචනයෙන් පසුව මෙම අධ්‍යයනයෙහි සොයාගැනීම් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ මාලාවේ ප්‍රකාශනයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී:

- ශ්‍රී ලංකාවේ දුම්වැටි සඳහා නම්‍යතා ඇස්තමේන්තු: නිශා අරුණතිලක, හරිනි වීරසේකර සහ චාමිනී තිලන්කා විසිනි (2020). සෞඛ්‍ය සහ අධ්‍යාපන පර්යේෂණ මාලා අංක 17. කොළඹ: ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.
- COVID-19 වසංගතයෙහි ආර්ථික බලපෑම් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සිදුකිරීම ආරම්භ කිරීමත් සමග, සාකච්ඡා මණ්ඩල සාකච්ඡාවන්ට සහ අනෙකුත් සංසදවලට සහභාගී වීම හරහා ප්‍රතිපත්ති නියැළීම් සිදුකිරීම දේශීය මෙන්ම ගෝලීය සංසදවලදී ද පුළුල් සන්නිවේදනයන් සිදු කිරීමේ වැදගත් මාර්ගයක් විය. ප්‍රධාන ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා වලින් කිහිපයක් පහත සඳහන් පරිදි වේ:
- "ණය හා වර්ධනය පිළිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති උභතෝකෝටිකය: ඉහළ මධ්‍යම ආදායම් ආර්ථිකයක් සඳහා වන අභියෝග" පිළිබඳ පස් වැනි ගාමණී කොරෙයා අනුස්මරණ දේශනය, ජනවාරි 30, බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුමස්රණ සම්මන්ත්‍රණ ශාලාව (දුෂ්නි වීරකෝන්)
- ඉන්දියානු ලෝක කටයුතු කවුන්සිලය විසින් සංවිධානය කරන ලද "පාර්ලිමේන්තු මැතිවරණය සහ ශ්‍රී ලංකාවේ COVID-19 වසංගතය" වෙබ් සම්මන්ත්‍රණය, ජුනි 9, (නිශා අරුණතිලක).
- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද "COVID-19 වසංගතයෙන් පසුව ආර්ථික ප්‍රතිසාධනය සඳහා මාර්ග සිතියම" පිළිබඳ වෙබ් සම්මනක්ත්‍රණය, ජුනි 12, (නිශා අරුණතිලක)
- South Asia Watch on Trade, Economics and Environment (SAWTEE) විසින් සංවිධානය කරන ලද "COVID-19 වසංගතයෙන් පසු නව ලෝක බලයක් ද? දකුණු ආසියාව සඳහා වන ගැටළු" නැමති වෙබ් සම්මන්ත්‍රණය, කත්මණ්ඩු, සැප්තැම්බර් 22 (දුෂ්නි වීරකෝන්)
- දකුණු ආසියානු ආර්ථික ආකෘතිකරණ ජාලය (SANEM) විසින් සංවිධානය කරන ලද, දකුණු ආසියානු ආර්ථික ආකෘතිකරණ ජාලයේ COVID-19 සහ සංවර්ධන අභියෝග පිළිබඳ අථත්‍ය අන්තර්ජාතික සංවර්ධන සමුළුව 2020 අවස්ථාවේදී "සාර්ව ආර්ථික බලපෑම්" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයේදී සැසියෙහි මුලසුන දැරීම, බංග්ලාදේශය, ඔක්තෝබර් 2 (දුෂ්නි වීරකෝන්)
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සත්කාරකත්වය දරන ලද, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව නිකුත් කිරීමට සමගාමීව 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020' යන මාතෘකාව යටතේ පවත්වන ලද වෙබ් සම්මන්ත්‍රණ විද්වත් මණ්ඩල සාකච්ඡාව, ඔක්තෝබර් 15
- CMA ආයතනය විසින් සංවිධානය කරන ලද ජාතික කළමනාකරණ ගිණුම්කරණ (CMA) සමුළුවේදී "COVID-19 වසංගතය මගින් ආර්ථිකයට ඇති බලපෑම ජය ගැනීම" පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව, ඔක්තෝබර් 21 (දුෂ්නි වීරකෝන්).
- බංග්ලාදේශයේ ප්‍රතිපත්ති සංවාද කේන්ද්‍රය සහ ආර්ථික සහයෝගීතාවය හා සංවර්ධනය සඳහා වන සංවිධානය විසින් සංවිධානය කරන ලද "කොවිඩ් -19 වසංගතය සඳහා බහුපාර්ශ්වික ප්‍රතිචාරය - දකුණු ආසියාවේ දෘෂ්ටිකෝණයන්" පිළිබඳ අථත්‍ය සාකච්ඡාව, ඔක්තෝබර් 27 (දුෂ්නි වීරකෝන්).
- ආසියා පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම (UNESCAP) විසින් සංවිධානය කරන ලද පශ්චාත් කොවිඩ් -19 තත්වයට ඔරොත්තු දෙන ආර්ථිකයන් පිළිබඳ අතථ්‍ය විශේෂඥ කණ්ඩායම් රැස්වීමේදී "ආර්ථික වශයෙන් කම්පනවලට ඔරොත්තු දීම" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය, බැංකොක්, නොවැම්බර් 17, (දුෂ්නි වීරකෝන්)
- 2021 අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය "පශ්චාත් අයවැය ට්විටර් පිළිසඳර" පැවැත්වූයේය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, නොවැම්බර් 18.





- KPMG ආයතනය විසින් සංවිධානය කරන ලද "අයවැය විශ්ලේෂණය 2021: ප්‍රත්‍යස්ථිතීය සහ ප්‍රතිසාධනය සඳහා මාර්ගය" විද්වත් මණ්ඩල සාකච්ඡාව, නොවැම්බර් 18 (දුෂ්නි වීරකෝන්).
- එච්.එස්.බී.සී. බැංකුව විසින් සංවිධානය කරන ලද "එච්.එස්.බී.සී. ශ්‍රී ලංකා වෙබ් සම්මන්ත්‍රණය: නව සාමාන්‍ය තත්ත්වය තුළ වර්ධනය වීම - ශ්‍රී ලංකාව සඳහා ආර්ථික දැක්ම සහ තරගකාරී වාසි ගොඩනැගීම" යන මාතෘකාව යටතේ පැවති වෙබ් සම්මන්ත්‍රණයේ විද්වත් මණ්ඩල සාකච්ඡාව, නොවැම්බර් 26 (දුෂ්නි වීරකෝන්).
- Asia Securities විසින් සංවිධානය කරන ලද සිව් වැනි වාර්ෂික ශ්‍රී ලංකා ආයෝජන සමුළුව 2021 අවස්ථාවේදී" V(accine) හැඩැති ප්‍රතිසාධනය: වෛද්‍ය සාධක සහ ආර්ථික බලපෑම්" පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව, දෙසැම්බර් 15, (දුෂ්නි වීරකෝන්).

පොදු විවාද සහ සාකච්ඡා සඳහා දැනුම්වත් වීමේ පුළුල් ප්‍රයත්නයෙහි කොටසක් ලෙස 'ටෝකිං ඉකොනොමික්ස්' නැමති ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන බ්ලොග් අඩවියෙහි බ්ලොග් ලිපි මාලාවක් පළ කරන ලදී. මේම ලිපිවලට මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවල පුළුල් ආවරණයක් ලැබුණි. එහි පළවූ ප්‍රධාන ලිපිවලින් කිහිපයක් පහත සඳහන් පරිදි වේ:

- කොළඹ නගරයේ වාහන නවතා තැබීමේ ගාස්තු: ගෙවීමට ද, නැතහොත් නොගෙවීමට ද?, බිලේෂා වීරරත්න, ටෝකිං ඉකොනොමික්ස්, ජනවාරි 21.
- කැකෑරෙමින් තිබෙන කුණාටුවක්: ශ්‍රී ලංකාවට COVID-19 හි ආර්ථික බලපෑම, කිත්මිණ හෙවගේ, ටෝකිං ඉකොනොමික්ස්, මාර්තු 27.
- 2019 වර්ෂයේ පාස්කු ප්‍රහාර සහ 2020 වර්ෂයේ COVID-19 පැතිරීම: ශ්‍රී ලංකාවට ඉදිරියේදී සිදුවන දේ මොනවාද ?, නිශා අරුණතිලක, ටෝකිං ඉකොනොමික්ස්, අප්‍රේල් 3.
- COVID-19 මැඩපවත්වාගෙන කටයුතු කිරීම: අර්බුද අතරතුරදී ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය ආශ්‍රිත ව්‍යාපාර ආර්ථිකය, කිත්මිණ හේවගේ සහ හරිනි වීරසේකර, ටෝකිං ඉකොනොමික්ස්, මැයි 4.
- සෞඛ්‍ය පිරිවැය අඩු කිරීම සහ COVID-19 වසංගතයෙන් ඔබ්බට රජයේ ආදායම වැඩි කිරීම: ශ්‍රී ලංකාවේ දුම්වැටි සඳහා බදු වැඩිකිරීමට හේතු වන තත්වයක්, හරිනී වීරසේකර සහ චාමිනී තිලන්කා, ටෝකිං ඉකොනොමික්ස්, මැයි 29.
- වඩා හොඳින් නැවත ගොඩ නැගීම: COVID-19 වසංගතයෙන් ඔබ්බට ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුනර්ජීවනය කිරීම, හරිනි වීරසේකර, ටෝකිං ඉකොනොමික්ස්, ඔක්තෝබර් 19.
- COVID-19 සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රතිචාර: ජාත්‍යන්තර සන්දර්භයෙන් අපට ඉගෙන ගත හැක්කේ කුමක්ද?, චාමිනී තිලන්කා, ටෝකිං ඉකොනොමික්ස්, නොවැම්බර් 2.
- සියලු දෙනාට වාසිදායක වන උපායමාර්ගයක්: එළඹෙන අයවැය මගින් රජය දුම්කොළ බදු වැඩි කළ යුත්තේ ඇයි? හරිනි වීරසේකර, ටෝකිං ඉකොනොමික්ස්, නොවැම්බර් 12.
- දුම්කොළ සඳහා බදු අය කිරීම: 2021 අයවැයට මගහැරුණේ කුමක් ද?, හරිනි වීරසේකර, ටෝකිං ඉකොනොමික්ස්, දෙසැම්බර් 21.

රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය සමග ද කමිටුවල නියැළීම මගින් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති හා ව්‍යුහාත්මක ක්ෂේත්‍රයන්හි ප්‍රතිපත්ති යෙදවුම් සපයා දෙන ලදී. 2020 වර්ෂයේ දී සම්බන්ධ වූ මෙම කමිටුවලට අනෙකුත් සෙසු කමිටු අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සඳහා නියෝජනය ලබා දීම (මැයි දක්වා), සහ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ මෙහෙයුම් කමිටුවේ අඛණ්ඩව නිරත වීම ඇතුළත් විය. එමෙන්ම, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාව විසින් 2021 අයවැයට අදාළව "රාජ්‍ය මූල්‍ය, මූල්‍ය හා ආර්ථික උපකල්පන ඇගයීමක් සහ රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමග අනුකූල වීම විශ්ලේෂණයක්" සපයා දෙන ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙන් ඉල්ලා සිටියේය. දත්තවල සීමිත බව සලකා බැලීමේදී හැකි තාක් දුරට, 2021 අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට භාවිතා කර ඇති උපකල්පනවල විශ්වාසනීයත්වය සහ වියදම් පිළිබඳ යෝජනා රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව වන 'සෞභාග්‍යයේ දැක්ම' අනුව සකස් කර ඇති ප්‍රමුඛතාවන්ට අනුකූල වන්නේද යන්න විශ්ලේෂණය කිරීම මෙහි අරමුණ විය.

වෙළඳ සහ කලාපීය ඒකාබද්ධතාවය

සදර්න් වොයිස් බුද්ධි මණ්ඩල ජාලය සමග එක්ව "ශ්‍රී ලංකාවේ දකුණු-දකුණු සහයෝගීතාව සඳහා පාලනය හා ආයතනික කාර්යරාමු" යන මාතෘකාව යටතේ කිත්මිණ හේවගේ සහ හරිනි වීරසේකර විසින් සිදු කරන ලද

අධ්‍යයනයක් මගින් නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන උපාය මාර්ගවලදී විදේශ ආධාරවල භූමිකාව විමර්ශනය කෙරෙයි. කෙසේවෙතත්, මෑත කාලයේදී විශේෂයෙන් ම චීනයෙන් සහ ඉන්දියාවෙන් සිදුවූ ගලනයන් තුළින් දකුණු-දකුණු සහයෝගීතාවයෙහි වැදගත්කම වැඩි වී තිබේ. සිද්ධි අධ්‍යයන මාලාවක් හරහා සිදු කරන ලද මෙම අධ්‍යයනය උතුරු-දකුණ සහ දකුණු-දකුණු සහයෝගීතාව මත පදනම් වූ සංවර්ධන ව්‍යාපෘති සඳහා දැනට ක්‍රියාත්මකව තිබෙන ආයතනික හා පාලන කාර්යරාමු සංසන්දනය කෙරෙයි.

ශ්‍රී ලංකා රජය සමග එක්ව, යුරෝපා සංගමය විසින් අරමුදල් සපයනු ලබන ශ්‍රී ලංකාවේ වෙළඳාම ආශ්‍රිත ආධාර වැඩසටහනෙහි කොටසක් ලෙස කිත්මිණ හෙවගේ ජිනීවා නගරයේ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය සමග "ඉදිකිරීම්, වාස්තුවිද්‍යාත්මක හා ඉංජිනේරු අංශවල නියාමන ඇගයීමක්" සිදු කළේය. ශ්‍රී ලංකාවේ අන්තර්කරණය වූ වෙළඳාම ප්‍රමුඛ කර ගත් වර්ධනය සහ කලාපීය ඒකාබද්ධතා ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ අපනයන තරගකාරිත්වයට සහාය වීම සහ ආර්ථික වර්ධනය හා සංවර්ධනය සඳහා ඉහළ විභවයක් ඇති අංශවල අගය එකතු කිරීම මෙම අධ්‍යයනයෙහි අරමුණ විය.

සදර්න් වොයිස් බුද්ධි මණ්ඩල ජාලයේ අරමුදල් සැපයීම මත "ඇඟළුම් අංශය කෙරෙහි COVID-19 වසංගයෙහි බලපෑම" නැමති අධ්‍යයනය බංග්ලාදේශයේ සහ ශ්‍රී ලංකාවේ ඒකාබද්ධව පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ සන්දර්භය පිළිබඳ කිත්මිණ හෙවගේ විසින් සිදු කරන ලද අධ්‍යයනය මගින් COVID-19 අර්බුදය තුළ මධ්‍ය කාලීන ප්‍රතිසාධනය සහතික කිරීම සඳහා සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්තිමය තීරණ සහ මෙහෙයුම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඇඟලුම් කර්මාන්තයෙහි අගය දාමය පුරා සිටින ප්‍රධාන පාර්ශ්වකරුවන්ට පහසුකම් සලසයි.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂකයින් ආයතනයෙහි හිටපු විධායක අධ්‍යක්ෂ, ආචාර්ය සමන් කැලේගම මහතාට ගෞරවය පිණිස ජාත්‍යන්තරව ප්‍රකාශයට පත් කරන ලද වෙළුමකට පරිච්ඡේද රචනා කරමින් දායකත්වය සැපයූහ. පහත සඳහන් මාතෘකා යටතේ වන පරිච්ඡේද මෙයට ඇතුළත් වේ:

- ස්ප්‍රින්ජර් ප්‍රකාශන ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද දකුණු ආසියාවේ වෙළඳ හා කලාපීය ඒකාබද්ධතාවය එස්. රීහාන් සහ පී. ඩේ (ixia') (2020), සිංගප්පූරුව, ප්‍රකාශනය සඳහා දුෂ්නි වීරකෝන් රචනා කළ **දකුණු ආසියාවේ ප්‍රතිපත්ති සම්පාදනයේ දේශපාලන ආර්ථිකය** නැමති පරිච්ඡේදය.
- ස්ප්‍රින්ජර් ප්‍රකාශන ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද දකුණු ආසියාවේ වෙළඳ හා කලාපීය ඒකාබද්ධතාවය එස්. රීහාන් සහ පී. ඩේ (ixia') (2020), සිංගප්පූරුව, ප්‍රකාශනය සඳහා ජනක විජයසිරි සහ සුවේන්ද්‍රනි ජයරත්න විසින් රචනා කළ **ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වෙළඳාම සඳහා පහසුකම් සැලසීම** නැමති පරිච්ඡේදය.
- ආයතනය ජාලකරණය වෙමින් ශක්තිමත්ව දකුණු ආසියාව තුළ කලාපීය වශයෙන් පෙනී සිටීම සැලකිල්ලට ගැනීමේදී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂකයින් COVID-19 වසංගතයට ප්‍රතිචාර දැක්වීමේදී රටෙහි අත්දැකීම්, පාඩම් බෙදාගැනීම සහ කලාපීය සහයෝගීතා වැඩසටහන් පරීක්ෂා කිරීම අරමුණු කරගත් බහුවිධ සංවාද සංසදවලට සක්‍රීය ලෙස සම්බන්ධ වූහ. ඒ අතරින් ප්‍රධාන ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡාවලට පහත සඳහන් වැඩසටහන්වලට සහභාගී වීම ඇතුළත් වේ:

- දකුණු ආසියානු ප්‍රතිපත්ති අධ්‍යයන කේන්ද්‍රය විසින් සංවිධානය කරන ලද **"දකුණු ආසියාවේ** COVID-19 **ප්‍රතිචාරය"** පිළිබඳ වටමේස සාකච්ඡාව, මැයි 21 (දුෂ්නි වීරකෝන්).
- ලෝක බැංකුවේ දකුණු ආසියා කාර්යාලය විසින් සංවිධානය කරන ලද **"දකුණු ආසියාව කෙරෙහි** COVID-19 **වසංගතය මගින් ඇති කෙරෙන ගම්‍යමානයන්"** පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයකදී **"**COVID-19 **සහ ඉන් ඔබ්බට දකුණු ආසියාවේ කලාපීය සහයෝගීතාව"** පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව, ජූනි 2, (දුෂ්නි වීරකෝන්).
- UNESCAP දකුණු හා නිරිතදිග ආසියා කාර්යාලය සහ දකුණු ආසියා ප්‍රතිපත්ති අධ්‍යයන කේන්ද්‍රය විසින් සංවිධානය කරන ලද **"**COVID-19 **වසංගතයෙන් යථා තත්ත්වයට පත්වීම කඩිනම් කිරීම සහ වඩා හොඳින් ගොඩනැගීම සඳහා වන දකුණු ආසියානු සහයෝගීතාවය"** නැමති මාතෘකාව යටතේ පැවති අතථ්‍ය ප්‍රතිපත්ති සංවාදය, නවදිල්ලිය, සැප්තැම්බර් 9 (දුෂ්නි වීරකෝන්).
- ඉන්දියන් සාගර අධ්‍යයන සංගමය විසින් සංවිධානය කරන ලද **"බෙංගාල**

බොක්ක කලාපයේ පශ්චාත් COVID උපායමාර්ගික දැක්ම" නැමති මාතෘකාව යටතේ පැවති වෙබ් සම්මන්ත්‍රණය, නවදිල්ලිය, ඔක්තෝබර් 26 (දුෂ්නි වීරකෝන්).

- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා ආර්ථික සමුළුව 2020 වැඩසටහනෙහි දී "දේශීය සම්පත්වල උපරිම ප්‍රයෝජනය ගනිමින් ඉහළ අගය එකතු කිරීම් වැඩිදියුණු කිරීම" නැමති මාතෘකාව යටතේ







පැවති විද්වත් මණ්ඩල සාකච්ඡාව, දෙසැම්බර් 1, (දුෂ්නි වීරකෝන්).

- රිසර්ච් ඇන්ඩ් ඉන්ෆොමේෂන් සිස්ටම්ස් නැමති ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද **"බිම්ස්ටෙක් ප්‍රතිපත්ති බුද්ධි මණ්ඩල ජාලයේ පස් වැනි රැස්වීම"** සඳහා සහභාගී වීම, නවදිල්ලිය, දෙසැම්බර් 21-22 (දුෂ්නි වීරකෝන්)
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ දකුණු-දකුණු සහයෝගීතාවය සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය විසින් සංවිධානය කරන ලද **"සංවර්ධනය වෙමින් පවතින රටවලට COVID-19 වසංගතය මගින් ඇති කරන සමාජ ආර්ථික ගම්‍යමානයන්"** පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය, මැයි 7 (කිත්මිණ හේවගේ).
- රාජ්‍යතාන්ත්‍රික භාවය හා ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ආසියානු ආයතනය සහ විදේශ කටයුතු ආයතනය විසින් සංවිධානය කරන ලද **"ආර්ථිකයට COVID-19 මගින් ඇතිකරන බලපෑම් පිළිබඳ SAARC-ASEAN සංවිධාන"** නැමති මාතෘකාව යටතේ පැවති වෙබ් සම්මන්ත්‍රණය, ජුනි 30 (කිත්මිණ හේවගේ).

අපනයන කර්මාන්ත ආශ්‍රිත විවිධ ගැටළු පිළිබඳව මෙන්ම ශ්‍රී ලංකාව කෙරෙහි ඇඟවීම් සහිත ගෝලීය වර්ධනයන් පිළිබඳව ද බ්ලොග් ලිපි පළ කරන ලදී. පහත සඳහන් මාතෘකා පිළිබඳ රචනා කරන ලද ලිපි මෙයට ඇතුළත් විය:

- **තාක්ෂණය විසින් ශ්‍රී ලංකාවේ ඇඟළුම් අංශයේ සැපයුම් දාම හැඩගස්වන ආකාරය: ව්‍යාපාර මෙහෙයුම් ආසන්න රටවලට මාරුකිරීම සහ නැවත මෙරටට මාරු කිරීම,** නිපුනි පෙරේරා, ටෝකිං ඉකොනොමික්ස්, ජනවාරි 27.
- **කොරොනා වයිරස් වසංගතය සහ චීනයේ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම: ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කෙරෙන ආර්ථික බලපෑම,** ජනක විජයසිරි, ටෝකිං ඉකොනොමික්ස්, පෙබරවාරි 13.
- **කලාපීය පරිපූර්ණ ආර්ථික සහයෝගීතාවය** (RCEP)**: ශ්‍රී ලංකාවේ නවතම ආසියා කේන්ද්‍රීය ප්‍රහේලිකාව,** දුෂ්නි වීරකෝන් සහ කිත්මිණ හේවගේ, ටෝකිං ඉකොනොමික්ස්, දෙසැම්බර් 7.

ආයෝජන සහ මූල්‍යය

ආයතන විසින් සමාජ සේවා සැපයීම සඳහා වඩාත් විනිවිදභාවයෙන් යුතු සහ කාර්යක්ෂම වාතාවරණයක් නිර්මාණය කිරීම පිණිස යොදාගත හැකි යහ පරිචයන් සහ නියාමන අඩුපාඩු අවබෝධ කර ගැනීම පිණිස ආසියාව පුරා පවත්වන ලද කලාපීය අධ්‍යයනයක කොටසක් ලෙස **"ජනහිතකාමී ක්‍රියා දර්ශකය 2020"** නැමති මෙරට පිළිබඳව වූ ජාතික වාර්තාව සම්පාදනය කිරීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය හොංකොං හි පිහිටි පරාර්ථචර්යා සහ සමාජ කේන්ද්‍රය (Centre for Philanthropy and Society) සමග හවුල්කාරිත්වයෙන් යුතුව කටයුතු කළේය. කිත්මිණ හේවගේ විසින් මෙම අධ්‍යයනය මෙහෙයවන ලදී.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, කර්මාන්ත සහ ව්‍යවසායකත්වය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය අන්තර්කරණය වූ ආර්ථික වර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය, රැකියා උත්පාදනය සහ දරිද්‍රතාවය අවම කිරීම සඳහා

වෙනසක් ඇති කළ හැකි අංශයක් වේ. "ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක හා සංස්කෘතික කර්මාන්ත" නැමති මාතෘකාව යටතේ සිදුකරන ලද සිතියම්කරණ අධ්‍යයනය මගින් එම අංශයේ පිළිගැනීමට, වර්ධනයට සහ සංවර්ධනයට සහාය වීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් සැලසුම් කිරීම සඳහා උපකාරී වීම පිණිස සහ එමගින් එය පුළුල් කිරීම ප්‍රවර්ධනය කළ හැකි ප්‍රතිපත්ති සහ උපායමාර්ග සම්පාදනය කිරීම සඳහා තොරතුරු සපයා දීම පිණිස ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක කර්මාන්තවල සමස්ත ප්‍රමාණය හා පරිමාණය පරීක්ෂා කරන ලදී. දිලණි හිරිමුතුගොඩගේ විසින් සම-සංස්කරණය කරන ලද මෙම වාර්තාව ශ්‍රී ලංකා බ්‍රිතාන්‍ය කවුන්සිලය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

කිත්මිණ හේවගේ **"ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020"** වාර්තාව සඳහා **"ගෝලීය අවහිර මධ්‍යයෙහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ආරක්ෂා කිරීම"** නැමති මාතෘකාවය යටතේ පරිච්ඡේදයක් රචනා කළේය. COVID-19 වසංගතය මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අතර පවතින අඩු ඉතිරිකිරීම්, වත්කම් සහ තොග ප්‍රමාණයන් වැනි සාම්ප්‍රදායිකව පවතින අනාරක්ෂිතභාවයන් වඩාත් උග්‍ර කර ඇති අතර එමගින් ඒ ආශ්‍රිත සුවිශේෂී ප්‍රතිපත්ති අභියෝග මාලාවක් නිර්මාණය වී ඇත. වර්තමාන අර්බුදය මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් කෙරෙහි ඇති කර තිබෙන සෘණාත්මක බලපෑම් අවම කිරීම සඳහා සහ පශ්චාත් COVID-19 ප්‍රතිසාධනය සඳහා පහසුකම් සැලසීම පිණිස මෙම විශ්ලේෂණය මගින් ශ්‍රී ලංකාවට සීමා සහිත වූ මූල්‍ය අවකාශයක් කළමනාකරණය කර ගනිමින් අනුගමනය කළ හැකි ප්‍රතිපත්ති විකල්පයන් ගවේෂණය කරයි.

ඉදිරිපත් කිරීම් / සාකච්ඡා:

- ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය කවුන්සිලය විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක හා සංස්කෘතික කර්මාන්ත" පිළිබඳ වාර්තාව එළිදැක්වීම යන මාතෘකාව යටතේ පැවති වෙබ් සම්මන්ත්‍රණයෙහි විද්වත් මණ්ඩල සාමාජිකයෙක් ලෙස කටයුතු කරන ලදී, මැයි 02 (දිලණි හිරිමුතුගොඩගේ)

බ්ලොග් ලිපි:

- වසංගතයක් අතරතුර ශ්‍රී ලාංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආරක්ෂා කිරීම: නව්‍ය විසඳුම් සඳහා අවශ්‍යතාවයක්, කිත්මිණ හේවගේ, ටෝකිං ඉකොනොමික්ස්, සැප්තැම්බර් 14.

බුද්ධිමය දේපළ

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය "ශ්‍රී ලංකාව සඳහා ජාතික බුද්ධිමය දේපළ ප්‍රතිපත්තියක්" සකස් කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කරන ලදී. දිලණි හිරිමුතුගොඩගේ විසින් මෙහෙයවන ලද මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන පරමාර්ථය රටෙහි ආර්ථික හා නවෝත්පාදන මානයන්ට සමගාමීව උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම අරමුණු කර ගෙන සිදු කරන ලදී. මෙහි සමස්ත බලපෑම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය හා නව්‍ය හැකියාවන් ප්‍රවර්ධනය කරන යහ පරිචයන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම අරමුණු කර ඇත.

දිලණි හිරිමුතුගොඩගේ විසින් "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020" වාර්තාව සඳහා "තාක්ෂණය, නවෝත්පාදන හා බුද්ධිමය දේපළ අයිතිවාසිකම් හරහා වසංගත සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම" යන මාතෘකාව යටතේ සම්පාදනය කරන ලද පරිච්ඡේදය මගින් COVID-19 වසංගතයෙහි අහිතකර බලපෑම අවම කිරීම සඳහා ලෝකය පුරා තාක්ෂණය සහ නවෝත්පාදන පුළුල් ලෙස යොදා ගෙන ඇති ආකාරය විමසා බැලෙයි. මෙම විශ්ලේෂණය මගින් විශේෂයෙන් ම වෛද්‍ය විද්‍යාව, සෞඛ්‍ය තාක්ෂණ, ආහාර සහ ආහාර තාක්ෂණ යන ක්ෂේත්‍රවල නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීමේ වැදගත්කම විමසා බැලෙයි.

බ්ලොග් ලිපි:

- ශ්‍රී ලංකාවේ පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂා කිරීම සඳහා වර්ධනය

වෙමින් පවතින අවශ්‍යතාවය, නුවන්ති සේනරත්න, ටෝකිං ඉකොනොමික්ස්, ජනවාරි 13.

- COVID-19 අර්බුදය සහ නවෝත්පාදනය: බුද්ධිමය දේපළ අයිතිවාසිකම් වැදගත් වන්නේ ඇයි?, දිලණි හිරිමුතුගොඩගේ, ටෝකිං ඉකොනොමික්ස්, නොවැම්බර් 23.



ශ්‍රමය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය



ගුණාත්මක තත්වයේ ජීවිතයක් ගත කිරීම සඳහා සහ ශ්‍රම වෙළඳපොළෙහි ඵලදායී ලෙස නිරතවීම සඳහා පුද්ගලයින් අවශ්‍ය කරන මානව සම්පත් අත්කර ගන්නා බව සහතික කිරීම සඳහා යහපත් සෞඛ්‍යයක් සහ ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශය තිබීම වැදගත් වේ. කෙසේ වෙතත්, මූල්‍ය හා මානව හා භෞතික සම්පත් අවහිරතා හමුවේ, නව වර්ධනයන් සමග ඉදිරියට යමින් මේ සියල්ල සඳහා ගුණාත්මක ප්‍රවේශයක් ලබා දීම සහතික කිරීම වැඩි වැඩියෙන් දුෂ්කරව පවතින බැවින්, අධ්‍යාපනය හා සෞඛ්‍යය සඳහා ප්‍රවේශය සපයා දීම සඳහා දැනට පවතින ආකෘතීන් මේ වන විට අභියෝගයට ලක්වෙමින් පවතියි. ශ්‍රමය, සේවා නියුක්තිය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය යන ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති දිශානත වූ දැනුම් අඩුපාඩු විසඳීම මගින් මෙම ප්‍රතිපත්ති අභියෝග යන්ට විසඳුම් සෙවීමේදී රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයට සහාය වීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ වලින් අරමුණ කරයි.

ශ්‍රම වෙළඳපොළ

ප්‍රියංකා ජයවර්ධන විසින් "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020" වාර්තාව සඳහා "COVID-19 සහ වැඩ ලෝකය" පිළිබඳ පරිච්ඡේදයක් රචනා කරන ලදී. එම විශ්ලේෂණය මගින් ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළට COVID-19 වසංගතය මගින් ඇතිකර තිබෙන බලපෑම විමසා බැලීම, බලපෑම් සම්ප්‍රේෂණය වන මාර්ග ඇගයීම සහ අන්තර්ජාතික යහපරිචයන් මගින් ලබා දිය හැකි විසඳුම් පිළිබඳ සොයා බැලීම සිදු කරයි. අනාගතයේ දී එවැනි හදිසි අවස්ථාවන්ට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාව වඩා හොඳින් සූදානම් කිරීම පිණිස සහ ශ්‍රම වෙළඳපොළ අහිතකර කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම පිණිස ප්‍රතිපත්ති අවධානයක් යොමු කළ යුතු ප්‍රධාන අංශ හඳුනා ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

ඉදිරිපත් කිරීම් / සාකච්ඡා:

- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ කාර්යාලය විසින් සංවිධානය කරන ලද "COVID-19 වසංගතයෙහි සමාජ-ආර්ථික බලපෑම් සහ එයට දක්වන ප්‍රතිචාර: තිරසාර සමාජ-ආර්ථික ප්‍රතිසාධනයක් සඳහා 'නව සාමාන්‍ය' ජීවන ක්‍රමය හසුරවා ගැනීම" නැමති මාතෘකාව යටතේ පැවති වටමේස සාකච්ඡාව, අප්‍රේල් 23 (නිශා අරුණතිලක).

බ්ලොග් ලිපි:

- COVID-19 **සහ ශ්‍රී ලංකාවේ ත්‍රිරෝද රථ කර්මාන්තය සඳහා ඉදිරි මග, තිසලි ද සිල්වා සහ නිශා අරුණතිලක,** ටෝකිං ඉකොනොමික්ස්, අප්‍රේල් 21.
- COVID-19 **සහ ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ අඩුපාඩු: තාවකාලික සේවකයින් සඳහා ස්ථිර ආරක්ෂාව, ප්‍රියංකා ජයවර්ධන,** ටෝකිං ඉකොනොමික්ස්, සැප්තැම්බර් 9.
- **අර්බුද අතරතුරදී රැකියා සහ ව්‍යවසාය ආරක්ෂා කිරීම: ශ්‍රී ලංකාවට වඩා හොඳ ප්‍රතිචාර දැක්විය හැක්කේ කෙසේද ?, අශානි අබයසේකර,** ටෝකිං ඉකොනොමික්ස්, දෙසැම්බර් 14.

කාන්තාවන් සහ ශ්‍රම බලකාය

"ශ්‍රී ලංකාව: ආර්ථිකයේ තත්වය 2020" වාර්තාව සඳහා සුනිමලී මදුරාවල විසින් රචනා කරන ලද "වසංගත, කාන්තාවන් සහ ශ්‍රම බලකායේ කාන්තාවන්" නැමති පරිච්ඡේදය මගින් COVID-19 වසංගතය හා ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වලින් ලොව පුරා ආර්ථික ක්‍රියාකාරකම් අවහිර වී ඇති ආකාරය විමර්ශනය කෙරෙයි. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම පිරිමින්ට සහ කාන්තාවන්ට වෙනස් ලෙස බලපායි. මෙම අධ්‍යයනය තුළින් COVID-19 වසංගතයෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවී ගම්‍යමානයන් පිළිබඳව විමසා බැලෙන අතර, අර්බුදකාරී අවස්ථාවකදී ශ්‍රම වෙළඳපොළෙහි සිටින පිරිමින් සහ කාන්තාවන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාව



ගතිකයන් වෙනස් ආකාර වලින් ක්‍රියා කරන්නේ කෙසේද යන්න පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂකයින් ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ ගැටළු පිළිබඳ සිදු කරමින් පවතින අධ්‍යයන සම්බන්ධ ප්‍රධාන ප්‍රකාශන දෙකක් රචනා කළහ. පහත සඳහන් ප්‍රකාශන මේවාට ඇතුළත් විය:

නිශා අරුණතිලක විසින් රචනා කරන ලද **"ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වයට බලපාන පද්ධතිමය ගැටළු"** (2020), ෆ්ලැට්, එමා ජේ., වානි ස්වරූපා මුරලි සහ, සිල්වියා ටියරි (සංස්.), දකුණු ආසියාව පිළිබඳ හඬනැගීම්: කාන්තාවන්ගේ තත්ත්වය, අභියෝග සහ අනාගතයන් පිළිබඳ අන්තර්විෂයයික දෘෂ්ටිකෝණයන්, වර්ල්ඩ් සයන්ටිෆික් පබ්ලිෂිං, සිංගප්පූරුව.

හෙද නිවාස හා සුපිරි වෙළඳසැල්වල කාන්තාවන්, රැකියා සහ රාත්‍රී සේවා මුර, නිශා අරුණතිලක, අශානි අබයසේකර, චතුර්ගා කරුණානායක සහ දුලිනි ප්‍රනාන්දු විසිනි. (2020). කොළඹ: ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.

ඉදිරිපත් කිරීම්/සාකච්ඡා:

මුදල් කොමිෂන් සභාව විසින් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සහ SD GAP සමග එක්ව සංවිධානය කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී ක්‍රමසම්පාදනය සහ අයවැයකරණය පිළිබඳ හැකියා සංවර්ධන වැඩසටහනෙහිදී "පළාත් සභාවල දත්ත පදනම් කරගත් ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී ක්‍රමසම්පාදනය සහ අයවැයකරණය" පිළිබඳ ඉදිරිපත් කිරීම, පෙබරවාරි 28 (බිලේෂා වීරරත්න).

- ඩී.එෆ්.සී.සී බැංකුව පී.එල්.සී. විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් උළෙල - 2020 අවස්ථාවේදී "සමාන ලෝකයක් යනු සවිබල ගැන්වූ ලෝකයක් වේ" නැමති මාතෘකාව යටතේ සිදු කළ ඉදිරිපත් කිරීම, මාර්තු 6 (සුනිමලී මදුරාවල)
- එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල විසින් සංවිධානය කරන ලද සංවර්ධන හවුල්කරුවන්ගේ ලේකම් කාර්යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාව ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමේදී "ස්ත්‍රී පුරුෂ සමාජභාවය අවධානයට ගනිමින් COVID-19 හි ආර්ථික දෘෂ්ටි කෝණය" නැමති මාතෘකාව යටතේ වෙබ්-පාදක විද්වත් මණ්ඩල සාකච්ඡාව, අප්‍රේල් 15, (නිශා අරුණතිලක)

බ්ලොග් ලිපි:

- 'So Sri Lanka'; එයටත් වඩා, හෝටල් කර්මාන්තයෙහි කාන්තාවන් සියළු දෙනා කොහේ සිටින්නේද? ", ජනක විජයසිරි, ටෝකිං ඉකොනොමික්ස්, පෙබරවාරි 24.
- "ශ්‍රී ලංකාවේ රාත්‍රී සේවයෙහි සහ සේවා මුරවල නිරත කාන්තාවන්: වැඩි සහභාගිත්වයකට පහසුකම් සැලසීම සඳහා වන ප්‍රතිපත්ති", නිශා අරුණතිලක, අශානි අබයසේකර සහ චතුර්ගා කරුණානායක, ටෝකිං ඉකොනොමික්ස්, මාර්තු 5.
- කධඬෂ-19, නිවසේ සිට වැඩ කිරීම සහ කාන්තා ශ්‍රම බලකායෙහි සහභාගිත්වය: ශ්‍රී ලංකාව සඳහා පාඩමක්, සුනිමලී මදුරාවල, ටෝකිං ඉකොනොමික්ස්, සැප්තැම්බර් 7.

- ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයේ කාන්තාවන්ගේ ස්ථානය සුරක්ෂිත කිරීම, සුනිමලී මදුරාවල සහ නිපුනි පෙරේරා, ආසියානු සංවර්ධන බැංකුවේ ඩිවෙලොප්මන්ට් ඒසියා, අගෝස්තු 31

නිපුණතා සහ අධ්‍යාපනය

"ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020" වාර්තාව සඳහා සම්පාදනය කරන ලද "අර්බුදයට ඔරොත්තු දෙන අධ්‍යාපන පද්ධතියක් ශ්‍රී ලංකාවෙහි ගොඩනැගීම" යන පරිච්ඡේදය මගින් අශානි අබයසේකර දැනට පවතින COVID-19 වසංගතය රටේ අධ්‍යාපන කටයුතු අඩාල කර ඇති ආකාරය විමසා බලයි. දුරස්ථ ඉගෙනුම් ක්‍රම උපයෝගී කරගනිමින් අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාමට පියවර ගෙන තිබුණ ද, එවැනි ක්‍රම වලින් සියල්ලන්ටම සමානව ප්‍රතිලාභ ලබාගත නොහැකිය. මෙම විශ්ලේෂණය මගින් COVID-19 වසංගතය අධ්‍යාපන පද්ධතියට ඇති කර තිබෙන බලපෑම විමසා බැලෙන අතර අර්බුද වලට ඔරොත්තු දෙන අධ්‍යාපන පද්ධතියක් ගොඩනැගීම සඳහා නිර්දේශ ද සපයා දෙයි.

නිශා අරුණතිලකගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලද "ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සිටින රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්: රට පිළිබඳ අධ්‍යයනයක්" නැමති අධ්‍යයනය මගින් 2021/2022 ගෝලීය අධ්‍යාපන අධීක්ෂණ කලාපීය වාර්තාවට දායක වීම පිණිස රාජ්‍ය නොවන ක්‍රියාකාරකම්වල විවිධ මානයන්: අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ප්‍රතිපාදනය, මුදල් යෙදවීම, නියාමනය, නව්‍යකරණයන්, සහ ප්‍රතිපත්ති බලපෑම කෙරෙහි අවධානය යොමු කිරීමට අරමුණු කරයි. මෙම අධ්‍යයනය මගින් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි වර්තමාන තත්වය සහ දෘෂ්ටි කෝණයන්, පවතින තත්වය ඇතිවීමට තුඩු දුන් නියාමන හා මූල්‍යකරණ ප්‍රතිපත්ති වර්ධනයන්, සහ නුදුරු අනාගතයේ ප්‍රතිපත්ති සංවර්ධනයන් සඳහා ඇඟවීම් කරන වැදගත් මෑත කාලීන ප්‍රවණතා කෙරෙහි අවධානය යොමු කරයි. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා හා සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) විසින් මෙම අධ්‍යයනය සඳහා අරමුදල් සපයයි.

ඉදිරිපත් කිරීම් / සාකච්ඡා:

- අධ්‍යාපන ප්‍රතිපත්ති සංසදය විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ පස් වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය: එය කෙතරම් ඵලදායී සහ අදාළ වන්නේද?" යන මාතෘකාව යටතේ පවත්වන ලද ඉදිරිපත් කිරීම, කිංස්බරි හෝටලය, මාර්තු 3 (අශානි අබයසේකර).

බ්ලොග් ලිපි:

- STEM ක්ෂේත්‍රයේ ගැහැණු ළමයින් : ශ්‍රී ලංකාව ක්‍රියා කරන්නේ කෙසේද ?, අශානි අබයසේකර, ටෝකිං ඉකොනොමික්ස්, පෙබරවාරි 11.
- COVID-19 කාලය තුළ සහ ඉන් පසුව දුරස්ථ අධ්‍යාපනය: ශ්‍රී ලංකාව සඳහා ඉදිරියට දිගු මගක්, අශානි අබයසේකර, ටෝකිං ඉකොනොමික්ස්, ජූලි 13.
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සමානාත්මතාවය: දරිද්‍රතාවයෙන් මිදීමේ මාවතක්, විමල් නනායක්කාර, ටෝකිං ඉකොනොමික්ස්, දෙසැම්බර් 28.

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සඳහා වූ ප්‍රතිපත්ති යෙදවුම් ද ඇතුළුව විවිධ ප්‍රතිපත්ති කමිටුවලට ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වීම තුළින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය නිපුණතා සහ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සෘජු ප්‍රතිපත්ති යෙදවුම් අඛණ්ඩව සපයනු ලැබීය. 2020 වර්ෂයේ දී ප්‍රතිපත්ති කමිටුවලට ක්‍රියාකාරීව සම්බන්ධවීම් වලට පහත සඳහන් මැදිහත්වීම් ඇතුළත් විය:

- තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ස්ථාවර කමිටුව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.
- උසස් අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ ස්ථාවර කමිටුව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.
- සාමාන්‍ය අධ්‍යාපනය හා මූල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.
- විද්‍යා හා තාක්ෂණ ආයතනවල කාර්ය සාධන සමාලෝචනය, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව.

18

- අධ්‍යාපන පර්යේෂණ සංවර්ධනය පිළිබඳ උපදේශක කමිටුව, අධ්‍යාපන අමාත්‍යාංශය.
- ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය, ජාතික මානව සම්පත් සංවර්ධන සභාව.

සෞඛ්‍යය

නිශා අරුණතිලක එක්සත් රාජධානියේ KIVU ඉන්ටර්නැෂනල් සංවිධානයේ සහාය ඇතිව, එක්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් ආයතනයෙහි අරමුදල් සැපයීම මත "දුම්කොළ පාලනය: අවසන් සැතැප්ම ගමන් කිරීම" නැමති මාතෘකාව යටතේ පර්යේෂණ සිදු කරන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ කණ්ඩායමක් මෙහෙය වූවාය. දුම්කොළ භාවිතය පාලනය කිරීම සඳහා වන ප්‍රතිපත්ති යෝජනා කරමින් රට තුළ දුම්කොළ භාවිතය හේතුවෙන් සිදුවන හානිය අවම කිරීම අරමුණු කරගත් අධ්‍යයන මාලාවක් මෙම වැඩසටහන යටතේ සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ දුම්කොළ භාවිතය මේ වන විටත් තරමක් අඩු මට්ටමක පවතී. මෙම අධ්‍යයනයෙහි අරමුණ වන්නේ දුම්කොළ භාවිතය තවමත් සිදුකරන පුද්ගලයින් සහ එම ස්ථාන හඳුනාගෙන දුම්කොළ භාවිතය අවම කිරීම සඳහා ඉලක්කගත ප්‍රතිපත්ති නිර්දේශ කිරීමයි.

සුනිමලී මදුරාවල සහ චතුර්ගා කරුණානයක විසින් 'දුම්කොළ රහිත ගම්මාන: දුම්කොළ රහිත ශ්‍රී ලංකාවකට මාවතක්' යන මාතෘකාව යටතේ සිදු කරන ලද අධ්‍යයනයක් මගින් ශ්‍රී ලංකාවේ දුම්පානය කිරීම අවසන් කිරීමේ ප්‍රතිපත්ති විකල්පයක් ලෙස ප්‍රජාපාදක දුම්කොළ භාවිතය වැළැක්වීමේ මැදිහත්වීමක් වන 'දුම්කොළ රහිත කලාප (TFZ)' ආකෘතිය යෝජනා කරයි. එමගින් ආකෘතියෙහි සාර්ථකත්වයන්, අසාර්ථකත්වයන්, අභියෝග සහ අවස්ථාවන් අධ්‍යයනය කරන අතර දැනට ක්‍රියාත්මක වන 'දුම්කොළ රහිත කලාප' වැඩසටහන පුළුල් කිරීමේ හැකියාවන් ගවේෂණය කෙරෙයි. මෙම අධ්‍යයනයට එක්සත් රාජධානියේ KIVU ඉන්ටර්නැෂනල් සංවිධානයෙහි සහාය ඇතිව එක්සත් රාජධානිය කැන්සර් රිසර්ච් ආයතනය විසින් අරමුදල් සපයනු ලැබේ.

සෞඛ්‍ය මෙන්ම ආර්ථික යන අංශ දෙකෙහි ම සමස්ත ප්‍රතිලාභ දුම්කොළ නිෂ්පාදන අංශය මුහුණ දෙන අලාභයන් ඉක්මවා යන බව ප්‍රතිපත්ති සම්පාදකයින්ට ඒත්තු ගැන්වීම සඳහා දුම්කොළ පාලන ප්‍රතිපත්ති මගින් ශුද්ධ ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කරන්නේද යන්න තක්සේරු කිරීම වැදගත් වේ. ප්‍රියංකා ජයවර්ධන සහ හරිනි වීරසේකර විසින් "ආදාන-ප්‍රතිදාන (I-O) වගු භාවිතා කරමින් ජාතික ආර්ථිකයට දුම්කොළ පාලනය කිරීම මගින් ඇතිකෙරෙන බලපෑම" පිළිබඳව සිදු කරන ලද අධ්‍යයනයක් මගින් දුම්කොළ භාවිතය අවම කිරීමේ ප්‍රයත්නයන්හි දී දුම්කොළ පාලනය කිරීමේ ක්‍රියාමාර්ගවල ජාතික ආදායම් අංශය පිළිබඳ විමර්ශනය කෙරෙයි. මෙම අධ්‍යයනය සඳහා ජාතික ආදාන-ප්‍රතිදාන වගු භාවිතා කරමින් ලෝක බැංකුව විසින් සකස් කරන ලද දුම්කොළ මෙවලම් කට්ටලයෙහි ආර්ථික විද්‍යාව යොදා ගනියි.

දිලනි හිරිමුතුගොඩගේ සහ නිමේෂා දිසානායක එක්සත් රාජධානියේ KIVU ඉන්ටර්නැෂනල් සංවිධානයෙහි සහාය ඇතිව එක්සත් රාජධානිය කැන්සර් රිසර්ච් ආයතනයෙහි අරමුදල් සැපයීම මත "තනි දුම්වැටි අලෙවි කිරීම තහනම් කිරීම බලාත්මක කිරීමේ විකල්ප හඳුනා ගැනීම" පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයක් සිදු කරමින් සිටිති. තනි දුම්වැටි සඳහා ඇති ඉල්ලුම තක්සේරු කිරීම සහ ඇගයීම, සහ සිල්ලර වෙළඳුන්ට, දුම්කොළ අලෙවියට සහ දුම් පානය කරන්නන්ට ඉන් ඇති වන බලපෑම පරීක්ෂා කිරීම මෙම අධ්‍යයනයෙහි අරමුණු වේ. තවද, තනි දුම්වැටි අලෙවි කිරීම පිළිබඳ තහනමක් පැනවීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට ඵලදායී ප්‍රතිපත්ති විකල්ප ලබා දීමේ සමස්ත අරමුණ ඇතිව මෙය දුම්කොළ සිල්ලරට අලෙවි කිරීම පිළිබඳව වන අභිමේක වැඩසටහන (වෙළඳ ළැදියා වැඩසටහනක්) ඇති බලපෑම සමග ඒකාබද්ධ කෙරෙයි.

දිලණි හිරිමුතුගොඩගේ සහ සධානා මොහාන් විසින් "ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය හරහා දුම්කොළ භාවිතය වක්‍රාකාරව ප්‍රවර්ධනය කිරීම" පිළිබඳ අධ්‍යයනයක් සිදු කරනු ලැබේ. සමාජ මාධ්‍යවල දුම්කොළ වක්‍රාකාරව ප්‍රවර්ධනය කිරීමේ ආකාර හඳුනා ගැනීම සහ ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ දුම් පානය කිරීමේ ආකල්ප හා අභිප්‍රායන් සඳහා සමාජ මාධ්‍යවල බලපෑම තක්සේරු කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. තවද, මෙම අධ්‍යයනය මගින් සමාජ මාධ්‍ය හරහා දුම්කොළ වක්‍රාකාරව ප්‍රවර්ධනය කිරීම අවම කිරීම සඳහා වඩාත් ඵලදායී

ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහාය වීමට අදහස් කෙරෙයි. මෙම අධ්‍යයනයට එක්සත් රාජධානියේ KIVU ඉන්ටර්නැෂනල් සංවිධානයෙහි සහාය ඇතිව එක්සත් රාජධානිය කැන්සර් රිසර්ච් ආයතනය විසින් අරමුදල් සපයනු ලැබේ.

ප්‍රකාශන:

- "ශ්‍රී ලංකාවේ දුම්පානය: අවසන් අදියරේ සිටින දුම් පානය කරන්නන් හඳුනා ගැනීම සහ අවබෝධ කර ගැනීම", සුනිමලී මදුරාවල, චතුර්ගා කරුණානායක සහ චාමිනි තිලංකා (2020), සෞඛ්‍ය හා අධ්‍යාපන පර්යේෂණ මාලාව, අංක 18, කොළඹ: ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.

බ්ලොග් ලිපි:

- ශ්‍රී ලංකාවේ දුම්පානය: අවසන් සැතැප්ම ගමන් කිරීම, චතුර්ගා කරුණානයක සහ චාමිණි තිලන්කා, ටෝකිං ඉකොනොමික්ස්, ජනවාරි 6.
- ශ්‍රී ලංකාවේ දුම්පානය නැවැත්වීම: COVID-19 අර්බුදයේ රිදී රේඛාවක්?, චතුර්ගා කරුණානායක, ටෝකිං ඉකොනොමික්ස්, අප්‍රේල් 14.
- කොරෝනා වසංගත සමයේ දුම්පානය: COVID-19 වසංගතයට එරෙහි සටනේදී දුම්පානය සීමා කිරීම වැදගත් වන්නේ ඇයි? සුනිමලී මදුරාවල, ටෝකිං ඉකොනොමික්ස්, අප්‍රේල් 27
- දුම් ගසා පලවා හැරීම: තනි දුම්වැටි අලෙවි කිරීම තහනම් කළ යුත්තේ ඇයි? දිලණි හිරිමුතුගොඩගේ, ටෝකිං ඉකොනොමික්ස්, සැප්තැම්බර් 23.
- දුම්කොළ ආර්ථික විද්‍යාව: පරිභෝජනය අඩු කිරීම ගෘහස්ථ සහ ජාතික ආර්ථිකයට ප්‍රයෝජනවත් වන්නේ කෙසේද?, ප්‍රියංකා ජයවර්ධන, ටෝකිං ඉකොනොමික්ස්, නොවැම්බර් 5.
- ශ්‍රී ලංකාවේ දුම්කොළ දුම් පානය කිරීමේ අභියෝගය: අවසන් සැතපුම ගමන් කිරීම, සුනිමලී මදුරාවල, ටෝකිං ඉකොනොමික්ස්, දෙසැම්බර් 10.

කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයෙහි (IDRC) අරමුදල් සැපයීම යටතේ නිශා අරුණතිලකගේ නායකත්වයෙන් යුත් පර්යේෂණ කණ්ඩායමක් විසින් "ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න ආහාර ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්ති සහ නියමයන් ශක්තිමත් කිරීම" පිළිබඳ පර්යේෂණයක් ආරම්භ කළහ. සෞඛ්‍ය සම්පන්න නොවන ආහාර පුරුදු අවම කිරීම සඳහා මෑතකදී හඳුන්වා දුන් පහත සඳහන් මූල්‍ය හා නියාමන මැදිහත්වීම් තුනෙහි ඵලදායීතාවය පරීක්ෂා කිරීමට යෝජිත අධ්‍යයනය මගින් අරමුණු කරයි: (අ) සීනි යොදා පැණිරස කළ බීම සඳහා බද්දක් පැනවීම, (ආ) සීනි යොදා පැණිරස කළ බීමවල සීනි මට්ටම පෙන්නුම් කරන රථවාහන ආලෝක ලේබල් ක්‍රමයක් හඳුන්වා දීම, (ඇ) පාසල්වල සිසුන්ට තෝරා ගැනීම සඳහා සෞඛ්‍ය සම්පන්න ආහාර වර්ග තේරීම් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් සෞඛ්‍ය සම්පන්න ආපනශාලා වැඩසටහන.



ප්‍රකාශන:

- ශ්‍රී ලංකාවේ මන්දපෝෂණයට එරෙහිව සටන් කිරීමේ ප්‍රගාමී මාවතක්, ප්‍රියංකා ජයවර්ධන (2020), සෞඛ්‍ය හා අධ්‍යාපන පර්යේෂණ මාලා අංක 16, කොළඹ: ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.
- ශ්‍රී ලංකාවේ පෝෂණය සඳහා රාජ්‍ය වියදම් සමාලෝචනය: පෝෂණය සඳහා රාජ්‍ය අරමුදල් යෙදවීම තක්සේරු කිරීම (2014-2018), හිදෙකි හිගාෂි, ප්‍රියංකා ජයවර්ධන, දීපිකා ආටිගල, සුගන්යා යෝගේස්වරන්, උපුලා අමරසිංහ, සෆිනා අබ්දුල්ලෝවා සහ ලුයිස් ඩැනියෙල්ස් (2020). වොෂිංටන්, ඩී.සී: ලෝක බැංකුව.

බ්ලොග් ලිපි:

- පාසලක් නැත, ආහාර නැත: COVID-19 වසංගතය අතරතුර ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණයට එරෙහි සටන, ප්‍රියංකා ජයවර්ධන, ටෝකිං ඉකොනොමික්ස්, ජූනි 9.

ඇමරිකා එක්සත් ජනපදයේ ඩියුක් විශ්ව විද්‍යාලය සමග එක්ව "ශ්‍රී ලංකාවේ රෝග (COVID-19 ඇතුළුව), ජනවිකාශන, දේශීය මූල්‍ය හා පරිත්‍යාගශීලී සංක්‍රාන්තීන් (4Ds) අතරතුර සෞඛ්‍ය ප්‍රගතිය ප්‍රේරණය කිරීම" පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. නිශා අරුණතිලකගේ මෙහෙයවීම යටතේ සිදු කරනු ලබන මෙම අධ්‍යයනයට රෝග, ජන විකාශනය, සෞඛ්‍ය සඳහා සංවර්ධන

සහාය (DAH) සහ සෞඛ්‍යය සඳහා දේශීය අරමුදල් සැපයීම යන අන්තර් සම්බන්ධිත සංක්‍රාන්තීන් අවබෝධ කර ගැනීම පිණිස ඇමරිකා එක්සත් ජනපදයේ ඩියුක් විශ්ව විද්‍යාලයේ ගෝලීය සෞඛ්‍ය සඳහා ප්‍රතිපත්තිමය බලපෑම පිළිබඳ මධ්‍යස්ථානය සමග සහයෝගයෙන් කටයුතු කිරීම ඇතුළත් වේ.

ඉදිරිපත් කිරීම් / සාකච්ඡා:

- ඩියුක් විශ්ව විද්‍යාලයේ ගෝලීය සෞඛ්‍ය සඳහා ප්‍රතිපත්තිමය බලපෑම පිළිබඳ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද "ජගත් සෞඛ්‍යය, මධ්‍යම ආදායම් ලබන රටවල් මුහුණ දෙන අරමුදල් සැපයීමේ ගැටළු" පිළිබඳ මාර්ගගත විද්වත් මණ්ඩල සාකච්ඡාව, නොවැම්බර් 9 (නිශා අරුණතිලක).
- ඉන්දියාවේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පර්යේෂණ හා තොරතුරු පද්ධතිය (RIS) විසින් සංවිධානය කරන ලද "COVID-19 සහ දකුණු ආසියාවේ මානසික සෞඛ්‍ය ප්‍රතිචාර - ඉගෙනීම සහ සහයෝගීතාවය සඳහා අවස්ථා" නැමති මාතෘකාව යටතේ පැවති වෙබ් සම්මන්ත්‍රණයෙහි සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කිරීම, නොවැම්බර් 24 (සුනිමලී මදුරාවල).

බ්ලොග් ලිපි:

- වසංගත යුගයක ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග පාලනය කිරීම, විමල් නනායක්කාර, ටෝකිං ඉකොනොමික්ස්, සැප්තැම්බර් 11.

සංක්‍රමණය සහ නාගරීකරණය



ගෝලීයකරණය වැඩිවීම සහ ඒක පුද්ගල ආදායම ඉහළ යාමත් සමග ශ්‍රී ලාංකිකයන් රැකියා සඳහා පමණක් නොව අධ්‍යාපන කටයුතු සඳහා සහ පවුල් ඒකක සමග සංක්‍රමණය වෙමින් සිටිති. ඒ අතරම, සංචාරකයින් වශයෙන් පමණක් නොව සේවකයින් ලෙස ද ශ්‍රී ලංකාවට විදේශිකයින් පැමිණෙති. ආර්ථික අවස්ථා සොයමින් ජනතාව නාගරික මධ්‍යස්ථාන වෙත සංක්‍රමණය වීමට තෝරා ගැනීම නිසා ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණික රටාවන් ද වෙනස් වෙමින් පවතී. මෙම තත්වය නිසා ශ්‍රී ලංකාවේ හරිත, සුහුරු හා ප්‍රත්‍යාස්ථ නගර සංවර්ධනය කිරීම, නාගරීකරණයෙහි ඇති විෂමතාවලට ආමන්ත්‍රණය කිරීම සහ නාගරික ප්‍රදේශවල නිවාස, ඉඩම් ප්‍රවාහනය සහ අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම අවශ්‍ය වී තිබේ.

සේවක සංක්‍රමණය සහ ප්‍රේෂණ

සංක්‍රමණික සේවකයින් විසින් දරනු ලබන පිරිවැය පිළිබඳව සොයා බැලීමට උත්සාහ කර ඇතත්, ශ්‍රී ලංකාවේ බඳවා ගැනීමේ නියෝජිතයින් විසින් සිදු කරනු ලබන බඳවා ගැනීම් සහ ඒ හා සම්බන්ධ මෙහෙයුම් පිරිවැය පිළිබඳව පුළුල් පර්යේෂණ සිදු කර නොමැත. මෙම සන්දර්භය තුළ, ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙහි අරමුදල් සැපයීම යටතේ බිලේෂා වීරරත්න සහ හරිනි වීරසේකර විසින් සිදු කරනු ලබන "බඳවා ගැනීමේ ව්‍යාපාර ක්‍රියාවලීන්" නැමති අධ්‍යයනය මගින් බඳවා ගැනීමේ නියෝජිතයින් විසින් දරනු ලබන බඳවා ගැනීමේ පිරිවැය ඇතුළු බඳවා ගැනීමේ ව්‍යාපාර ක්‍රියාවලීන් පිළිබඳව සොයා බැලෙයි.

ඒ හා සමානව, බිලේෂා වීරරත්න සහ හරිනි වීරසේකර විසින් "සංක්‍රමණික සේවකයින් සඳහා ප්‍රේෂණ පිරිවැය අඩු කිරීමේ අරමුණෙන් ප්‍රේෂණ රටා" නැමති මාතෘකාව යටතේ සිදු කරනු ලබන අධ්‍යයනයක් මගින් ප්‍රේෂණ පිරිවැය අඩු කිරීමේ ක්‍රම හඳුනා ගැනීම සඳහා තීරණ ගන්නන්ට උපකාර කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාවේ ප්‍රේෂණ රටා සහ පිරිවැය පිළිබඳ සාක්ෂි ජනනය කිරීමට උත්සාහ දරයි. විශේෂයෙන් ම, මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ ප්‍රේෂණ සඳහා ඇති නියාමන පද්ධතිය, තෝරාගත් බඳවා ගැනීමේ ක්ෂේත්‍රවල ප්‍රේෂණ පිරිවැය සිතියම් ගත කිරීම, කලාපීය යහ පරිචයන් ඇගයීම සහ ප්‍රේෂණ පිරිවැය අඩු කිරීම සඳහා නිර්දේශ සපයා දීම පිළිබඳ විමසා බැලෙයි. මෙම අධ්‍යයනය සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් අරමුදල් සපයන ලදී.

බිලේෂා වීරරත්න හෙල්සින්කි නුවර පිහිටි UN-WIDER ආයතනය සමග එක්ව "ද්විත්ව බර සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ බාධක: ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම සංක්‍රමණය සම්බන්ධ ප්‍රතිපත්තියක් පිළිබඳ හේතු විශ්ලේෂණයක්" විමසා බලයි. ශ්‍රී ලංකාවේ පවුල් පසුබිම් වාර්තාව කාන්තාවන්ට 'ද්විත්ව බරෙහි' ආදායම් ඉපැයීමේ බර දැරීම සීමා කරවන අතර, පවුලේ ප්‍රමාණවත් ආදායමක් නොමැතිකම පවුල රැකබලා ගැනීමේදී වඩාත් වැඩි බරක් වෙමින්, රැකියා අවස්ථාවන්ට ප්‍රවේශ වීමට ස්ත්‍රී පුරුෂ සමාජභාවය බාධාවක් වී තිබේ. මෙම සන්දර්භය තුළ, පවුල් පසුබිම් වාර්තාව ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය හඳුන්වා දීම විවිධ නිපුණතා කණ්ඩායම්වලට අයත් කාන්තාවන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය බාධකයක් ලෙස ක්‍රියා කරන්නේ කෙසේද යන්න පිළිබඳව සහ ආදායම් ඉපැයීමේ බරෙහි දී පිරිමින් සහ කාන්තාවන් ආදේශ කිරීම සඳහා පවුල් පසුබිම් වාර්තාව මගින් ඇති කළ හැකි බලපෑම පිළිබඳව සොයා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

"ශ්‍රී ලංකාව: ආර්ථිකයේ තත්වය 2020" වාර්තාව සඳහා බිලේෂා වීරරත්න විසින් රචනා කරන ලද "COVID-19 වසංගතයෙන් ඔබ්බට ජාත්‍යන්තර සංචරණය" පිළිබඳ දායක පරිච්ඡේදය මගින් සංචරණය සහ ශ්‍රී ලංකාවේ COVID-19 වසංගතය ව්‍යාප්ත වීම අතර අන්තර් සම්බන්ධතාවය විමර්ශනය කරන අතර, පශ්චාත් COVID-19 වසංගත යුගයක ශ්‍රී ලංකාවෙන් සිදුවන ශ්‍රම සංක්‍රමණය නැවත ස්ථානගත කිරීමේ අරමුණෙන් වසංගතයෙහි ඇඟවීම් සමග

ප්‍රමුඛස්ථානයක් ගෙන ඇති, ශ්‍රම සංක්‍රමණයෙහි පවතින ගැටළු අවධාරණය කර පෙන්වයි. සංක්‍රමණිකයින්ට COVID-19 වසංගතය මගින් එල්ලවන බලපෑම තක්සේරු කිරීම සඳහා පෙර සංක්‍රමණ අධ්‍යයන සඳහා සම්මුඛ පරීක්ෂණයට ලක් කළ සංක්‍රමණික සේවකයින් පිළිබඳ පසු විපරම් අධ්‍යයනයක් ලෙස බිලේෂා වීරරත්න විසින් "ශ්‍රී ලංකාවෙන් මෑතකදී සංක්‍රමණය වූ සංක්‍රමණික සේවකයින්ට COVID-19 වසංගතයෙහි බලපෑම" නැමති මාතෘකාව යටතේ පසු විපරම් අධ්‍යයනයක් ද සිදු කරනු ලැබේ. මෙම අධ්‍යයනයට ශ්‍රම සංක්‍රමණ පිළිබඳ පර්යේෂණ හා ආනුභවික විශ්ලේෂණය (REALM) ජාලය විසින් අරමුදල් සපයනු ලබයි.

ප්‍රකාශන:

- ශ්‍රී ලංකාවේ ප්‍රේෂණ පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක්, බිලේෂා වීරරත්න සහ හරිනි වීරසේකර (2020), ජිනීවා: ජාත්‍යන්තර කම්කරු සංවිධානය.
- සමාගුහණයක් නොමැතිව ආපසු පැමිණීම සහ නැවත සමාජ සංකලනය වීම: COVID-19 වසංගත කාලය තුළ ගල්ෆ් කලාපයේ දකුණු ආසියානු සංක්‍රමණික සේවකයින්, බිලේෂා වීරරත්න (2020), කාර්ය පත්‍රිකා අංක 327, දකුණු ආසියානු අධ්‍යයන ආයතනය (ISAS), සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලය.
- විදේශයන්හි සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණිකයින්: COVID-19 පැතිරෙන අතරතුර සිදු කරන ලද කඩිනම් මාර්ගගත සමීක්ෂණයක ප්‍රතිඵල, බිලේෂා වීරරත්න (2020), පොලිසි ඩිස්කෂන් බ්‍රීෆ්, 2020 අප්‍රේල්, කොළඹ: ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.
- සංක්‍රමණික සේවකයින්ට පොරොන්දු වන වැටුප්: සංක්‍රමණ අධ්‍යයන සඳහා බඳවා ගැනීමේ අතරමැදියන් සම්බන්ධ කර ගැනීමේ විරුද්ධභාවය, බිලේෂා වීරත්න (2020), (ඉදිරි ලිපිය) mnz055, https://doi.org/10.1093/migration/mnz055
- ශ්‍රී ලංකාවෙන් ගල්ෆ් ප්‍රදේශයට සිදු වන ශ්‍රම සංක්‍රමණය: මෑත කාලීන වර්ධනයන් සහ අනාගත දැක්ම, බිලේෂා වීරරත්න (2020), සෙචරියා, ජී. සහ රාජන් (සංස්.) විසින් සංස්කරණය කළ 'ගල්ෆ් සංක්‍රමණ ආසියානුකරණය වීම' නැමති ප්‍රකාශනය, ස්ප්‍රින්ජර්.
- දකුණු ආසියාවේ ශ්‍රම සංක්‍රමණය: වෙළඳ අන්තර්දෘෂ්ටීන්හි COVID-19 වසංගතයෙන් ලැබෙන පාඩම්, බිලේෂා වීරරත්න (2020), වෙළුම 16. අංක 3, SAWTEE, කත්මණ්ඩු, නේපාලය.

ඉදිරිපත් කිරීම් / සාකච්ඡා:

- ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ විෂයාන්තර පර්යේෂණ සඳහා වන ලන්ඩන් මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද 'සංක්‍රමණික ලෝකය: සංක්‍රමණය හා සංකලනය සඳහා විෂයාන්තර ප්‍රවේශයන්' යන තේමාව යටතේ පැවති සම්මන්ත්‍රණයකදී "සංචලනයට ඇති අයිතිය: සංක්‍රමණිකයන්ට බඳවා ගැනීමේ අතරමැදියන්ගේ බලයට යටත්වීමට සිදුවී තිබේද?" යන මාතෘකාව යටතේ සිදු කළ ඉදිරිපත් කිරීම, පෙබරවාරි 22 (බිලේෂා වීරරත්න)
- "ශ්‍රී ලංකාවට COVID-19 වසංගතයෙහි ආර්ථික බලපෑම" පිළිබඳ සාකච්ඡාව, 'ස්වර්ණවාහිනී' රූපවාහිනී නාලිකාව, මාර්තු 30 (බිලේෂා වීරරත්න).
- "පශ්චාත් COVID-19 වසංගත සංදර්භය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුනර්ජීවනය කිරීමේ දී ප්‍රේෂණවල භූමිකාව" පිළිබඳ සාකච්ඡාව, TV1 නාලිකාවේ විකාශය වූ 'ෆේස් ද නේෂන්' වැඩසටහන, අප්‍රේල් 6 (බිලේෂා වීරරත්න)
- "ශ්‍රී ලංකාවේ සංක්‍රමණිකයින්ගේ ප්‍රේෂණ කෙරෙහි COVID-19 වසංගතයේ බලපෑම සහ රටෙහි උග්‍ර වෙමින් පවතින විදේශ විනිමය සම්බන්ධ අවධානයන්" පිළිබඳ සාකච්ඡාව, TV1 නාලිකාවේ විකාශය වූ 'නිව්ස් ලයින්' වැඩසටහන, අප්‍රේල් 15 (බිලේෂ වීරත්න).
- ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් (PwC) ආයතනය විසින් සංවිධානය කරන ලද " පශ්චාත් COVID-19 සංදර්භය තුළ ආර්ථික දැක්ම සහ ප්‍රතිසාධන උපාය මාර්ග" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය, අප්‍රේල් 25 (බිලේෂා වීරරත්න)
- "ගල්ෆ් සංක්‍රමණය: COVID-19 වසංගතය අතරතුර හා ඉන් පසුව" පිළිබඳ සාකච්ඡාවේදී "ඩයස්පෝරාව සහ පාරජාතිකවාදය පිළිබඳ ගෝලීය පර්යේෂණ සංසදය (GRFDT)" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය, මැයි 27 (බිලේෂා වීරරත්න)
- South Asia Watch on Trade, Economics and Environment (SAWTEE) සංවිධානය විසින් සංවිධානය කරන ලද "COVID-19 වසංගතයෙහි පාඩම්: දකුණු ආසියාවේ ශ්‍රම සංක්‍රමණය සහ ප්‍රේෂණ" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණයේ දී "COVID-19 (ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණය සහ ප්‍රේෂණ" පිළිබඳ ඉදිරිපත් කිරීම, කත්මණ්ඩු, ඔක්තෝබර් 6 (බිලේෂා වීරරත්න).
- ලාහෝර් ආර්ථිකවිද්‍යා පාසල විසින් සංවිධානය කරන ලද 'සංක්‍රමණිකයන්, සංක්‍රමණ ප්‍රවාහයන් සහ ප්‍රේෂණ කෙරෙහි COVID-19 වසංගතයෙහි බලපෑම: දකුණු සහ අග්නිදිග ආසියාව පිළිබඳ අවධානය' යන මාතෘකාව යටතේ පැවති වෙබ් සම්මන්ත්‍රණයේදී "ශ්‍රී ලංකාවේ සේවක සංක්‍රමණය සහ ප්‍රේෂණ



කෙරෙහි COVID-19 වසංගතයෙන් ඇති කෙරෙන ඇඟවීම්" පිළිබඳ ඉදිරිපත් කිරීම, ඔක්තෝබර් 28 (බිලේෂා වීරරත්න).

- "2020 ප්‍රේෂණ ආදායම" පිළිබඳ සාකච්ඡාව, News 1st English Prime Time Bulletin, ඔක්තෝබර් 31 (බිලේෂා වීරරත්න).
- "2020 ප්‍රේෂණ ආදායම" පිළිබඳ සාකච්ඡාව, 'සිරස' සිංහල පුවත් විකාශය, නොවැම්බර් 03 (බිලේෂා වීරරත්න).
- "2020 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ලැබෙන ප්‍රේෂණවල ප්‍රක්ෂේපිත අඩුවීමෙහි වෙනස්වීම" පිළිබඳ සාකච්ඡාව, TV1 නාලිකාව ඔස්සේ විකාශය වූ ෆේස් ද නේෂන් වැඩසටහන, නොවැම්බර් 9 (බිලේෂා වීරරත්න).
- සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IOM), එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක සහ ශ්‍රී ලංකාවේ පිහිටි එක්සත් ජාතීන්ගේ ආයතන 11 ක් ශ්‍රී ලංකා රජය සමග එක්ව සංවිධානය කරන ලද 'ශ්‍රී ලංකාවේ සංක්‍රමණ පිළිබඳ එක්සත් ජාතීන්ගේ ජාලය' අතථ්‍ය ලෙස දියත් කිරීමේ අවස්ථාවේ දී, "ශ්‍රී ලංකාව සඳහා සංක්‍රමණ සම්බන්ධ ප්‍රමුඛතා හඳුනා ගැනීම" පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව, නොවැම්බර් 11 (බිලේෂා වීරරත්න).
- එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලය (UNU-WIDER) විසින් සංවිධානය කරන ලද 'කාන්තාවන් වැඩ කිරීම - ආර්ථික සහ සමාජ සවිබල ගැන්වීම සඳහා මාර්ග' පිළිබඳ වැඩමුළුවේදී "ද්විත්ව බර සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ බාධකඃ ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රමිකයන් සංක්‍රමණය වීම සම්බන්ධ ප්‍රතිපත්තියක් පිළිබඳ මූලික විශ්ලේෂණයක්" නැමති මාතෘකාව යටතේ සිදු කළ ඉදිරිපත් කිරීම, දෙසැම්බර් 3 (බිලේෂා වීරරත්න).





බ්ලොග් ලිපි

- COVID-19 සහ විදේශ විනිමය බෙදයඃ ශ්‍රී ලංකාවට එයින් බේරීමේ මගක් සොයාගත හැකිද? බිලේෂා වීරරත්න, ටෝකිං ඉකොනොමික්ස්, අප්‍රේල් 17.
- නැවත සිය රට පැමිණීම සහ නැතිවූ විදේශ රැකියා ප්‍රතිස්ථාපනය කිරීමඃ COVID-19 වසංගත කාලය තුළ ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණය මෙහෙයවීම, බිලේෂා වීරරත්න, ටෝකිං ඉකොනොමික්ස්, මැයි 14
- COVID-19 සහ සංක්‍රමණික සේවකයින්ඃ නැවත මෙරටට ගෙන්වා ගැනීමේ අර්ථ ශාස්ත්‍රය, බිලේෂා වීරරත්න, ටෝකිං ඉකොනොමික්ස්, දෙසැම්බර් 16.

2020 වර්ෂය මුළුල්ලෙහි ම, ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික උපදේශක කමිටුවේ අබණ්ඩ නියෝජනය තුළින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සංක්‍රමණ සහ ප්‍රේෂණ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති යෙදවුම් සපයා දීමට අබණ්ඩව කටයුතු කළේය. විශේෂයෙන් ම, කුසලතා සංවර්ධන, රැකියා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය විසින් සංක්‍රමණික සේවකයින් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා පිහිටුවන ලද කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ප්‍රතිපත්ති යෙදවුම් සපයා දී ඇත.

අභ්‍යන්තර සංක්‍රමණය

බිලේෂා වීරරත්නගේ නායකත්වයෙන් යුත් පර්යේෂණ කණ්ඩායමක් විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා සිදු කරනු ලබන "කෘෂිකාර්මික ශ්‍රම වෙළඳපොළ ක්ෂේත්‍රයෙහි ප්‍රතිපත්ති පර්යේෂණ" පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් මගින් ශ්‍රම වෙළඳපොළෙහි පවතින කාන්තාකරණය වීම, වයස්ගත වීම, පිටතට සංක්‍රමණය වීම, සහ අර්ධකාලීන ගොවිතැන යනාදී ගැටළු කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රධාන කෘෂිකාර්මික උප අංශවල ඵලදායිතාව තක්සේරු කිරීමට ප්‍රයත්න දරයි. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ ශ්‍රම බලකායෙහි තරගකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා උපාය මාර්ග හඳුනා ගැනීම මෙම ප්‍රයත්නයෙහි ප්‍රධාන අරමුණ වේ.

- රුවන් සමරවීර, ඩබ්ලිව්.ජී.ආර්.එල්., ධර්මදාස, ආර්.ඒ.පී.අයි.එස්., වීරහේවා, ජේ., කුමාර, පී.එච්.ටී. සහ ප්‍රනාන්දු, පී.එම්.එම්. (2019). "ශ්‍රී ලංකාවේ ඉඩම් සඳහා ප්‍රවේශය, ජීවනෝපාය විවිධාංගීකරණය සහ ග්‍රාමීය තරුණ සංක්‍රමණය". ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සඟරාව, 7 (1), පි .47-74.

නාගරීකරණය

COVID-19 වැනි සෞඛ්‍ය වසංගත මගින් නාගරික පසුබිම් තුළ මිනිසුන්ගේ ඉතා ඉහළ ජන ඝනත්වයන් හා සම්බන්ධවීම් හමුවේ අනවශ්‍ය බලපෑම් ඇති විය හැකිය. නිසි ලෙස සැලසුම් කර කළමනාකරණය නොකළ හොත්, මුඩුක්කු, පැල්පත් සහ දිළිඳු නිවාස වැනි වඩා අඩු පහසුකම් සහිත ජනාවාස ඇති නාගරික පරිසරයන් වසංගත පැතිරීමට උපකාරී වෙයි. "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020" වාර්තාව සඳහා චතුර්ගා කරුණානායක විසින් "නාගරික පරිසරයන්හි වසංගතය මගින් ඇති කෙරෙන අවහිරතා" සහ රුවන් සමරවීර විසින් "වසංගත යුගයක ප්‍රත්‍යාස්ථ නගර ගොඩනැගීම" යන මාතෘකා යටතේ ප්‍රතිපත්ති සංක්ෂිප්ත රචනා කරන ලද අතර, එමගින් නාගරික පරිසරයන්හි COVID-19 වැනි වසංගතයන් පාලනය කර ගැනීම සම්බන්ධ ගැටළු සහ අනාගතයේ දී නාගරික පරිසරයන් තුළ සෞඛ්‍ය වසංගත වැනි ගෝලීය බාධාවන් පාලනය කිරීමට සහ කළමනාකරණය කිරීමට රටවලට වඩාත් හොඳින් සූදානම් විය හැක්කේ කෙසේ දැයි ගවේෂණය කරයි.

ඉදිරිපත් කිරීම් / සාකච්ඡා:

- පරිසර අමාත්‍යාංශය සහ UN-Habitat සංවිධානය විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ ග්‍රාමීය වියළි කලාපයේ සැලසුම් නොකළ වර්ධන උපාය මාර්ගවල සුසමාදර්ශය සිරස්ව විහිදෙන මානව වාසස්ථාන සහිත, තිරසාර, ප්‍රජා පාදක සැපයුම් දාම කළමනාකරණ පද්ධතියකට මාරු කිරීම", පරිසර අමාත්‍යාංශය, ඔක්තෝබර් 6 (රුවන් සමරවීර)

බ්ලොග් ලිපි:

- නාගරික පරිසරයන්හි වසංගතයෙන් ප්‍රතිසාධනය: සැලසුම් නොකළ දේ සඳහා සැලසුම් කිරීම, චතුර්ගා කරුණානායක, ටෝකිං ඉකොනොමික්ස්, ඔක්තෝබර් 28.
- නාගරික විසඳුම්: ශ්‍රී ලංකාවේ නගරවල වසංගත ප්‍රත්‍යාස්ථිතිය ගොඩනැගීම, රුවන් සමරවීර, ටෝකිං ඉකොනොමික්ස්, නොවැම්බර් 19.

දරිද්‍රතාවය සහ සමාජ සුභසාධනය



පසුගිය දශකය තුළ දරිද්‍රතාවය අවම කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් තිබියදීත්, අසමානතාවය සහ අවදානම් සහගත භාවය ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති විවාද වල විශාල අවධානයක් යොමු වන කරුණු ලෙස අඛණ්ඩව පවතියි. අධ්‍යාපනය, සෞඛ්‍ය, ජලය සහ සනීපාරක්ෂාව සහ මූල්‍ය සේවා වැනි මූලික සේවාවන් හා යටිතල පහසුකම් සඳහා ඇති ප්‍රවේශයෙහි විෂමතාවන් රටෙහි පවතින ඉහළ ආදායම් අසමානතාවයට දායක වේ. අවදානම් සහගත තත්වයෙහි සිටින ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් දරිද්‍රතා රේඛාවට යන්තමින් ඉහළින් පොකුරු වී සිටින අතර, අහිතකර කම්පන තත්වයන් මැඩපැවැත්වීම සඳහා ප්‍රමාණවත් සමාජ ආරක්ෂණ යාන්ත්‍රණයක් නොමැති බැවින් ඔවුන් දරිද්‍රතාවයෙහි මට්ටමට ලිස්සා වැටීමේ ඉහළ අවදානමකට මුහුණ දෙන බව COVID-19 වසංගතය වැනි කම්පන මගින් අවධාරණය කරයි.

දරිද්‍රතාවය සහ අවදානම් සහගත භාවය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය "තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා ඒකාබද්ධව එක් තීරයක්, එක් මාවතක් ගොඩනැගීම සඳහා ජාතික ප්‍රතිපත්ති ශක්‍යතා ශක්තිමත් කිරීම" පිණිස එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුව සමග හවුල්කාරීත්වයෙන් යුතුව කටයුතු කළේය. එක් තීරයක් එක් මාවතක් වැඩසටහන යටතේ අන්තර්ජාතික සංවර්ධන සහයෝගීතාවයෙහි නියැළීමට දරනු ලබන ප්‍රයත්නයන්ට සහාය වීම සඳහා සම්බන්ධීකරණයෙන් යුතු ඒකාබද්ධ ප්‍රතිපත්ති ඇගයීම හා සම්පාදනය කිරීම සඳහා එක් තීරයක් එක් මාවතක් ඔස්සේ පිහිටි රටවල් සමූහයක් සඳහා ජාතික ධාරිතාවය ශක්තිමත් කිරීමට මෙම අධ්‍යයනය මගින් අරමුණු කෙරෙයි. මෙය තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම වේගවත් කිරීම සඳහා වේ. ශ්‍රී ලංකාවට අදාළව රට පිළිබඳ අධ්‍යයනය මෙහෙයවනු ලබන්නේ ගංගා තිලකරත්න විසිනි.

ප්‍රකාශන:

චතුර්ගා කරුණානායක (2020). "ශ්‍රී ලංකාවේ සුබෝපභෝගී මෝටර් රථ පරිභෝජනය පිටුපස ප්‍රකටව පෙනෙන සමාජ ජන විකාශන නිශ්චායක", ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සඟරාව, 7 (2), 87 - 113.

ඉදිරිපත් කිරීම් / සාකච්ඡා:

- කුරුඳුවත්ත රොටරි සමාජයේ සාමාජිකයින් සඳහා "කිසිවෙකු හැරදමා නොයෑම: පශ්චාත් COVID-19 සමයේ සමාජ හා ආර්ථික ප්‍රතිසාධනය" නැමති මාතෘකාව යටතේ පවත්වන ලද ඉදිරිපත් කිරීම, අගෝස්තු 13 (විමල් නනායක්කාර).
- ආසියා පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසමෙහි (UNESCAP) දකුණු සහ නිරිතදිග ආසියානු කාර්යාලය විසින් සංවිධානය කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ සිව් වැනි දකුණු ආසියා සංසදය: දකුණු ආසියාවේ COVID-19 වසංගතයෙන් තිරසාර සහ ප්‍රත්‍යාස්ථිත ලෙස ප්‍රතිසාධනය වීම ප්‍රවර්ධනය කිරීම වැඩසටහනෙහිදී "දකුණු ආසියාවේ තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම කඩිනම් කිරීම සඳහා ගෝලීය, කලාපීය සහ උප කලාපීය හවුල්කාරිත්වයන් සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රම උපයෝගී කර ගැනීම" පිළිබඳ වට මේස සාකච්ඡාව", නවදිල්ලිය, දෙසැම්බර් 3 (දුෂ්නි වීරකෝන්).
- තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ආයතනය විසින් සංවිධානය කරන ලද තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ආයතනයේ විසිතුන් වැනි තිරසාර සංවර්ධන සමුළුවේදී "දකුණු ආසියාවේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම කඩිනම් කිරීම සහ COVID-19 වසංගතයේ බලපෑමෙන් වඩා හොඳින් නැවත ගොඩනැගීම" පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව, ඉස්ලාමාබාද්, දෙසැම්බර් 15 (දුෂ්නි වීරකෝන්).

සමාජ ආරක්ෂණය

ගංගා තිලකරත්න සහ ලක්ෂිලා වනිගසිංහ මැනිලා නුවර පිහිටි ආසියානු සංවර්ධන බැංකුව සමග "දකුණු ආසියානු උපකලාපීය ආර්ථික සහයෝගීතා මෙහෙයුම් සැලැස්ම සඳහා කලාපීය ව්‍යාපෘති සංවර්ධන සහාය, 2016-2025" නැමති අධ්‍යයනයට සම්බන්ධ වී සිටිති. COVID-19 වසංගතයට එරෙහිව ශ්‍රී ලංකාවේ ඇති සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම සහ ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ලබා ගත හැකි, ශක්තිමත් පද්ධති සහිත සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග හඳුනා ගැනීම මෙම සහයෝගීතාවයෙහි ප්‍රධාන අරමුණ වේ. සමස්තයක් ලෙස, COVID-19 සක්‍රීය ප්‍රතිචාර සහ වියදම් ආධාරක වැඩසටහන සඳහා සූදානම් වීමේ අරමුණ ඇතිව සමාජ ආරක්ෂණයට අදාළ දත්ත සහ තොරතුරු රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම කෙරෙහි මෙම අධ්‍යයනය මගින් අවධානය යොමු කරයි.

ගංගා තිලකරත්න සහ ලක්ෂිලා වනිගසිංහ මැනිලා නුවර ආසියානු සංවර්ධන බැංකුව සමග එක්ව "තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම පිණිස සමාජ ආරක්ෂණය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගය වැඩි දියුණු කිරීම - සමාජ ආරක්ෂණය (ශ්‍රී ලංකාව)" පිළිබඳ විශ්ලේෂණයක් සිදු කරති. මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාව සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙහි සමාජ ආරක්ෂණ දර්ශකය යාවත්කාලීන කරනු ලැබේ. රටවල් මට්ටමෙන් සහ කලාපීය මට්ටමෙන් යන මට්ටම් දෙකෙන් ම ආසියා පැසිෆික් කලාපයේ සමාජ ආරක්ෂණ ආවරණ සහ වියදම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සඳහා මෙම සමාජ ආරක්ෂණ දර්ශකය සකස් කරන ලදී. මෙම සමාජ ආරක්ෂණ දර්ශකය මගින් වියදම, ආවරණය, ප්‍රතිලාභ මට්ටම්, ආබාධිතභාවය, දරිද්‍රතාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව මානයන් ඇතුළු සමාජ ආරක්ෂණ පද්ධතිවල විවිධ අංශ ග්‍රහණය කර ගනිමින් කලාපයේ සමාජ ආරක්ෂණ සංඛ්‍යාලේඛන පිළිබඳ අනන්‍ය මූලාශ්‍රයක් සපයා දෙයි.

එමෙන්ම, ගංගා තිලකරත්න "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020" වාර්තාව සඳහා "වසංගත සමයෙහිදී සමාජ ආරක්ෂණය උපයෝගී කර ගැනීම" යන පරිච්ඡේදය රචනා කළාය. මෙම විශ්ලේෂණය මගින් COVID-19 වසංගතය දිළිඳු ජනතාව සහ වැඩිහිටියන් වැනි අනෙකුත් අවදානම් සහගත කණ්ඩායම් කෙරෙහි ඇති කරන ගම්‍යමානයන් පිළිබඳව විමසා බැලෙන අතර, එවැනි තත්වයන් හා සම්බන්ධ අවදානම් මැඩපවත්වා ගැනීම සඳහා වර්තමානයේ තිබෙන පද්ධතිවල පෙර සූදානම සහ පවතින පද්ධති ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ පිළිබඳව සාකච්ඡා කරයි.

අන්තර්ජාතික කම්කරු සංවිධානය (ILO) සමග එක්ව නිශා අරුණතිලක, අශානි අබියසේකර සහ චතුර්ගා කරුණානායක විසින් සිදු කරනු ලබන "පශ්චාත් COVID-19 සමයේදී පෞද්ගලික අංශයේ රැකියා සමාජ ආරක්ෂණය නැවත ස්ථානගත කිරීම - ශ්‍රී ලංකාව පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්" යන මාතෘකාව යටතේ සිදු කරන ලද අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ හදිසි අර්බුදවලදී වඩාත් නම්‍යශීලී බව, රැකියා සහ ව්‍යවසාය ආරක්ෂාව සහ හදිසි සහන සපයා දිය හැකි සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වැනි දැනට පවතින සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා සිදු කළ හැකි ප්‍රායෝගික වෙනස් කිරීම් හඳුනා ගැනීමට අරමුණු කරයි.

ඉදිරිපත් කිරීම් / සාකච්ඡා:

- යුනිසෙෆ් සංවිධානය විසින් Development Pathways සහ Verite Research සමග එක්ව සංවිධානය කරන ලද 'ශ්‍රී ලංකාවේ අන්තර්කරණය වූ සමාජ ආරක්ෂණය: සුසමාදර්ශය මාරු කිරීම' නැමති මාතෘකාව යටතේ පැවති ඉහළ මට්ටමේ සම්මන්ත්‍රණ මාලාවක දී "COVID-19 සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිචාරය: ශ්‍රී ලංකාවේ සන්දර්භය" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී, නොවැම්බර් 18 (ගංගා තිලකරත්න).



කෘෂිකර්මාන්තය සහ කෘෂිව්‍යාපාර සංවර්ධනය



ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත අංශය අඩු ඵලදායිතාවය, අකාර්යක්ෂම සම්පත් භාවිතය සහ තිරසාර නොවන කෘෂිකාර්මික පිළිවෙත් වලින් පීඩාවට පත්වී තිබේ. අඩු ඵලදායිතාව, විචලනය වෙමින් පවතින භාණ්ඩ මිල සහ ඉහළ නිෂ්පාදන පිරිවැය හේතුවෙන් අපනයන අරමුණු කරගත් වැවිලි අංශය ද අර්බුදකාරී තත්වයකට මුහුණ දී ඇත. මේ සියල්ල රටේ ආහාර අනාරක්ෂිතතාව, මන්දපෝෂණය හා දරිද්‍රතාවයට දායක වේ. මෙම ගැටළු හඳුනා ගනිමින්, රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා උසස් තාක්ෂණික නවෝත්පාදන භාවිතා කිරීමට, දේශීයව නිෂ්පාදනය කරන ලද ධීවර හා කිරි නිෂ්පාදන ඇතුළත් ආරක්ෂිත හා පෝෂ්‍යදායී ආහාර සඳහා ප්‍රවේශය සහතික කිරීමට, සහ නව තාක්ෂණයන් තුළින් අගය එකතු කළ අපනයන වැඩි කිරීමට අපේක්ෂා කෙරෙයි.

කෘෂිව්‍යාපාර අගය දාම

එක්සත් රාජධානියේ KIVU ඉන්ටර්නැෂනල් සංවිධානයෙහි සහ එක්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් ආයතනයේ සහාය ඇතිව දිලණි හිරිමුතුගොඩගේ, නිමේෂා දිසානායක සහ මනෝජ් තිබ්බොටුවාව යන අයගෙන් සමන්විත අධ්‍යයන කණ්ඩායම විසින් "දුම්කොළ අගය දාමය හඳුනා ගැනීම" නැමති මාතෘකාව යටතේ අධ්‍යයනයක් සිදු කරනු ලැබේ. දුම්කොළ වගාව තහනම් කිරීමක් සිදු කළ හොත් එහි ජයග්‍රාහකයින් සහ පරාජිතයින් හඳුනා ගැනීම සඳහා දුම්කොළ සඳහා වන අගය දාමය සිතියම් ගත කිරීම මෙම අධ්‍යයනයෙහි අරමුණ වේ. මෙම අධ්‍යයනය මගින් දුම්කොළ අගය දාමය හඳුනාගෙන එම අගය දාමයෙහි ක්‍රියාකාරීන් සහ ස්ථර නිර්වචනය කරනු ලැබේ. තවද, දුම්කොළ ගොවීන් සඳහා විකල්ප බෝග විසඳුම් හඳුනා ගැනීමට ද මෙම අධ්‍යයනය මගින් අදහස් කෙරෙයි.

මැලේසියාවේ මලයා විශ්ව විද්‍යාලය සමග එක්ව මනෝජ් තිබ්බොටුවාව සහ නිමේෂා දිසානායක "විමර්ශන අධ්‍යයනය: ශ්‍රී ලංකාවේ දුම්කොළ පාලනය සහ සමාජ බලපෑම" නැමති අධ්‍යයනය සිදු කරති. ශ්‍රී ලංකාවේ දුම්කොළ අගය දාමයෙහි ඉල්ලුම හා සැපයුම් අංශ විශ්ලේෂණය කිරීම සහ දුම්කොළ භාවිතය, නිෂ්පාදනය සහ වෙළඳාමට අදාළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇගයීම මෙම විමර්ශන අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වේ.

ප්‍රකාශන:

- මනෝජ් තිබ්බොටුවාව, "ගිනිකොනදිග ආසියාවේ දුම්කොළ හානිය අවම කිරීමේ ප්‍රගතිය: විමර්ශන අධ්‍යයනයක් සහ තත්ව විශ්ලේෂණයක්" යන මාතෘකාව යටතේ රට පිළිබඳ අධ්‍යයනය - ශ්‍රී ලංකාව, බංග්ලාදේශයේ ඊස්ට් වෙස්ට් විශ්වවිද්‍යාලය, (ඉදිරියේදී එළිදක්වනු ලැබේ)

බ්ලොග් ලිපි:

- දුම්කොළ වගාව: COVID-19 මධ්‍යයේ ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවයට තර්ජනයක්, නිමේෂා දිසානායක, ටෝකිං ඉකොනොමික්ස්, ජූනි 22.
- COVID-19 (ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සඳහා අවදි කිරීමේ ඇමතුමක්, නිමේෂා දිසානායක, ටෝකිං ඉකොනොමික්ස්, නොවැම්බර් 9.

ආහාර සුරක්ෂිතතාවය

සදර්න් වොයිස් නෙට්වර්ක් සංවිධානයෙහි අරමුදල් සැපයීම යටතේ මනෝජ් තිබ්බොටුවාව විසින් මෙහෙයවනු ලබන අධ්‍යයන කණ්ඩායමක් විසින්

- "කුසගින්නෙහි නව මුහුණුවර: වසංගත යුගයක ප්‍රත්‍යාස්ථිත ආහාර පද්ධතියක් ගොඩනැගීම" නැමති විශ්ලේෂණය සිදු කරනු ලැබේ. COVID-19 වසංගතයෙහි කම්පනයෙන් කඩිනම් ප්‍රතිසාධනයක් අත්කර ගැනීම මගින් අවදානම් සහගත සහ ආන්තික කොටස්වල ආරක්ෂාව සහතික කරමින් ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාවය සහ ගෘහස්ථ ආදායම ප්‍රවර්ධනය කරන අතර ම, ශ්‍රී ලංකාවේ සහ නේපාලයේ වඩාත් තිරසාර, ප්‍රත්‍යාස්ථිත සහ අන්තර්කරණය වූ ආහාර පද්ධති ගොඩනැගීම අධ්‍යයනයේ සමස්ත අරමුණ

වේ. මෙම යෝජිත අධ්‍යයනය මගින් ජාතික හා කලාපීය වශයෙන් ආහාර සුරක්ෂිතතා අභියෝගය ජය ගැනීම සඳහා සම්බන්ධීකරණයෙන් යුතු ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාවය පෙන්නුම් කිරීමට අවශ්‍ය සාක්ෂි ජනනය කරනු ඇත.

"ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020" වාර්තාව සඳහා මනෝජ් තිබ්බොටුවාව "ආහාර පද්ධති වලට වසංගතයට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම" පිළිබඳ පරිච්ඡේදයක් සම්පාදනය කළේය. COVID-19 වසංගතය තුළ ශ්‍රී ලංකාවේ වර්තමාන කෘෂිකාර්මික හා ආහාර පද්ධතිය අනෙකුත් මධ්‍යම ආදායම් ලබන රටවල එම පද්ධති වලට සාපේක්ෂව කෙතරම් ප්‍රත්‍යාස්ථිත ද යන්න මෙම විශ්ලේෂණය මගින් විමසා බලන ලදී. මෙම විශ්ලේෂණය මගින් නිෂ්පාදනයේ සිට පරිභෝජනය දක්වා සමස්ත ආහාර නිෂ්පාදන පද්ධතිය කෙරෙහි ම අවධානය යොමු කරමින් මෙම ප්‍රශ්නයට ආමන්ත්‍රණය කරයි.

ඉදිරිපත් කිරීම් / සාකච්ඡා:

- ICLEI දකුණු ආසියාව, කොළඹ මහ නගර සභාව, එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ ලෝක බැංකුව ඒකාබද්ධව සංවිධානය කරන ලද "නාගරික ආහාර සුරක්ෂිතතාව" පිළිබඳ විද්වත් කමිටුව, රාමඩා හෝටලය, පෙබරවාරි 11 (මනෝජ් තිබ්බොටුවාව).
- ලෝක ආහාර වැඩසටහන විසින් සංවිධානය කරන ලද "ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ පර්යේෂණ සහ ඇගයීම්" පිළිබඳ අතථ්‍ය වටමේස සාකච්ඡාවකදී "ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ආහාර සුරක්ෂිතතා ප්‍රතිපත්ති පර්යේෂණ" පිළිබඳ ඉදිරිපත් කිරීම, මැයි 9 (මනෝජ් තිබ්බොටුවාව).
- කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදලෙහි, එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙහි සහ එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහනෙහි සහාය ඇතිව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සංවිධානය කළ "වසංගත යුගයේ ඔරොත්තු දෙන සහ තිරසාර ආහාර පද්ධති ගොඩනැගීම" පිළිබඳ අථත්‍ය සංවාදයට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සත්කාරකත්වය සපයන ලදී. දෙසැම්බර් 3.

බ්ලොග් ලිපි:

- කුසගින්නෙහි නව මුහුණුවර: වසංගත යුගයක ශ්‍රී ලංකාවේ ප්‍රත්‍යාස්ථිත ආහාර පද්ධතියක් ගොඩනැගීම, මනෝජ් තිබ්බොටුවාව, ටෝකිං ඉකොනොමික්ස්, මැයි 26.

කෘෂිකර්ම ප්‍රතිපත්ති සහ ආයතන

යුරෝපා සංගමයේ කෘෂිකාර්මික වැඩසටහන් නවීකරණය සඳහා තාක්ෂණික සහාය වැඩසටහනෙහි අරමුදල් සැපයීම යටතේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමග එක්ව මනෝජ් තිබ්බොටුවාව "ශ්‍රී ලංකාවේ පුළුල් කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම" පිළිබඳ අධ්‍යයනයකට දායක විය. මෙම පරිශ්‍රමයෙහි ප්‍රධාන අරමුණ වන මනා ක්‍රියාත්මක කිරීමක් සඳහා කෘෂිකාර්මික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ විධිමත් කිරීම හා එයට ප්‍රමුඛත්වය ලබා දීම කෘෂිකාර්මික ඵලදායිතාවය ඉහළ නැංවීම, ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සහ කෘෂිකර්මාන්තයේ නියැළි සේවකයින්ට යහපත් ජීවනෝපායන් සැපයීම වැනි රජයේ සමස්ත අරමුණු සපුරාලීම පිණිස වේ.

ඉදිරිපත් කිරීම් / සාකච්ඡා:

- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, හැව් සහ ශ්‍රී ලංකා මෘදුකාංග හා සේවා සමාගම් සංගමය ඒකාබද්ධව සංවිධානය කරන ලද "කෘෂිකාර්මික හා ආහාර කර්මාන්ත ක්ෂේත්‍රයෙහි කෘතිම බුද්ධියෙහි අනාගතය" පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව කොළඹ, ජනවාරි 24, (මනෝජ් තිබ්බොටුවාව).
- "තරුණියන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය අතහැර යමින් සිටින්නේද? ග්‍රාමීය කාන්තාවන්ගේ ජීවනෝපාය තේරීම් " පිළිබඳ ඉදිරිපත් කිරීම, රුහුණු විශ්වවිද්‍යාලය, පෙබරවාරි 14 (රුවන් සමරවීර).
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද "හතර වැනි කාර්මික විප්ලවය සහ ශ්‍රී ලංකාව" පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව, පෙබරවාරි 20 (මනෝජ් තිබ්බොටුවාව).
- බංග්ලාදේශයේ ඩකා නුවර පැවති "ගෝලීය අභියෝගතා පර්යේෂණ අරමුදල් සංසදය" වැඩසටහනෙහිදී එක්සත් රාජධානියේ පර්යේෂණ හා නවෝත්පාදන ආයතනය විසින් සංවිධානය කරන ලද "දකුණු ආසියානු ආහාර පද්ධතිවල දී ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි කාර්යභාරය" පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව, පෙබරවාරි 23 - 24 (මනෝජ් තිබ්බොටුවාව).
- කෘෂිකර්ම නවීකරණ වැඩසටහන, ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ කාන්තා පර්යේෂණ මධ්‍යස්ථානය (CENWOR) ඒකාබද්ධව සංවිධානය කරන ලද "ස්ත්‍රී පුරුෂ සමාජභාවය අන්තර්කරණය කිරීම හරහා කෘෂිකර්මාන්තයේ ඵලදායිතාවයට සහාය වීම" පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව, කොළඹ,



පරිසරය, ස්වාභාවික සම්පත් සහ දේශගුණික විපර්යාස



ගෝලීය දේශගුණික විපර්යාසයන්ගේ තර්ජනය මගින් වර්ධනය අඩු කාබන් හා දේශගුණික ප්‍රත්‍යාස්ථිත විය යුතුය යන අමතර කොන්දේසි පනවා ඇත. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුව 'තිරසාර පාරිසරික කළමනාකරණය' ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර 10 න් එකක් ලෙස හඳුනාගෙන තිබේ. ඊට අමතරව එය විදුලිය හා බලශක්තිය, ජලය, ආපදා කළමනාකරණය සහ අලි-මිනිස් ගැටුම යන අංශවල ප්‍රතිපත්ති මැදිහත්වීම් ගණනාවක් ද යෝජනා කරයි. පරිසරය හා ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීමෙහි ඇති අතිශය වැදගත්කම මෙම රාමුව මගින් අවධාරණය කරයි.

පරිසර සහ ස්වාභාවික සම්පත් ප්‍රතිපත්ති

එක්සත් රාජධානියේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර ආයතනය සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය "ශ්‍රී ලංකාවේ අලින්ගේ හානිවලින් ජීවනෝපාය රක්ෂණය" පිළිබඳ අධ්‍යයනයක් සිදු කරයි. අලි-මිනිස් ගැටුම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වාර්ෂිකව මිනිසුන්ගේ හා අලින්ගේ ජීවිත සැලකිය යුතු සංඛ්‍යාවක් අහිම වන බව සංඛ්‍යාලේඛන වාර්තා පෙන්වා දෙයි. වාර්තා වී ඇති බෝග හානි, දේපළ හානි සහ මිනිස් හා අලි මරණ සංඛ්‍යාව සෑම වසරකම ඉහළ යමින් පවතී. අතුල සේනරත්න සහ රුවන් සමරවීර විසින් සිදු කරනු ලබන මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ මිනිස්-වනජීවී ගැටුම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වාණිජමය වශයෙන් ක්‍රියාත්මක වන රක්ෂණ යෝජනාක්‍රමයක් සකස් කිරීමේ හැකියාව විමසා බැලෙයි. රක්ෂණ නිෂ්පාදනයක් සැලසුම් කිරීමට සහ එය ක්ෂේත්‍රය තුළ නියමු පරීක්ෂාවකට කිරීම එහි අරමුණයි.

දේශගුණ විපර්යාස

පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශයෙහි අරමුදල් සැපයීම මත අතුල සේනරත්නගේ නායකත්වයෙන් යුත් පර්යේෂණ කණ්ඩායමක් විසින් සිදු කරනු ලබන "දේශගුණික විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරී සහාය වැඩසටහන" පිළිබඳ අධ්‍යයනයක් මගින් මිනුම් කිරීම, වාර්තා කිරීම සහ සත්‍යාපනය (MRV), ශ්‍රී ලංකා කාබන් රෙජිස්ට්‍රි සහ ශ්‍රී ලංකා කාබන් සම්මාන යෝජනා ක්‍රමය සඳහා ප්‍රශස්ත ප්‍රතිපත්ති පැකේජයක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන සමස්ත ප්‍රතිපත්ති අනුකූලතාවය සහ නිර්දේශ ඇගයීම අරමුණු කර ඇත. දේශගුණික විපර්යාස අවම කිරීම සම්බන්ධයෙන් පවතින ප්‍රතිපත්ති ඇගයීම, ඒවා ශක්තිමත් කිරීම සඳහා වන අවශ්‍යතා හඳුනා ගැනීම, නව රෙගුලාසි සහ/හෝ ප්‍රතිපත්ති නිර්දේශ කිරීම, දේශගුණය සම්බන්ධ සමස්ත ප්‍රතිපත්ති සම්මිශ්‍රණයෙහි සහසම්බන්ධය අවබෝධ කර ගැනීම සඳහා නව සහ පවත්නා ක්‍රියාමාර්ග අතර අන්තර්ක්‍රියා ඇගයීම, සහ ප්‍රශස්ත ප්‍රතිපත්ති නිර්දේශ සපයා දීම මෙහි සමස්ත අරමුණ වේ.

ඉදිරිපත් කිරීම්/සාකච්ඡා:

- "කෘෂිකර්මාන්තය හා පරිසරය පිළිබඳ රුහුණු විශ්වවිද්‍යාලීය සම්මන්ත්‍රණය" අවස්ථාවේදී "කෘෂිකර්ම ආර්ථික විද්‍යාව" පිළිබඳ සැසියේ ද්වත් මණ්ඩල සාමාජිකයෙක් ලෙස කටයුතු කිරීම, පෙබරවාරි 14 (අතුල සේනාරත්න).
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද "4 වැනි කාර්මික විප්ලවය සහ ශ්‍රී ලංකාව" නැමති සැසියේ විද්වත් මණ්ඩල සාමාජිකයෙක් ලෙස කටයුතු කිරීම, පෙබරවාරි 20 (අතුල සේනාරත්න)
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද "මිනුම් කිරීම, වාර්තා කිරීම සහ සත්‍යාපනය (MRV), ශ්‍රී ලංකා කාබන් රෙජිස්ට්‍රි සහ ශ්‍රී ලංකා කාබන් සම්මාන යෝජනා ක්‍රමය සඳහා ප්‍රශස්ත ප්‍රතිපත්ති පැකේජයක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන සමස්ත ප්‍රතිපත්ති අනුකූලතාවය සහ නිර්දේශ ඇගයීම", කොළඹ, සැප්තැම්බර් 24 (අතුල සේනාරත්න)
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය



විසින් සංවිධානය කරන ලද දේශගුණික විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරී සහාය ව්‍යාපෘතියේ දෙවැනි පාර්ශවකරුවන්ගේ වැඩමුළුවේදී "කෘෂිකර්මාන්ත, වන විද්‍යා හා ඉඩම් පරිහරණ අංශයේ මිනුම් කිරීම, වාර්තා කිරීම සහ සත්‍යාපනය (MRV), ශ්‍රී ලංකා කාබන් රෙජිස්ට්‍රි සහ ශ්‍රී ලංකා කාබන් සම්මාන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රතිපත්ති අඩුපාඩු සහ අනුකූලතා විශ්ලේෂණය" පිළිබඳ ඉදිරිපත් කිරීම. ඔක්තෝබර් 21 (මනෝජ් තිබ්බොටුවාව).

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද දේශගුණික විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරී සහාය ව්‍යාපෘතියේ තුන්වැනි පාර්ශවකරුවන්ගේ වැඩමුළුවේදී "කෘෂිකර්මාන්ත, වන විද්‍යා හා ඉඩම් පරිහරණ අංශයේ මිනුම් කිරීම, වාර්තා කිරීම සහ සත්‍යාපනය (MRV), ශ්‍රී ලංකා කාබන් රෙජිස්ට්‍රි සහ ශ්‍රී ලංකා කාබන් සම්මාන යෝජනා ක්‍රමයෙහි අඩුපාඩු සම්පූර්ණ කිරීමේ ක්‍රියාමාර්ග සහ ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණ" පිළිබඳ ඉදිරිපත් කිරීම, නොවැම්බර් 19 (මනෝජ් තිබ්බොටුවාව).
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද දේශගුණික විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරී සහාය ව්‍යාපෘතියේ හතර වැනි පාර්ශවකරුවන්ගේ වැඩමුළුවේදී "කෘෂිකර්මාන්ත, වන විද්‍යා හා ඉඩම් පරිහරණ අංශයේ මිනුම් කිරීම, වාර්තා කිරීම සහ සත්‍යාපනය (MRV), ශ්‍රී ලංකා කාබන් රෙජිස්ට්‍රි සහ ශ්‍රී ලංකා කාබන් සම්මාන යෝජනා ක්‍රමය සඳහා ප්‍රශස්ත ප්‍රතිපත්ති පැකේජය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන මාර්ග සිතියම" පිළිබඳ ඉදිරිපත් කිරීම දෙසැම්බර් 6 (මනෝජ් තිබ්බොටුවාව).

බ්ලොග් ලිපි:

- කාලගුණික විපත්: පෙරසූදානම්ව සිටීම බුද්ධිමත් ක්‍රියාවක් වන්නේ ඇයි?, නිශා අරුණතිලක, ටෝකිං ඉකොනොමික්ස්, ඔක්තෝබර් 5.

පර්යේෂණ කණ්ඩායම් නායකයින්



දුෂ්නි වීරකෝන්
BSc (ක්වීන්ස් විශ්ව විද්‍යාලය බෙල්ෆාස්ට් හි)
MA PhD (මැන්චෙස්ටර්)



නිශා අරුණතිලක
පර්යේෂණ අධ්‍යක්ෂ
BSc (ඇමරිකා එක්සත් ජනපදය දකුණු විශ්වවිද්‍යාලය), MA, PhD (ඩ්‍යූක්)



අතුල සේනාරත්න
පර්යේෂණ සාමාජික
BSc, MPhil (පේරාදෙණිය)
PhD (ඕකින්)



ගංගා තිලකරත්න
පර්යේෂණ සාමාජික
BA (මැන්චෙස්ටර්), MPhil (Cantab), PhD (මැන්චෙස්ටර්)



බිලේෂා වීරරත්න
පර්යේෂණ සාමාජික
BA (කොළඹ), MA (රුට්ගර්ස්), PhD (CUNY)



මනෝජ් තිබ්බෙ ගටුවාව
පර්යේෂණ සාමාජික
BSc (පේරාදෙණිය), MSc (පේරාදෙණිය), PhD (බටහිර ඔස්ට්‍රේලියාව)

පර්යේෂණ කාර්ය මණ්ඩලය



ප්‍රියංකා ජයවර්ධන
BSc (කොළඹ),
MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථික විද්‍යාඥ



සුනිමලී මදුරාවල
BA (කොළඹ),
MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථික විද්‍යාඥ



දිලණි හිරිමුතුගොඩගේ
BA (කොළඹ),
MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථික විද්‍යාඥ



කිත්මිණ හේවගේ
BA (ජෝන්ස් හොප්කින්ස්),
MSc (UCL)
පර්යේෂණ ආර්ථික විද්‍යාඥ



අශානි අබයසේකර
BA (පේරාදෙණිය), MA (ANU)
පර්යේෂණ ආර්ථික විද්‍යාඥ



හරිනි වීරසේකර
BSc (UOLIP), BA (කො
පර්යේෂණ නිලධාරී



චතුර්ගා කරුණානායක
BA (කොළඹ)
පර්යේෂණ සහකාර



නිමේෂා දිසානායක
BSc (පේරාදෙණිය)
පර්යේෂණ සහකාර



රුවන් සමරවීර
BSc (ශ්‍රී වෙල්ලස්ස)
පර්යේෂණ සහකාර



චාමිනී තිලංකා
BA, MA (පේරාදෙණිය)
පර්යේෂණ සහකාර



ලක්ෂිලා වනිගසිංහ
BA (SIUC), MSc (SIUC)
පර්යේෂණ සහකාර



තිසලි ද සිල්වා
BA (කොළඹ)
පර්යේෂණ සහකාර



තරිඳු උදයංග
BA (කැලණිය)
පර්යේෂණ සහකාර



විමල් නානායක්කාර
BSc (පේරාදෙණිය)
ජ්‍යෙෂ්ඨ බාහිර සාමාජික

සහාය කාර්ය මණ්ඩලය



ගයනි කල්දේරා
අධ්‍යක්ෂ
(මූල්‍ය සහ පරිපාලන)
ACA, BSc (ජයවර්ධනපුර)



නන්දක පොතුහෙවා
තොරතුරු පද්ධති ප්‍රධානී
BSc (කැලණිය)



අයේෂා සුහායිර්
පර්යේෂණ සන්නිවේදන
අංශ ප්‍රධාන
BBus (ECU), MSc (UCL)



දිලිනි ගල්කැටිය
මානව සම්පත් හා
පරිපාලන නිලධාරී



චමාලි රාජපක්ෂ
ගණකාධිකාරී



නාලක ලියනපතිරණ
වෙබ් කළමනාකරු සහ පද්ධති
පරිපාලක



විශාකා නර්මදා
සහකාර
පුස්තකාලයාධිපති



තුවාන් බංග්සාජයා
පහසුකම් කළමනාකරණ
නිලධාරී



ගයේන්ද්‍රි කරුණාරත්න
සංස්කාරක



නිල්මිනි ද අල්විස්
රහස්‍ය ලේකම්



අමේෂ් තෙන්නකෝන්
ප්‍රකාශන නිලධාරී



නතාෂා හිඳුරංගල
ව්‍යාපෘති සම්බන්ධීකාරක



නයෝමි ජයකොඩි
ලේකම්



ධරිණ්‍යා ගනේෂරාජා
සන්නිවේදන නිලධාරී



මධුෂා හෙට්ටිආරච්චි
මූල්‍ය / පරිපාලන සහකාර



බර්නාඩෙට් ප්‍රබාලෝගිනි
පිළිගැනීමේ නිලධාරී



රියදුරු/කාර්යාල සහායක
ජී ආර් වික්‍රමසේන මහතා



රියදුරු/කාර්යාල සහායක
එච් එස් උදයකාන්ත මහතා



රියදුරු/කාර්යාල සහායක
නිහාල් වසන්ත මහතා



රියදුරු/කාර්යාල සහායක
පී යූ කේ රාජසිරි මහතා



කාර්යාල සහායක
එස් පී ගාමිණී මහතා

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සහායක සේවා

මූල්‍ය හා පරිපාලනය

මූල්‍ය, පරිපාලන, මානව සම්පත්, නඩත්තු, මෙහෙයුම්, ප්‍රවාහන හා ප්‍රසම්පාදන සේවා සැපයීම මගින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සහ සහාය සපයා දීම සඳහා මූල්‍ය හා පරිපාලන ඒකකය පිහිටුවා ඇත.
සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය කාර්යසාධනය රුපියල් මිලියන 29.0 ක අතිරික්තයක් වාර්තා කර ඇත. රු. මි. 184.0 ක් වූ මුළු ආදායම පහත සඳහන් ආදායම් වලින් සමන්විත වේ: ව්‍යාපෘති ආදායම (39%), ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ආයෝජන භාර අරමුදලෙන් එකතු වූ මුදල් (23%), පොළී ආදායම (21%), රජයේ ප්‍රදාන (16%), සහ වෙනත් විවිධ ආදායම් (1%). වත්කම් එකතු කිරීම්වලට රු.මි. 2.48 ක් වටිනා පරිගණක දෘඩාංග සහ මෘදුකාංග ද ඇතුළත් වේ. 2020 වර්ෂයේ දී පර්යේෂකයින් පස්දෙනෙක් සහ සහායක කාර්ය මණ්ඩල සාමාජිකයින් හතර දෙනෙක් ආයතනයෙන් සමුගත් අතර නව කාර්ය මණ්ඩල සාමාජිකයින් නවදෙනෙකු ආයතනයට බඳවා ගන්නා ලදී.



සන්නිවේදන සහ ජනවිහිදුම්කරණය

සන්නිවේදන මාර්ග ඵලදායී ලෙස භාවිතා කිරීම තුළින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ව්‍යාප්ත කිරීම සහ ජනවිහිදුම්කරණය පුළුල් කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණු වලින් එකක් වන අතර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සන්නිවේදන හා ප්‍රකාශන ඒකකය විසින් එය මෙහෙයවනු ලැබේ. ප්‍රකාශන, ප්‍රතිපත්ති සංක්ෂිප්ත, මුද්‍රිත, විද්‍යුත් හා විකාශන මාධ්‍ය, ඩිජිටල් හා සමාජ මාධ්‍ය, සහ වැඩසටහන් හා සංවාද වැනි විවිධ මාධ්‍යයන් හරහා දේශීය හා අන්තර්ජාතික පාර්ශ්වකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සාමාන්‍ය ජනතාව වෙත ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි බහුමාන පර්යේෂණ ක්‍රියාකාරකම් බෙදා හැරීම මෙයට ඇතුළත් වේ. තවද, මාධ්‍ය නිවේදන, බ්ලොග් ලිපි සහ ජනමාධ්‍ය වල සම්මුඛ සාකච්ඡා ආදී ස්වරූප වලින් ද ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේණ සහ ප්‍රවෘත්ති මහජනතාව වෙත ප්‍රචාරණය කරනු ලැබේ.

විශේෂ අවස්ථා කිහිපයක් ලෙස, ආයතනය 2020 වර්ෂයේදී ප්‍රකාශන පහක් එළිදක්වන ලද අතර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ප්‍රධානතම වාර්ෂික වාර්තාව වන 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020' වාර්තාව ද ඒ අතර විය. 2020 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් 'ටෝකිං ඉකොනොමික්ස්' සඳහා බ්ලොග් ලිපි 44 ක් සම්පාදනය කරන ලද අතර ඒවා පුළුල්ව කියවනු ලබන පුවත්පත් සහ මාර්ගගත පුවත්පත් ද ඇතුළු දේශීය මාධ්‍ය නාලිකා වල නැවත ඵල කිරීම සහ ලිපි 23 ක් ගෝලීය වේදිකාවල බෙදා ගැනීම ද සිදු කරන ලදී. ආයතනයෙහි පර්යේෂණ ප්‍රචාරණය කිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති විවාදවලට දායක වීම සඳහා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය සමඟ සම්මුඛ සාකච්ඡා 10 ක් ද සංවිධානය කරන ලදී.

එමෙන්ම, ආයතනයේ ෆේස්බුක්, ට්විටර්, ලින්ක්ඩ්ඉන් සහ යූ ටියුබ් පිටු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම මගින් 2020 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සමාජ මාධ්‍යවල පෙනී සිටීම ද සැලකිය යුතු ලෙස වර්ධනය විය. වැඩසටහන් සහ සංසද අතරතුර සජීවී යාවත්කාලීන කිරීම් පළ කිරීම සඳහා ට්විටර් වේදිකාව භාවිතා කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ට්විටර් ඔස්සේ විශේෂයෙන් ක්‍රියාකාරී විය. එමෙන්ම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ස්වකීය පර්යේෂණ කාර්ය මණ්ඩලයෙහි සහභාගිත්වයෙන් ජාතික අයවැය පිළිබඳ ට්විටර් සංවාදයක් ද පවත්වන ලදී.

ශ්‍රී ලංකාව COVID-19 වසංගතයෙහි බලපෑමට ලක්වූ අවස්ථාවේ සිට, 2020 වර්ෂයේ දී ආයතනයේ පර්යේෂණ හා ප්‍රචාරණය මගින් අවධානය යොමු කළ වැදගත්ම මාතෘකා වලින් එකක් වූයේ COVID-19 වසංගතයෙන් රට වඩා හොඳින් නැවත ගොඩනැගිය හැක්කේ කෙසේද යන්නයි. 2020 වර්ෂයේදී පවත්වන ලද විශේෂතම අවස්ථාවක් වූයේ, දැනට පවතින වසංගතය හේතුවෙන් අතථ්‍ය ලෙස පැවැත්වූ 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2020' පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විද්වත් මණ්ඩල සාකච්ඡාව යි. තවද, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් මාර්ගගත වැඩමුළු හතරක්, එක් අතථ්‍ය සංවාදයක් සහ වාර්තා දියත් කිරීම් දෙකක් සංවිධානය කරන ලදී. 2020 වර්ෂයේ දී ඇතිවූ පෙර නොවූ විරූ තත්වයන් හමුවේ මුහුණු දීමට සිදුවූ සැලකිය යුතු පසුබෑම් මධ්‍යයෙහි වුවද විවිධ පාර්ශවකරුවන් පුළුල් පරාසයක් වෙත ළඟා වීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සමත් වී ඇති අතර අනාගතයේ දී මෙම ප්‍රතිඵල තවත් වැඩිදියුණු කර ගැනීමට ආයතනය අපේක්ෂා කරයි.

පුස්තකාලය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පුස්තකාලය එහි පර්යේෂණ කාර්ය මණ්ඩලයට සහ සහායක කාර්ය මණ්ඩලයට තොරතුරු සම්පත් සපයා දෙනවා පමණක් නොව බාහිර පරිශීලකයින්ට ද සේවා සපයා දෙයි. එය අඛණ්ඩව ම JSTOR ඇතුළු දත්ත සංචිත සහ විද්‍යුත් පත්‍රිකා කිහිපයකට ප්‍රවේශය සපයා දෙයි. වසංගතය ආරම්භයේ සිටම පරිශීලකයින්ට මාර්ගගත පුස්තකාල සේවා විශේෂයෙන් ම උපකාරී විය.

එමෙන් ම පුස්තකාලය කාලීන සිදුවීම් පිළිබඳව සිය පරිශීලකයින් යාවත්කාලීන කර තබා ගනියි. තවද, පුස්තකාලය ආයතනයෙහි කාර්ය මණ්ඩලයට පුස්තකාලයේ අන්තරජාලය, OPAC සහ ඉලෙක්ට්‍රොනික දත්ත සංචිත පිළිබඳ හුරු කරවීම සඳහා දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම්වල නිරත වේ. එය අන්තර්-පුස්තකාල ණය (ILL) සහ ලේඛන භාරදීමේ ඉල්ලීම් විශාල සංඛ්‍යාවක් ඉටු කර දීමට ද කටයුතු කර ඇත. 2019 වර්ෂයේ දී පුස්තකාලය ලේඛන කළමනාකරණ පද්ධතියක් සාර්ථකව හඳුන්වා දුන්නේය. ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන අවසන් වන තෙක් තාවකාලික පදනමින් පුස්තකාල උපදේශකවරයෙකු සහ පුස්තකාල පුහුණු අභ්‍යාසලාභියෙකු ද යොදවා ගෙන ඇත.

ඩිජිටල් සම්පත් මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීම සඳහා පුස්තකාලය ප්‍රතිව්‍යුහගත කිරීම 2020 වර්ෂයේ ප්‍රධානතම අවධානය යොමු වූ කරුණ විය. පුස්තකාල සේවා ප්‍රතිව්‍යුහගත කිරීම 2021 වර්ෂයේ ද ප්‍රමුඛත් කාර්යයක් ලෙස අඛණ්ඩව පවතී. කාර්ය මණ්ඩල ක්‍රියාකාරකම් මගින් පුස්තකාල ක්‍රියාකාරකම් හා සේවා විධිමත් කිරීම සඳහා කාර්ය පටිපාටි හඳුන්වා දීම සහ මධ්‍ය කාලීන වශයෙන් පුස්තකාල ඩිජිටල්කරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

තොරතුරු පද්ධති

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ තොරතුරු පද්ධති අංශය විසින් මෘදුකාංග, සන්නිවේදනය, දෘඩාංග, ජාලකරණය සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය, වෙබ් අඩවි සකස් කිරීම, තොරතුරු බෙදා හැරීම සහ දත්ත සංචිත සකස් කිරීම වැනි ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම මගින් කලාපීය විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් ලෙස තරඟකාරීව සිටීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට සහාය දෙයි.
2021 වර්ෂය ආරම්භයත් සමග අති නවීනතම තාක්ෂණය ස්ථාපනය කිරීම සඳහා දැනට පවතින දත්ත මධ්‍යස්ථානය සහ ජාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සැලසුම් කරයි. Aster ජාල ආරක්ෂාව යටතේ පහසුවෙන් භාවිතා කරමින් ඕනෑම ස්ථානයක සිට පරිශීලකයින්ට ප්‍රවේශය ලබා ගත හැකි මාර්ගගත පද්ධතියක් අත්පත් කර ගැනීම මගින් මෙය සිදු කරනු ලැබේ.

ප්‍රකාශන - 2020



ශ්‍රී ලංකාවේ මන්දපෝෂණයට එරෙහිව සටන් කිරීමේ මාවතක්



හෙද නිවාසවල සහ සුපිරි වෙළඳසැල්වල කාන්තාවන්, වැඩ සහ රාත්‍රී වැඩ මුර



ශ්‍රී ලංකා ආර්ථිකය 2020



ශ්‍රී ලංකාවේ සිගරට් සඳහා ප්‍රත්‍යාස්ථතා ඇස්තමේන්තු



ශ්‍රී ලංකාවේ දුම්කොළ දුම්පානය: අවසාන සැතපුම් දුම් පානය කරන්නන් හඳුනා ගැනීම සහ අවබෝධ කර ගැනීම

අභ්‍යන්තර සම්මන්ත්‍රණ



"ශ්‍රී ලංකාවේ අලි-මිනිස් ගැටුම", පෝල් සටිල්, ප්‍රධාන ආර්ථික විද්‍යාඥ, IIED සහ මිලන්ති සරුක්කලී, ප්‍රධාන විධායක නිලධාරී (Spark Actuarial) Risk Consultants, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, ජනවාරි 28



"රථවාහන තදබදය කළමනාකරණය කිරීම තුළින් ප්‍රවාහනයේදී සිදුවන හරිතාගාර වායු විමෝචනය අවම කිරීම" කනිෂ්ක වේරවැල්ල, ව්‍යාපෘති සීමාවාසී අභ්‍යාසලාභී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාව, පෙබරවාරි 27.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සීමාවාසික පුහුණු වැඩසටහන 2020

නම	තනතුර	විශ්වවිද්‍යාලය
රවීෂ වෙල්ලප්පුලි	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	මොනෑෂ් විශ්ව විද්‍යාලය, මෙල්බර්න්, ඔස්ට්‍රේලියාව
සුලෝචන සෙනෙවිරත්න	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
දුල්ෂානි සූරියාරච්චි	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	නොටිංග්හැම් විශ්ව විද්‍යාලය, මැලේසියාව
කාංචනා ගීත් සමරවීර	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
කිමුතු විල්මා කිරින්ගොඩ	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
අන්ජනා සන්දීපනී	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
පියුමි රසාංගි	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
අමන්දා වැනහොෆ්	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
අමන්දා බාලසූරිය	ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී	වයඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන
2020 දෙසැම්බර් 31

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන්	**2020** රු.	2019 රු.
ආදායම්			
ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ප්‍රදාන	**2**	30,214,000	16,500,000
ආයෝජන හාර අරමුදලෙන් ලැබුණු දායකත්වය	**22**	41,641,019	54,482,615
ව්‍යාපෘති ආදායම	**3**	72,188,166	42,275,808
අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයෙන් ලැබුණු ආදායම, ටී.ටී.අයි. ප්‍රදාන	**4**	-	5,601,648
සම්මන්ත්‍රණ/වැඩමුළු වලින් ලැබුණු ආදායම	**5**	-	16,883,382
පොළී ආදායම		37,753,890	41,351,451
ශ්‍රවණාගාරය කුලියට දීමෙන් ලැබුණු ආදායම		90,000	1,499,982
විවිධ ආදායම්	**6**	621,987	854,726
බැහැර කිරීම් මත ලැබුණු ලාභය	**16**	1,650,000	45,000
මුළු ආදායම		**184,159,062**	179,494,612
වියදම්			
සේවක පිරිවැය	**7**	70,322,900	64,676,003
පර්යේෂණ පිරිවැය	**8**	26,343,953	19,326,676
සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිරිවැය		-	9,019,365
උපයෝගිතා වියදම්		16,286,697	16,345,495
ගමන් වියදම්		33,822	233,807
වෙනත් මෙහෙයුම් වියදම්	**9**	13,274,925	19,331,168
ශ්‍රවණාගාරය කුලියට දීම		4,763	484,872
විනිමය පාඩු		269,624	402,619
මුළු වියදම		**126,536,684**	**129,820,005**
වර්ෂය සඳහා ජංගම අතිරික්තය		**57,622,378**	49,674,607
දේපළ, පිරියත සහ උපකරණ මත අගය ක්ෂය වීම	**16**	17,430,593	18,871,092
වර්ෂය සඳහා අගය ක්ෂය කිරීමෙන් පසු අතිරික්තය		**40,191,785**	**30,803,515**
ආදායම් බදු වියදම්	**10**	11,115,287	795,869
බදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා අතිරික්තය		**29,076,498**	**30,007,646**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනට	සටහන්	**2020** රු.	2019 රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන දෑ	**11**	36,055,585	191,659,007
ආයෝජන	**12**	420,781,441	104,036,945
ලැබිය යුතු වෙළඳ	**13**	19,157,068	4,607,344
තොග - ප්‍රකාශන		1,514,516	1,498,602
තැන්පතු සහ පූර්ව ගෙවීම්	**14**	5,683,123	10,015,027
ලැබිය යුතු පොළී		5,196,782	5,776,944
වෙනත් ලැබිය යුතු දෑ	**15**	15,930,937	21,515,860
මුළු ජංගම වත්කම්		**504,319,452**	339,109,729
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	**16**	445,810,723	453,072,460
දීර්ඝ කාලීන ආයෝජන	**12**	68,132,786	171,475,788
තැන්පතු සහ පූර්ව ගෙවීම්	**14**	-	2,433,456
මුළු ජංගම නොවන වත්කම්		**513,943,509**	626,981,704
මුළු වත්කම්		**1,018,262,961**	966,091,433
වගකීම්			
ජංගම වගකීම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු	**17**	17,169,606	6,709,020
ව්‍යාපෘති මත අත්තිකාරම් ලැබීම්	**18**	25,986,235	17,926,007
මුළු ජංගම වගකීම්		**43,155,841**	24,635,027
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	**19**	21,716,143	17,236,511
කාර්ය මණ්ඩල සුභසාධන අරමුදල		2,970,501	2,875,917
මුළු ජංගම නොවන වගකීම්		**24,686,644**	20,112,428
මුළු වගකීම්		**67,842,485**	44,747,455
ශුද්ධ වත්කම්		**950,420,476**	921,343,978
හිමිකම්			
සමුච්චිත අතිරික්තය		**950,420,476**	921,343,978

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කර ඇත.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරී

.....
විධායක අධ්‍යක්ෂ

.....
සභාපති

.....
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

.....
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

මෙහි 5 වැනි පිටුවේ සිට 8 වැනි පිටුව දක්වා වන පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 9 වැනි පිටුවේ සිට 16 වැනි පිටුව දක්වා වන පිටුවල ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම දරයි.

.....
කොළඹදී ය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සමුච්චිත අතිරික්තය
	රු.
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	891,336,332
වර්ෂය සඳහා ආදායම් අතිරික්තය	30,007,646
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	921,343,978
වර්ෂය සඳහා ආදායම් අතිරික්තය	29,076,498
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**950,420,476**

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		**2020**	2019
		රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ගලනය	**සටහන්**		
බදු ගෙවීමෙන් පසු අතිරික්තය/(ඌනතාවය)		**29,076,498**	**30,007,646**
ගැළපීම්			
සේවක සුභසාධක අරමුදලෙහි මාරු කිරීම්		94,584	251,542
දේපළ, පිරියත හා උපකරණ මත අගය ක්ෂයවීම්	**16**	17,430,593	18,871,092
පාරිතෝෂික ප්‍රාතිපාදන / (ප්‍රතිවර්තන)	**19**	6,525,530	3,563,963
පොළී ආදායම		(37,753,890)	(41,351,451)
බොල් ණය සඳහා ප්‍රතිපාදන අඩුවීම		(167,567)	(115,787)
වත්කම් අලෙවි කිරීම/ කපා හැරීම මත (ලාභය) /අලාභය		(1,650,000)	(45,000)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර ශුද්ධ මුදල් ගලා ඒම/ (ගලා යාම)		**13,555,748**	**11,182,005**
ලැබිය යුතු වෙළඳ (වැඩිවීම)/අඩුවීම		(14,382,157)	5,339,712
තොග (වැඩිවීම)/අඩුවීම		(15,914)	(318,995)
Sතැන්පතු සහ ගෙවීම් (වැඩිවීම)/අඩුවීම		6,765,360	4,361,869
ලැබිය යුතු වැට් සහ ජා.ගො.බ. (වැඩිවීම)/අඩුවීම		-	-
වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම		5,584,923	35,674,466
අත්තිකාරම් ලැබීම් (වැඩිවීම)/අඩුවීම		8,060,228	5,833,489
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම		10,460,586	462,787
මෙහෙයුම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ගලා ඒම / (ගලා යාම)		**30,028,774**	**62,535,333**
පාරිතෝෂික ගෙවීම්	**19**	(2,045,898)	(189,119)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ගලා ඒම / (ගලා යාම)		**27,982,876**	**62,346,214**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් සිදුවූ මුදල් ගලනය			
දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	**16**	(10,168,855)	(13,493,115)
ලැබුණු පොළිය		42,209,276	37,649,784
බැහැර කළ දේපළ, පිරියත සහ උපකරණ අලෙවියෙන් ලැබුණු මුදල		1,650,000	45,000
ආයෝජන මිලදී ගැනීම		(306,744,497)	(131,904,759)
ආයෝජන විකිණීමෙන් ලැබුණු මුදල්		244,391,027	45,912,169
ආයෝජන ක්‍රියාකාරකම් වලින් සිදුවූ ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම)		**(28,663,049)**	**(61,790,921)**
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් සිදුවූ මුදල් ගලනය		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් සිදුවූ ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම)		**-**	**-**
මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ (අඩුවීම) / වැඩිවීම		(680,173)	555,293
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ (සටහන 11)		3,341,619	2,786,325
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ		**2,661,446**	**3,341,619**
(අ) මුදල් සහ මුදල් හා සමාන දෑ සැසඳුම			
බැංකුවේ ඇති මුදල්		2,571,446	3,251,619
අත ඇති මුදල්		90,000	90,000
		2,661,446	**3,341,619**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

1. පිහිටි ස්ථානය සහ නෛතික ස්වරූපය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 1988 අංක 53 දරණ පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවා ඇති අතර 1990 අප්‍රේල් මාසයේ නිකුත් කරන ලද ගැසට් නිවේදනය මගින් එය නීත්‍යානුකූල ආයතනයක් ලෙස විධිමත්ව ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යනයන ආයතනයෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන සේවා සැපයුම් ස්ථානය අංක 100/22, නිදහස් මාවත, කොළඹ 07, ශ්‍රීං ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.1 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

ප්‍රතිපත්ති දිශානත කරගත් ආර්ථික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ මධ්‍ය කාලීන ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

1.2 සකස් කිරීමේ පදනම

1.2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී. ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මුදල් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සහ මුදල් අමාත්‍යංශය ඒකාබද්ධව ප්‍රකාශයට පත් කර ඇති රාජ්‍ය අංශයේ ආයතන සඳහා වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රාකාශන සකස් කර ඇත.

1.2.2 මිනුම් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස ඓතිහාසික පිරිවැය පදනමෙන් සකස් කර ඇත.

1.2.3 අඛණ්ඩභාවය

ආයතනයට පූර්වේක්ෂ අනාගතයෙහි දී ස්වකීය මෙහෙයුම් අඛණ්ඩව සිදු කරගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට ආයතනයෙහි පාලක මණ්ඩලය සෑහීමකට පත්වෙති. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයෙහි අඛණ්ඩභාවය පදනම් කරගෙන සකස් කර ඇත.

1.3 වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කරන සෑම වර්ෂයකටම එක සේ අදාළ වන පරිදි යොදා ගෙන ඇත.

(අ) විදේශ මුදල් ගනු ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයෙහි ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. විදේශීය මුදල් ඒකක වලින් සිදු කරනු ලබන ගනුදෙනු මූලිකව ම ගනුදෙනුව සිදු කරන දිනය වනවිට පවතින ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි අනුපාතයට වාර්තා කරනු ලැබේ. විදේශීය මුදල් ඒකක වලින් නාමනය කර ඇති මුදල්මය වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනය වන විට පවතින අදාළ විදේශීය මුදල් ඒකකවල ක්‍රියයාකාරී මුදල් ඒකකයෙහි තත්කාලීන අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ. සියලුම වෙනස්කම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ගනු ලැබේ.

(ආ) දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභය අඩු කළ පිරිවැයට සඳහන් කරනු ලැබේ.

ඉන් පසුව කරනු ලබන වියදම්

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ අලුත් වැඩියා වියදම් ද ඇතුළුව වෙනම ම ගණන් ගනු ලබන දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධනිත කරනු ලැබේ. පසුව සිදු කරනු ලබන අනෙකුත් වියදම් මගින් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයෙහි අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභය වැඩි දියුණු වූ විට පමණක් එම වියදම් ප්‍රාග්ධනිත කරනු ලැබේ. අනෙකුත් සියලුම වියදම් දරන ලද වියදමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

දේපළ, පිරියත සහ උපකරණ (තව දුරටත් .....)

වත්කමෙහි ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය පදනම් කර කර ගෙන වාර්ෂිකව පහත සඳහන් වන අනුපාත යොදා ගනිමින් සරල රේඛීය ක්‍රමයට අගය ක්ෂය කිරීම් ගණනය කරනු ලැබේ. වත්කමෙහි අගය ක්ෂය කළ හැකි ප්‍රමාණය එම වත්කමෙහි අවශේෂය වටිනාකම අඩු කිරීමේ පසුව තීරණය කරනු ලැබේ.

පරිගණක උපකරණ	33 %
වෙබ් පිටු සැලසුම්	33 %
මෝටර් සයිකල්	10%
ලීබඩු	10%
කාර්යාල උපකරණ	10%
මෝටර් වාහන	10%
පුස්තකාල පොත්	25%
ගොඩනැගිලි	2%

වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භයේදී ම සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ජීවිත කාලය පෙර වර්ෂයෙහි ඇස්තමේන්තු කරන ලද කාලයට වඩා වෙනස් වී ඇත්නම්, එම වෙනස්කම් පිළිබිඹු වන පරිදි සංශෝධන සිදු කරනු ලැබේ

වත්කමක් භාවිතය සඳහා සූදානම්ව තිබෙන අවස්ථාවේ සිට එම වත්කමෙහි අගය ක්ෂය කිරීම ආරම්භ කරනු ලබන අතර, එම වත්කම විකිණීම සඳහා තිබෙන ලෙස වර්ග කරනු ලබන දිනය හෝ එම වත්කම ඉවත් කරනු ලබන දිනය යන දෙකෙන් පූර්වයෙන් යෙදෙන දිනට එම වත්කමෙහි අගය ක්ෂය කිරීම අවසන් කරනු ලැබේ.

හානිකරණය
සිද්ධීන් හෝ වාතාවරණයන්හි වෙනස්වීම් මගින් වත්කමක ධාරණ අගය නැවත අය කර ගත නොහැකි බවට පෙනී යන ඕනෑම අවස්ථාවක හානිකරණය සඳහා එම දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි මුදලට වඩා වැඩි නම්, එම වත්කමෙහි ධාරණ වටිනාකම එකෙනෙහිම එහි නැවත අයකර ගත හැකි අගයට ලියා තබනු ලැබේ.

(ඇ) කල්බදු
වත්කම් කල්බදු දීමක් යටතේ බදු දීමනාකරු විසින් හිමිකාරිත්වයෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සඵල ලෙස රඳවා ගනු ලබන කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කරනු ලැබේ. මෙහෙයුම් කල්බදු යටතේ වන ගෙවීම් කල්බදු කාලපරිච්ඡේදය පුරා සරල රේඛීය ක්‍රමයක් මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

කල්බදු කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර මෙහෙයුම් කල්බදු ගිවිසුමක් අවසන් කරන විට, දණ්ඩනයක් ආකාරයෙන් බදු දීමනාකරු වෙත කිසියම් ගෙවීමක් සිදු කිරීමට තිබේ නම්, එම ගෙවීම එකී බදු ගිවිසුම අවසන් වීම සිදු කරන ලද කාල පරිච්ඡේදය තුළ දරන ලද වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ

(ඈ) ආයෝජන
මෙම ආයෝජන ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් / ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්, භාණ්ඩාගාර බැඳුම්කර සහ සාංගමික ණයකරුවලින් සමන්විත වේ.

i. ස්ථාවර තැන්පතු
ස්ථාවර තැන්පතුවල තිබෙන ආයෝජන ඒවායෙහි පිරිවැයට ගණන් ගනු ලැබේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට උපචිත වන පොළිය ලැබිය යුතු පොළී ලෙස දක්වනු ලැබේ

ii. භාණ්ඩාගාර බිල්පත් / ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්
භාණ්ඩාගාර බිල්පත්වල සහ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්වල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට පොළිය එකතු කළ පිරිවැයට දක්වනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

ආයෝජන (තවදුරටත් ...)

iii. භාණ්ඩාගාර බැඳුම්කර

භාණ්ඩාගාර බැඳුම්කරවල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට ඇති පිරිවැයට සඳහන් කරනු ලැබේ.

ආයතනයට මෙම ආයෝජන කල්පිරීම දක්වා තබා ගැනීමේ සාධනීය අභිප්‍රායය සහ හැකියාව තිබෙන නිසා මෙම අයෝජන කල්පිරීමට තබා ගෙන ඇති ආයෝජනයන් (ජංගම නොවන) ලෙස වර්ග කරනු ලැබේ.

iv. සාංගමික ණයකර

සාංගමික ණයකරවල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට ඇති පිරිවැයට සඳහන් කරනු ලැබේ. ආයතනයට මෙම ආයෝජන එක් වර්ෂයකට වඩා වැඩි කාලයක් දක්වා කල් තබා ගැනීමේ සාධනීය අභිප්‍රායය සහ හැකියාව තිබෙන නිසා මෙම අයෝජන කල්පිරීමට තබා ගෙන ඇති ආයෝජන (ජංගම නොවන) ලෙස වර්ග කරනු ලැබේ

(ඉ) තොග

ප්‍රකාශන තොග වලින් තොග සමන්විත වේ. ප්‍රකාශන ඒවායෙහි පිරිවැයට සඳහන් කරනු ලැබේ. වසර දහයකට (10) වැඩි කාලයක් තබා ගෙන තිබෙන ප්‍රයකාශන තිබේ නම් ඒවා සෙමින් චලනය වන තොග ලෙස සලකා කපා හැර ඇත.

(ඊ) අය විය යුතු දෑ

ලැබිය යුතු දෑ ඒවායෙහි අපේක්ෂිත උපලබ්ධි අගයට ධාරණය කරනු ලැබේ. ණයගැතියන් අඛණ්ඩව සිදු කෙරන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. අයකර ගත නොහැකි යැයි හඳුනාගෙන තිබෙන ණය එසේ හඳුනාගත් වර්ෂය තුළදී කපා හරිනු ලැබේ

අඩමාන ණය සඳහා වෙන් කළ යුතු ප්‍රතිපාදන හඳුනා ගැනීම පිණිස එක් එක් හානිකරණය තක්සේරු කිරීමේ ක්‍රමය යොදා ගනු ලැබේ. මාස 03 සිට මාස 06 දක්වා පැරණි ශේෂ සඳහා 10% ක් ද, මාස 06 සිට මාස 12 දක්වා පැරණි ශේෂ සඳහා 50% ක් ද, මාස 12 වැඩි ශේෂ සහිත ණය ගැතියන් සඳහා 100% ක් ද වශයෙන් එක් එක් හානිකරණයවූ ණයගැතියන් සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

(උ) මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි කාර්යයන් සඳහා, මුදල් සහ මුදල් හා සමාන දෑ බැංකුවේ තිබෙන මුදල්, අත ඇති මුදල්, කෙටි කාලීන තැන්පතු, සාංගමික ණයකර සහ භාණ්ඩාගාර බිල්පත් සහ බැංකු සමග එළඹ ඇති මාස තුනකට අඩු කල්පිරීමේ කාලයක් සහිත ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්, සහ බැංකු අයිරා ශුද්ධ අගයෙන් සමන්විත වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහිදී බැංකු අයිරා මාස තුනක හෝ එයට අඩු කල්පිරීමේ කාලයක් සහිත ජංගම වගකීම් යටතේ ඇතුළත් කර ඇත.

(ඌ) බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස වර්ග කර ඇති වගකීම් ඉල්ලීම මත ගෙවීමට ඇති හෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට ඇති වගකීම් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනයේ සිට වර්ෂයක කාලයකට පසුව ගෙවීමට නියමිතව තිබෙන වගකීම් ජංගම නොවන වගකීම්වලට අයත් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගණන් ගෙන තිබේ.

අතීත සිද්ධිවල ප්‍රතිඵලයක් ලෙස ආයතනයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විට සහ එම වගකීම ඉටු කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් සිදු වීම අවශ්‍ය වීමේ සම්භාවිතාවක් ඇති විට වගකීම් සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

බොහෝ දුරට මෙම ආයෝජනවල කෙටි කාලීන කල් පිරීමේ කාලය හේතුවෙන් මුදල් සහ කෙටිකාලීන ආයෝජන, වෙළඳ ලැබිය යුතු දෑ, වෙළඳ ගෙවිය යුතු දෑ සහ අනෙකුත් ජංගම මූල්‍ය වත්කම් ඒවායෙහි ධාරණ අගයට ආසන්න වන බවට කළමනාකරණය විසින් තක්සේරු කර තිබේ.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

(ඒ) සේවක ප්‍රතිලාභ

i. නිර්වචිත දායක සැලසුම්
ආයතනයෙහි සියලු ම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලෙහි සාමාජිකයින් වන අතර, එම අරමුදල් දෙක සඳහා මෙම ආයතනය සේවකයින්ගේ මූලික වේතනයෙන් හෝ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 3% බැගින් දායක මුදල් ගෙවයි.

ii. නිර්වචිත ප්‍රනතිලාභ සැලැස්ම
ආයතනය විසින් ප්‍රක්ෂිප්ත ඒකක ප්‍රතිලාභ ක්‍රමය භාවිතා කරමින් ආයුගණකයෙකුගේ උපදෙස් මත නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් වන පාරිතෝෂිකයේ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන වටිනාකම මනිනු ලැබේ. ආයුගණක ලාභ සහ අලාභ මෙම සැලසුමට සහභාගීවන සේවකයින්ගේ ඉතිරි සාමාන්‍ය වැඩකරන අපේක්ෂිත ජීවිත කාලය පුරා ආදායම් හෝ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

(ඒ) ආදායම් හඳුනාගැනීම

i. ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන දායකත්වය
ශ්‍රී. ලංකා රජයෙන් ලැබෙන දායකත්වය උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ.

ii. ව්‍යාපෘති ආදායම
ව්‍යාපෘති ආදායම ඉටුකිරීමට භාර ගෙන ඇති ව්‍යාපෘතිවල නිම කර ඇති අදියර පදනමෙන් හඳුනා ගනු ලැබේ. වැඩ නිම කර එහෙත් සේවාදායකයින් වෙත බිල්පත ලබා දී නොමැති ව්‍යාපෘති සකස් කෙරෙමින් පවතින බිල්පත් ගිණුමෙහි වාර්තා කරනු ලැබේ. ව්‍යාපෘතිවලින් ලැබෙන අත්තිකාරම් විලම්බිත ආදායම් ලෙස වර්ග කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස ඉදිරිපත් කර ඇත.

iii. සම්මන්ත්‍රණ / වැඩමුළු වලින් ලැබෙන ආදායම
සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වා අවසන්වූ විට එම සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලින් ලැබෙන ආදායම උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ.

iv. පොළී ආදායම
පොළී ආදායම උපචිත පදනමකින් ගණන් ගනු ලැබේ.

(ඔ)

i. ප්‍රාග්ධන වියදම් හඳුනා ගැනීම
ව්‍යාපාර කටයුතු කිරීම සඳහා යොදා ගනු ලබන හෝ ව්‍යාපාරයෙහි ආදායම් ඉපැයීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

ii. පුනරාවර්තන වියදම් වර්ගීකරණය කිරීම
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදම් ක්‍රමයේ ස්වභාවය මගින් ආයතනයෙහි කාර්යසාධනයෙහි මූලිකාංග සාධාරණ ලෙස ඉදිරිපත් කෙරෙන බව පාලක මණ්ඩලයෙහි මතය වන බැවින් එම ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගත කරගෙන ඇත.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දිනට

2 ශ්‍රී ලංකා රජයයෙන් ලැබුණු ප්‍රදාන

ආයතනයෙහි උපයෝගීතා, නඩත්තු සහ ආදයම් බදු වියදම් සඳහා ශ්‍රී ලංකා රජයයෙන් ලැබුණු ප්‍රදාන වලින් සමන්විත වෙයි. ප්‍රවර්තන වර්ෂය තුළදී රු. 11,115,287/- ක ආදායම් බදු වියදම් ප්‍රතිපූර්ණය කර ඇත.

		2020	2019
3	**ව්‍යාපෘති ආදායම**	රු.	රු.
	ආයතන වලින් ලැබුණු ආදායම	**72,188,166**	42,275,808

		2020	2019
4	**අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයෙන් ලැබුණු ආදායම, TTI ප්‍රදාන**	රු.	රු.
	වර්ෂය සඳහා ලැබුණු TTI ප්‍රදාන	**-**	5,601,648

2019 වර්ෂයේදී හඳුනාගන්නා ලද ආදායම අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයෙහි TTI ප්‍රදාන 2 වැනි අදියර යටතේ හඳුනාගත් ආදායමෙහි කොටසට අදාළ වේ. 2014 ඔක්තෝබර් 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වසර 4½ ක කාලයක් සඳහා වන කැනඩා ඩොලර් 950,000 ක් වූ එම ප්‍රදානයෙහි 2 වැනි අදියර ලබා ගැනීම සඳහා ආයතනය සුදුසුකම් ලැබුවේය. පර්යේෂණවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට, ආයතනික කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට සහ ප්‍රතිපත්ති සබැඳි සහ සංනිවේදන සහ ජන විඥාදුම් වැඩි දියුණු කිරීමට මෙම ප්‍රදානයන් යටතේ ලැබෙන අරමුදල් යොදා ගනු ලැබේ. ප්‍රදාන ලබා දෙන කාලපරිච්ඡේදය 2019 මාර්තු මස 31 වැනි දිනෙන් අවසන් විය.

5 සම්මන්ත්‍රණ සහ වැඩමුළුවලින් ලැබුණු ආදායම

මෙය පරිත්‍යාග ලබා දෙන්නන්ගේ ඉල්ලීම් මත, ආයතනය විසින් සිදු කරන ලද පර්යේෂණ වැඩ පිළිබඳ ප්‍රචාරණය කිරීමේ ක්‍රමයක් ලෙස පවත්වන ලද සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලින් ලැබුණු ආදායමෙන් සමන්විත වේ. 2019 වර්ෂයේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසන් 12 වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුව සඳහා සත්කාරකත්වය සපයන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රු. 12,380,997.06/- ක ආදායම් වර්ධනයක් සිදු විය.

		2020	2019
6	**විවිධ ආදායම්**	රු.	රු.
	ප්‍රකාශන අලෙවි කිරීම	378,779	630,955
	තැපැල් ගාස්තු	1,880	8,075
	වෙනත් ආදායම්	241,328	215,696
		621,987	854,726

		2020	2019
7	**සේවක පිරිවැය**	රු.	රු.
	ප්‍ර.අ.ආ. කාර්ය මණ්ඩල වැටුප්	52,591,028	50,780,638
	සේ.අ.අ.	5,996,362	5,758,642
	සේ.නි.භා.අ.	1,499,090	1,439,660
	ප්‍රසාද දීමනාව (සටහන 7.1)	1,870,319	1,122,065
	සෞඛ්‍ය ප්‍රතිලාභ සහ ගාස්තු	1,755,571	1,914,685
	වෙනත් ප්‍රතිලාභ	85,000	96,350
	පාරිතෝෂික සඳහා වෙන් කිරීම් (සටහන 19)	6,525,530	3,563,963
		70,322,900	64,676,003

		2020	2019
7.1	**ප්‍රසාද දීමනාව**	රු.	රු.
	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගීවීම වෙනුවෙන් ගෙවන ලද දීමනා ඇතුළත් වේ	**96,000**	66,000

		2020	2019
8	**පර්යේෂණ පිරිවැය**	රු.	රු.
	මුද්‍රණ සහ පරිගණක යතුරුලියන ප්‍රකාශන ගාස්තු	541,561	564,356
	අන්තර්ජාල ගාස්තු	3,090,283	3,413,782
	උපදේශක ගාස්තු	14,149,156	8,519,060
	ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණය	5,305,876	4,781,918
	ව්‍යාතපෘති සම්බන්ධ ප්‍රචාරණ වියදම්	-	1,027,271
	වෙනත් පර්යේෂණ පිරිවැය	3,257,077	1,020,289
		26,343,953	19,326,676

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දිනට

		2020	2019
9	**වෙනත් මෙහෙයුම් වියදම්**	රු.	රු.
	ලියාපදිංචි සහ සාමාජික ගාස්තු	403,270	420,806
	කාර්යාල පිරිවැය	551,512	897,877
	සාමාන්‍ය කාර්යාල පිරිවැය	2,347,951	4,666,326
	පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	-	349,985
	වෘත්තීයවේදී සහ නීති ගාස්තු	5,268,520	3,153,434
	ජාල නඩත්තු කිරීම (සටහන 9.2)	3,833,697	3,594,748
	විගණන සහ බදු ගාස්තු	262,956	288,420
	වෙළඳ දැන්වීම්	71,568	14,400
	බැංකු ගාස්තු / කොමිස්	85,399	112,407
	වෙනත් පරිපාලන සම්බන්ධ වියදම්	95,722	373,183
	රඳවා ගැනීමේ බදු වියදම්	-	5,193,847
	රැස්වීම් වියදම් - සේ.නි.ඇ.ඇ.	354,330	265,735
		13,274,925	19,331,168

9.1 ජාල නඩත්තු වියදම්වලට 2021 ඔක්තෝබර් මාසය දක්වා වසර තුනක කාලයකට අත්සන් කරන ලද සේවා පද්ධති නඩත්තු ගිවිසුමෙහි ක්‍රමක්ෂය කළ පිරිවැය ඇතුළත් වේ.

10 ආදායම් බදු වියදම

ප්‍රවර්තන බදු වියදම

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතෙහි විධිවිධානයන්ට අනුව, ආයෝජන වලින් ලැබෙන ආදායම 14% ක ආදායම් බද්දකට යටත් වේ. ඒ අනුව 2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂයෙහි ආදායම් බදු සඳහා පහත සඳහන් පරිදි ප්‍රතිපාදන වෙන් කර ඇත:

	2020
	රු.
ශ්‍රවණාගාරය කුලියට දීමෙන් ලැබුණු ආදායම	90,000
ශ්‍රවණාගාරය කුලියට දීමෙන් ලැබුණු ආදායම හා සම්බන්ධ වියදම්	(91,544)
ආයෝජනයෙන් සිදුවූ පාඩුව	(1,544)
ආයෝජන භාර අරමුදලෙන් ලැබුණු දායකත්වය (පොළී ආදායම)	41,641,019
වෙනත් පොළී ආදායම්	37,753,890
	79,394,909
පොළී ආදායම මත බදු (14% ක අනුපාතය යටතේ රු. 79,394,909/-)	**11,115,287**

		2020	2019
11	**මුදල් සහ මුදල් හා සමාන ද්‍ය**	රු.	රු.
	බැංකුවේ ඇති මුදල්	1,521,446	2,551,619
	කෙටි කාලීන තැන්පතු ගිණුමෙහි ඇති මුදල්	1,050,000	700,000
	සුළු මුදල්	90,000	90,000
	මාස 03 ට අඩු කාලයක් තබා ගෙන ඇති ආයෝජන		
	ස්ථාවර තැන්පතු සහ ප්‍රතිම්ලදී ගැනීම් ගිවිසුම	21,014,130	188,317,388
	සාංගමික ණයකර	10,859,932	-
	භාණ්ඩාගාර බිල්පත්	1,520,077	-
		36,055,585	191,659,007

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දිනට

		2020	2019
12	**ආයෝජන - කෙටි කාලීන**	රු.	රු.
	භාණ්ඩාගාර බිල්පත්	161,963,824	-
	ස්ථාවර තැන්පත් - කාර්ය මණ්ඩල සුභසාධක අරමුදල	2,374,637	2,294,123
	ස්ථාවර තැන්පත් - පාරිතෝෂික අරමුදල	22,961,873	18,296,643
	ස්ථාවර තැන්පත්	223,481,107	83,446,179
	සාංගමික ණයකර	10,000,000	-
		420,781,441	104,036,945

ආයෝජන - දීර්ඝ කාලීන
දීර්ඝ කාලීන ආයෝජන කල්පිරීම දක්වා තබා ගෙන ඇති ආයෝජන ලෙස වර්ග කරනු ලබන පහත සඳහන් ආයෝජන වලින් සමන්විත වේ:

	2020	2019
	රු.	රු.
භාණ්ඩාගාර බැඳුම්කර	52,132,786	99,945,962
සාංගමික ණයකරන	16,000,000	71,529,826
	68,132,786	171,475,788

		2020	2019
13	**වෙළඳ ලැබිය යුතු දෑ**	රු.	රු.
	වෙළඳ ලැබිය යුතු ව්‍යාපෘති	7,334,839	3,307,711
	බොල් ණය සඳහා වෙන් කිරීම්	(655,935)	(488,368)
	බිල්පත් සකස් කරමින් පවතින	12,478,164	1,788,001
		19,157,068	4,607,344

		2020	2019
14	**තැන්පතු සහ පූර්ව ගෙවීම් - කෙටි කාලීන**	රු.	රු.
	පූර්ව ගෙවීම් (සටහන 141)	5,137,073	7,979,007
	තැන්පතු	330,050	276,550
	වෙනත් අත්තිකාරම් (සටහන 14.3)	216,000	1,759,470
		5,683,123	10,015,027

	තැන්පතු සහ පූර්ව ගෙවීම් - දීර්ඝ කාලීන	2020	2019
		රු.	රු.
	පූර්ව ගෙවීම්	**-**	2,433,456

		2020	2019
14.1	**පූර්ව ගෙවීම්**	රු.	රු.
	වෛද්‍යය රක්ෂණය	661,951	693,207
	වෙනත් රක්ෂණ	285,616	363,551
	වෙනත් පූර්ව ගෙවීම්	1,756,050	1,315,722
	නඩත්තු කිරීම් (ජාල/සේවාදායක පද්ධති/මෘදුකාංග) - **කෙටිකාලීන**	2,433,456	5,606,527
		5,137,073	7,979,007

		2020	2019
14.2	**වෙනත් අත්තිකාරම්**	රු.	රු.
	සමීක්ෂණ සම්බන්ධ වියදම් සඳහා අත්තිකාරම් ගෙවීම්	-	1,172,438
	වෙනත් සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම්	216,000	587,032
		216,000	1,759,470

		2020	2019
15	**වෙනත් ලැබිය යුතු**	රු.	රු.
	කාර්ය මණ්ඩල ණය ගැතියෝ	3,143,010	3,560,793
	අය විය යුතු වෙනත් මුදල් ව්‍යාපෘති	14,790	-
	අය විය යුතු වෙනත් මුදල් (සටහන (15.1)	12,773,137	17,955,067
		15,930,937	21,515,860

		2020	2019
15.1	**අය විය යුතු වෙනත් මුදල්**	රු.	රු.
	ආයෝජන භාර අරමුදලෙන් ලැබිය යුතු මුදල්	**12,773,137**	17,955,067

16 දේපළ, පිරියත සහ උපකරණ

	ඉඩම්	ගොඩනැගිලි	පරිගණක උපකරණ	මෝටර් වාහන	ලීබඩු සහ සවිකිරීම්	කාර්යාල උපකරණ	පුස්තකාල පොත්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය								
2020 ජනවාරි 01 දිනට ශේෂය	156,000,000	324,858,738	97,823,713	23,525,945	19,956,911	23,795,358	1,730,313	647,690,976
එකතු කිරීම්	-	-	874,210	7,677,000	8,500	1,608,929	216	10,168,855
අඩුකළා - බැහැර කිරීම් (සටහන 01)	-	-	-	(1,587,750)	-	-	-	(1,587,750)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**156,000,000**	**324,858,736**	**98,697,923**	**29,615,195**	**19,965,411**	**25,404,287**	**1,730,529**	**656,272,081**
සමුච්චිත ක්ෂය								
2020 ජනවාරි 01 දිනට ශේෂය	-	57,831,320	84,804,184	9,054,626	19,321,649	21,884,460	1,722,277	194,618,516
අගය ක්ෂය කිරීම් ගාස්තු	-	6,432,572	7,984,286	2,582,284	85,428	342,119	3,904	17,430,593
අඩුකළා - බැහැර කිරීම්	-	-	-	(1,587,750)	-	-	-	(1,587,750)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**64,263,892**	**92,788,470**	**10,049,160**	**19,407,077**	**22,226,579**	**1,726,180**	**210,461,358**
2020 **දෙසැම්බර් 31 වැනි දිනට**	**156,000,000**	**260,594,844**	**5,909,453**	**19,566,035**	**558,334**	**3,177,708**	**4,349**	**445,810,723**

16 දේපළ, පිරියත සහ උපකරණ (තවදුටරත් ...)

	ඉඩම්	ගොඩනැගිලි	පරිගණක උපකරණ	මෝටර් වාහන	ලීබඩු සහ සවිකිරීම්	කාර්යාල උපකරණ	පුස්තකාල පොත්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය								
2019 ජනවාරි 01 දිනට ශේෂය	156,000,000	324,428,666	85,317,962	23,525,945	19,944,261	23,739,225	1,726,313	634,682,372
එකතු කිරීම්	-	430,070	12,505,751	-	12,650	540,644	4,000	13,493,118
අඩුකළා - බැහැර කිරීම් (සටහන 01)	-	-	-	-	-	(484,510)	-	(484,510)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**156,000,000**	**324,858,736**	**97,823,713**	**23,525,945**	**19,956,911**	**23,795,358**	**1,730,313**	**647,690,976**
2019 ජනවාරි 01 දිනට ශේෂය	-	51,370,264	74,857,991	6,938,900	19,236,674	22,113,946	1,714,158	176,231,934
අගය ක්ෂය කිරීම් ගාස්තු	-	6,461,056	9,946,193	2,115,726	84,975	255,024	8,118	18,871,090
අඩුකළා - බැහැර කිරීම්	-	-	-	-	-	(484,510)	-	(484,510)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**57,831,320**	**84,804,184**	**9,054,626**	**19,321,649**	**21,884,460**	**1,722,277**	**194,618,516**
2019 දෙසැම්බර් 31 වැනි දිනට	**156,000,000**	**267,027,416**	**13,019,529**	**14,471,319**	**635,262**	**1,910,898**	**8,036**	**453,072,460**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දිනට

		2020	2019
17	**ලැබිය යුතු වෙළඳ**	රු.	රු.
	උපචිත (සටහන 17.1)	13,548,104	4,892,581
	සේ.භා.අ. සහ සේ.නි.භා.අ. ගෙවිය යුතු	973,698	921,749
	ගෙවිය යුතු උපයන විට බදු	28,982	95,271
	ගෙවිය යුතු මුද්දර බදු	3,500	3,550
	ගෙවිය යුතු ආදායම් බදු	2,615,322	795,869
		17,169,606	6,709,020

		2020	2019
17.1	**උපචිත**	රු.	රු.
	කාර්යාල පිරිවැය	1,511,497	1,047,166
	විගණන ගාස්තු	1,335,356	870,164
	විදුලිය ගාස්තු	542,714	595,604
	දුරකථන / අන්තර්ජාල ගාස්තු	299,278	354,980
	ඉන්ධන	11,531	44,772
	පිරි දීමනා	186,794	1,752,791
	පර්යේෂණ ව්‍යාපෘති වියදම්	9,660,934	227,104
		13,548,104	4,892,581

		2020	2019
18	**වත්කම් සඳහා ලැබුණු අත්තිකාරම්**	රු.	රු.
	ජනවාරි 01 දිනට ශේෂය	17,926,007	12,092,518
	වර්ෂය තුළ ලැබීම්	53,804,892	24,692,756
	භාණ්ඩාගත් ආදායම්	(45,744,663)	(18,859,266)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**25,986,235**	17,926,007

		2020	2019
19	**සේවක ප්‍රතිලාභ**	රු.	රු.
	ජනවාරි 01 දිනට ශේෂය	17,236,511	13,861,669
	වර්ෂය තුළ භාණ්ඩාගත් වියදම් (සටහන 19.1)	6,525,530	3,563,963
	වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම්	(2,045,898)	(189,119)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**21,716,143**	17,236,511

2020 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි සේවක සංඛ්‍යාව 38 ක් වේ (2019: 41).
2020 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි සේවක ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන සේවක සංඛ්‍යාව 38 ක් වේ (2019: 41).
මෙම වගකීම් වෘත්තීය ආයුගණක සමාගමක් විසින් තක්සේරු කර ඇත.
මෙම ප්‍රතිලාභ සපයා දීමේ දී ආයතනයට දැරීමට සිදුවන පිරිවැය තීරණය කිරීමේ දී පහත් සඳහන් උපකල්පන යොදා ගෙන ඇත.

වට්ටම් අනුපාතිකය	8.00% (2019: 10.25%)
වැටුප් අනුපාතිකයෙහි වර්ධනය	9.20% (2019: 9.20%)
කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය	23% (2019: 7%)

		2020	2019
19.1	**වර්ෂය තුළ භාණ්ඩාගත් වියදම්**	රු.	රු.
	ප්‍රවර්තන සේවා පිරිවැය	1,778,284	1,594,506
	පොළී පිරිවැය	1,766,743	1,663,400
	ආයුගණක (ලාභය)/පාඩුව	2,980,504	306,057
		6,525,530	3,563,963

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 වැනි දිනට

20 කල් බදු වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය වන විට කල් බදු වගකීම් නැත. (2019: නැත)

21 ප්‍රාග්ධන වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය වන විට ප්‍රාග්ධන වගකීම් නැත. (2019: නැත)

22 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

ආයතනයෙහි ආයෝජන භාර අරමුදලෙහි (භාර අරමුදල) 2020 දෙසැම්බර් 31 දිනට රු. 501,818,637/- ක ශුද්ධ වත්කම් වටිනාකමක් තිබුණි. (2019 රු. 501,825,760/-). වෙනම ම විගණනය කරනු ලබන ආයෝජන භාර අරමුදල සඳහා වෙනම ම ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. මෙම භාර අරමුදල භාරකරුවන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර එයින් දෙදෙනෙකු නිල බලයෙන් පත් වන සාමාජිකයින් වේ (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි සභාපතිවරයා සහ විධායක අධ්‍යක්ෂ).
පුනරාවර්තන වියදම් සඳහා ශ්‍රී ලංකා රජය විසින් රු. 30,214,000/- ක මුදලක් (2019 වර්ධයේ රු. 16,500,000/-) ක් ආයතනයට ප්‍රදානය කරන ලදී.
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්, මහ බැංකුවේ අධිපති සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලයට නිල බලයෙන් පත් වන සාමාජිකයින් වේ.

23 අවිනිශ්චිත වගකීම්

මූල්‍ය ප්‍රකාශන දිනය වන විට අවිනිශ්චිත වගකීම් නොතිබුණි.

24 මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසුව සිදුවුණු සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසුව මූල්‍ය ප්‍රකාශනවල හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් වල ගැළපීම් සිදුකිරීම අවශ්‍ය කරන සිදුවීම් සිදුවී නැත.

25 පාලක මණ්ඩලයේ වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : එල්ඊඩබ්/සි/අයිපීඑස්/01/2020/01
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2021 මැයි 03 දින

සභාපති

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත - ලේකම්, මුදල් අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. එල්ඊඩබ්/සී/අයිපීඑස්/01/2020/01 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2021 මැයි 03 දින

සභාපති

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාලව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන්අවශ්‍යතාවය අනුව ආයතනයේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුවම අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2019 ජූලි 25 දිනැති අංක SC & PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ ලිපියේ 03 ඡේදය	අනුව සියලුම විදේශ ප්‍රදාන විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා එම දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය මත ලබාගත යුතු වුවද, ව්‍යාපෘති සඳහා වර්ෂය තුළදී ලැබී තිබුණු රු.48,582,735 ක් වූ ප්‍රදාන සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ආ) 2003 ජූනි මස 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය (i) 9.2 (බී) වගන්තිය	සෑම ආයතනයක්ම අනුමත කාර්යය මණ්ඩලයක් පවත්වා ගත යුතු වුව ද, ආයතනයේ කාර්යය මණ්ඩලය අනුමතව නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ii) 9.3.1 (i) වගන්තිය	ආයතනය සඳහා බදවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටියක් සකස් කර ඒ සඳහා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සහ අදාල අමාත්‍යාංශයේ අනුමැතිය හා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගත යුතු වුවත් ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

විගණන වාර්තාවට ප්‍රතිචාර

LEW/C/IPS/01/2020/01

මූල්‍ය ප්‍රකාශන විගණනය 2020

2. අනෙකුත් නීති, නියමයන් සහ රෙගුලාසිවලට අනුකූලතාව

2.2.2

අ) ව්‍යාපෘති අරමුදල් රැස්කිරීම

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වෙත ලබාදෙන ලද දීමනාව පිළිබඳව බාහිර සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කරමින් අංක SC / PMU /GRANT / 19 සහ 2016 ජූලි 25 දිනැති චක්‍රලේඛය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් පිළිපදිනු ලැබ ඇත. අධ්‍යක්ෂ ජනරාල් - බාහිර සම්පත් වෙත යවන ලද ලිපියේ පිටපත පරීක්ෂාකාරී කියවීම සඳහා විගණකවරුන් සමග හුවමාරු කර ගන්නා ලදී.

ආ) (ස) සේවක සංඛ්‍යාව කළමනාකරණය කිරීම

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය හේතු දෙකක් සඳහා ලියාපදිංචි සේවක සංඛ්‍යාවක් පවත්වා නොගනී. පළමුවැන්න, පර්යේෂණ ව්‍යාපෘති ආදායම් රැස්කිරීම මත එහි අරමුදල්කරණය විශාල වශයෙන් රඳා පැවතීමේ ස්වභාවයයි. ප්‍රතිපත්තිමය පරිසරය සහ දායකයින්ගේ කැමැත්ත ඇතුළු හේතු ගණනාවක් නිසා ව්‍යාපෘති ආදායම වෙනස් වේ. රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා වෙනස්වන බැවින් පර්යේෂණයේ වෙනස්වන ක්ෂේත්‍රය දෙවැන්න වේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සේවක සංඛ්‍යාව ඵලදායි සහ පිරිවැය පළදායී වීම සඳහා ගලපා ගැනීමට නම්‍යතාව රඳවා ගැනීම මෙම සාධක දෙක තුළින් අවශ්‍ය කෙරේ. වසර ගණනාවක් මෙම කරුණු පුළුල් වශයෙන් සාකච්ඡා කර ඇති අතර, 2015දී, රේඛීය අමාත්‍යාංශයේ විගණන කමිටුවේදී විස්තරාත්මකව සාකච්ඡා කරන ලදී. පසුව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට අනුමත සේවක සංඛ්‍යාවක් තබා ගැනීම අවශ්‍ය නොවන බවට එකඟ විය.

(ii) බඳවා ගැනීම සහ උසස්වීම්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මෙහෙයුම් අත්පොත (MOO) සේවක සංඛ්‍යාව, බඳවාගැනීමේ පටිපාටිය, උසස්වීම් සහ පාරිශ්‍රමික ඇතුළුව ආයතනයේ මෙහෙයුම් කටයුතු මෙහෙයවීම සඳහා සංවර්ධනය කරනු ලැබ ඇත. පාලන මණ්ඩලය විසින් එධධ අනුමත කරන අතර, ආයතනයේ නියමයන් සහ රෙගුලාසි සකස් කිරීම සඳහා 1988 අංක 53 දරන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්ථාපිත කිරීමේ පනතේ 6 (අ) වගන්තිය යටතේ බලතල පවරා ඇත. එධධ තුළ දක්වා ඇති නියමයන් හා රෙගුලාසිවල පදනම මත ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට කටයුතු කිරීම සඳහා, රාජ්‍ය ව්‍යවසාය කමිටුව (COPE) විසින් මුදල් අමාත්‍යාංශය (MOF) විසින් එධධ විධීමත් පරිදි අනුමත කළයුතු බවට ඉල්ලා ඇත. ඒ අනුව මුදල් අමාත්‍යාංශය වෙත එධධ ඉදිරිපත් කරන ලද අතර, 2014 දී අනුමැතිය ලබාදෙන ලදී. මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිචාර ලිපිය පරීක්ෂාකාරී කියවීම සඳහා විගණකවරුන් සමග හුවමාරු කර ගන්නා ලදී.



ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
100/20, නිදහස් මාවත,
කොළඹ 7,
ශ්‍රී ලංකාව

Tel: +94 11 2143100 Fax: +94 11 2665065
Email: ips@ips.lk, Website: www.ips.lk
Blog: 'Talking Economics' - http://www.ips.lk/talkingeconomics
Twitter: www.twitter.com/TalkEconomicsSL